

# පාරායන වග්ගං

# PARUPANAWATA.

# පරුපනාවත

හෙවත්

හිඤුත්තේ

## සිව්රුපොරවන ක්‍රමය.

ලක්මිණිපහන්පත්‍රයේ කතාවාක්‍යඋපුටා
සංග්‍රහකරණලදී.

කොළඹ පිටකොටුවෙ
**විජයෙද්‍රන්නම ශාසනාලොක සමාගම විසින්**
ලක්මිණිපහණ යන්ත්‍රාලයෙහි
මුද්‍රණයකරවනලදී.

ශ්‍රී බුඩ වර්ෂ 2412.

ක්‍රිස්තු වර්ෂ 1900.

COLOMBO

# සංඥාපනය.

ශ්‍රීමත් ශ්‍රීඝන සුගතතථාගතයන්වහන්සේගේ නිර්මල ශාසනය පිහිටි සියාම් බුරුම රාමඤ්ඤ රක්ඛඞ්ග කාම්බෝජාදි සියළුරටවල සහ ලංකාවේද එකාකාරපවත්වාගත එන්නාවූ භික්ෂූන්ගේ සිවුරුපෙරවීම හෙවත් ඇතුළුගමට දෙඋරවසා කරණ උභයාංශපාරුපණය වරදය සියාම්සමාගමේ ඉතාමෑතපටන් සමහරුඅතරේ වෙදකම් කුඹුරුමැඩවීම්ආදියට පහසුපිණිසපුරුදුකරගත් එකාංශපෙරවීම බුද්ධ පසේබුද්ධ මහරහතුන්අතරපැවැති නියමපෙරවීමයයි වාදයක්උපදවා ලංකාවේනොයෙක්තැන වාදවිවාදකර තීරණයකට නොපැමිණියේය. මේවාදයසඳහා මාතරපලාතේවැඩවිසූ අතුරලියේ සුමංගල ධර්මකීර්ති නායකස්ථවිරයන් විසින් විනිශ්චයක්ද හික්කඩුවේ ශ්‍රීසුමංගල මහානායකස්ථවිරයන් විසින් විනිශ්චයක්ද අමරපුරනිකායේ ධම්මාලංකාර නායකස්ථවිරයන් විසින් විනිශ්චයක්ද උභයාංශපක්ෂය ස්ථිරකොට ලියනලද්දේය. එසේම එකාංශපක්ෂය ස්ථිරකොට රත්මලානේ ධර්මාලොක ස්ථවිරයන් විසින් විනිශ්චයක්ද ලියනලදී. එසේද වුවත් වාදසමථය නුවූබැවින් ලක්මිණිපහන්පත්‍රයෙන් එම පත්‍රයෙ හිතතීභූත "බුද්ධසාසනමහාසූරසේනාපති ඈම්. ධර්මරත්න"පණ්ඩිතුමා විසින් මේවාදය සම්බන්ධව ලියනලද කර්තෘවාක්‍යවලින් සාරාර්ථයන් සංග්‍රහකොට "පාරුපනවත" නම්වූ මේ ප්‍රකරණය කොළඹ පිටකොටුවේ "විපදෙතනමසාසනාලොක" සමාගමවිසින්මුද්‍රණයකරවනලදී. මේ පොතට ලංකාවේ පුරාණ දඹුළුවිහාරාදියේ සිතුයම්කර තුබූ එකාංශ උභයාංශවැසූ බුද්ධප්‍රතිමාසිතුයම් හා දඹදිව ධර්මාශොක රජතුමාවිසින් ගල්වල කැටයම්කරවාතුබූ බුද්ධප්‍රතිමාසිතුයම්ද ඉතා උත්සාහයෙන් සපයා මුද්‍රණයකරවනලදී. මේ පොතක්යවත්නාවූ උගත් නූගත් සියළුදෙනාටම භික්ෂූන් විසින් සිවුරුපෙරවියයුතු නියමක්‍රමය නිරායාශයෙන් දැනගතහැකිවේ. ශ්‍රමණවේශය යම්දවසක අන්තර්ධානවීනම් ලිඞ්ගඅන්තර්ධානයවන බව ආගමේනියම බැවින් භික්ෂූන්ගේ සිවුරුපෙරවීම එසේ මෙසේ ලාමකකරුණකැයි අවඥා නොකොට මේ පොත සමාදරයෙන් කියවාබලා පන්දහසක්ගවුරුදු ශ්‍රමණලිඞ්ගය නොනසා පවත්වාගන්නට සකලබෞද්ධයන් විසින් උත්සාහකටයුතු. මෙහි යොදාතිබෙන සිතුයම් හත ඉතා පුරාතන කර්මාන්ත බැවින් ශාසනික සියළු ගිහිපැවිද්දන්ටම මහත් ප්‍රයොජනවේයයි හඟිමු. මේවගට, විපදෙතනම සාසනාලොක සමාගමේ ලේකම්තැන.

නමච් මුනි සරණ

# පා රු ප න ව න

හො හො ත්

**ඒකාංශ පෙරවීම.**

---

සියම් නිකායේ ප්‍රතිපත්ති පිරිහෙන්නට පටන්ගත්තාට පසු උපාලි මහාස්ථවිරාදීන් විසින් පළමුකොට පුරුදුකරණලැබූ ගම්වැදීමේදී උභයාංශ පෙරවීම හාත්පසින්ම අතුරුදන්ව පත් සලේ උන් උන් සැටියේම එම වේශයෙන් ගම්වැදීමත් පුරුදුවී බොහෝ කල්ගියාට පසු ඒ පෙරවීම ආගමානුකූලයයි ආගම නුගත්තන් විසින් පිළිගෙණ පවත්වාගෙණ එනලදී. එසේද වූවත් උඩරට වනවාසිව විසූ සියම් නිකායේ දෙරටියාවේ නායකස්ථවිරයන්ගේ පරම් පරවේද බෙන්තර අත්ථදස්සි වලානේ සිද්ධාර්ථ දෙඩම් පහල දීපංකර මුල්ගිරිගලකදුරුපොකුනේ අතුරලියේ ශ්‍රී ධර්මකීර්ති ආදී ධර්මවිනයධර ශික්ෂාකාමී ශාසන සාරවාහකවූමහානායකස්ථවිරයන්වහන්සේලාජීවත්ව වසනතාක් පිඩපාත ගමනට සහ ප්‍රසිද්ධ ගම්වැදීම්වලටත් දෙවුර වසාමනාකොට සුපිළිසන්ව සිවුරු ගැටවිටුගන්වාගම්වැදුනුබව දුටු දත්නා අය දහස්ගණන්තවමත් සිටිති. මේ වාදය පටන්ගත් රත්මලානේ ධම්මාලොකපොතුවිල ඉන්දජෝතිතොරුන්නාන්සේලා දෙනම පවා වාදයටමත්තෙන් අලුතෙන් මහණකරණ සාමණේර පැටවුන්ට දෙවුර වසා පිඩු පිණිසයාමට උගැන්වූ බව මගේ ඇස්දෙකින් දුටු බව මතකයි. මෙසේ මේ ශ්‍රමණලිංගය සියම්නිකායෙන් අනතුර්ධානවෙන්ට යන බව දුටු ධර්මවිනයධර භික්ෂුවේ මහානායක ස්ථවිරයන්වහන්සේ ඇතුළුවූ උගත් පිරිසක් ඉදිරියට පැමිණ මේ පුරුදුවෙගෙණ යනආචීර්ණ කල්පය අත්හරවනා අදහසින් දෙවුර වසා සුපිළිසන්ව පෙරවීම පටන්ගත්තාට පසු එම නිකායේම කොටසක් ඊට විරුද්ධව වාදයට බැස ලත්දිව නොයෙක් ගම් නියම්ගම්හි වාද භූමිවලට පැමිණ වාදකොට දෙපක්ෂයේම මත ස්ථිරකොට පොත් දෙකතුණ බැගින් අච්චුගස්වා පත්‍රමාර්ගවලිනුත් වාදකොට එක මතයක පිහිටන්නට අසමත්ව මේ පෙරවීම නිසාම සියම් නිකාය තුණ හතරකට බිඳී පවත්නේය. සමහරු කොලඹට දෙවුර වසත් පිටිසරට එකඋර වසත් සමහරු දෙවුර වැසීමට කැමති දූයක

ගෙවල්වලට දෙළුරවසා යති, එකළුර වැසීමට කැමති දායක ගෙවල්වලට එකළුර වසති, සමහරු එකළුර වසන කාණ්ඩේදී එකළුර වසති, දෙළුර වසන කාණ්ඩේදී දෙළුර වසති, සමහරු මාලිගාකන්දේ ඉගෙණගන්නාතුරු දෙළුර වසති, ගමට ගියාට පසු එකළුර වසති, සමහරු හැමතැනටම දෙළුර වසති, සමහරු හැමතැනටම එකළුර වසති. මෙසින් දැක්මට ඉතා පිළිකුල් පෙරවීමනම් එක පන්සලේ වසන දෙදෙනාගෙන් එක්කෙණෙක් දෙළුරේද එක්කෙණෙක් එකළුරේද වසාගෙණ කොළඹ වීථිවල හැසිරෙණු දැකීමයි. මේ ආදී නොයෙක් ක්‍රමවලින් සියාම් නිකායේ සිවුරු පෙරවීම මහත් ආකුලස්වභාවයකින් පවත්තේය. නුමුත් සමහරු මීට පූර්වයෙහි මේ එකාංශ පෙරවීම සියම් රටේ තිබී ගොස් එයින්ම ලංකාවේ සියම් සමාගමටත් බෝවුනාදෝහෝයි විමතියෙන් විසූවෝය. නොබෝදා ලංකාවට වැඩ වදාළ සියම් මහරජතුමා සභා කිපයකාදීම එකාංශ පෙරවීමෙන් ගම්වදනා භික්ෂූන්ට කාබේර් තවුසෝය යනාදීන් ගරහා ඊ.සි කලක සියම් රටේ මෙබඳු පෙරවීමකින් ගම්වැදීමක් නොපැවති බව ඒ උත්තමයාගේ මුඛපද්මයෙන්ම දිවස්ලාවදාළාට පසු සිය එදෙනාගේ සැකය යාහපසින්ම නැතිවී ගොස් සියම් නිකායේ ශ්‍රමණලිංගය අනන්ධාතාවෙන්නටලංවූ බැවින් මේ සිරිත පුරුදුවූ බව ප්‍රත්‍යක්ෂවිය. මේ කාලේදී මේ ශාස්ත්‍රීය දීමට මීට වඩා සුදුසු මිනිස් කටක් මේමිහිපිට නැත්තේමැයි. හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන මහානායකස්ථවිරපාදයන් විසින් එකානන ශාසනාලයෙන් පටන්ගත් මේවාදයටමේ ශාස්ත්‍රීකාරයා උන්වහන්සේගේ ජීවිතයේදීම ලංකාවට පිටත්කරවා ඒ උතුම් මුඛයෙන් මේ ශාස්ත්‍රීය එළිදරව් කරවාදුන් ශාසනාරක්ෂක දෙවියන්ට තුටුපඬුරු වශයෙන් බෞද්ධයන් විසින් රැස්කරණලද පින් අනුමෝදනාකට යුතුයි.

මේ අධර්ම ලබ්ධිය දියුණුකර හැරීම පිණිස මේ කාලයේදී සමහරුන් විසින් සිංහල ප්‍රවෘත්තිපත්‍ර තුණක් පටන් ගෙණ මෝඩ බෞද්ධයන්ගේ මුදල් වලින් ඒ පත්‍ර පවත්වමින් බෞද්ධ ගම වෛතුල්‍ය ආගමක් කරගැණීමට දිවාරෑ දෙක්හිනොකඩව උත්සාහගන්නා බව පෙනේ. අධර්මයන් දියුණුකරන්නන්ද ඊට අනුබල දෙමින් සමාදන්වන්නන්ද අපාය භාගීවීම ආනාමේ නියමය බැවින් මෙබඳු පත්‍රවලට දායක වන මෝඩයන් පවා නොදැනුවත්ව අපායට යන බව නුවණින් සැලකියයුතුයි.

මේ ගැණ බුදුපියානන්වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නික්මුන් වූ ආඥාවනම් " සුපිලිසන්ව ( මනාකොට අඩගාප්‍රත්‍යාගවයා ) හැදපෙරවගෙණ ඇතුල්ගම් යායුතුය ශික්ෂිත වීය යුතුය " යනුයි. මේ නියමය ඉතා සංක්ෂිප්ත බැවින් මෙහි අර්ථ පන්සි යන්න් ක්ෂීණාශ්‍රව මහරහතුන් විසින් මීට අර්ථ ලියනලද්දේ මෙසේයි. සුපිලිසන්ව පෙරවීමයයි කියන්නේ ගලුවලුයෙන් උඩත් දැන මැණික් සට්ටුදෙකෙන්පහලත් දෙපයේබත්කෙණ්ඩාදෙකින් පහලත් අත්හැර ඉතුරු සියලු ශරීරයවැසෙනසේදෙකොණ සමකොට අකුලා ගණ්ඨිපාස අමුනා වම් උරය පට ඒ අකුලාපු සිව්රුවැටියහෙලාපෙරවාගත් කල සුපිලිසන්ව පෙරවීමයයි කියනලද්දයි කියාය. මේ අට්ඨවාවේ ආ ප්‍රණ්ඩාර්ථ තරමක් දුරටපාලි භාෂාව උගත්කාටත් තේරුම්ගත හැකිවේ. ලංකාවේමැත කපටන් සවල්පදෙනෙක් හැරසියම්බුරුමකාම්බෝජලංකා යන සියලු රටවල බුදුන් දවස පටන් මේ ශික්ෂාපදය තෝරන්නේ මෙසේමැයි මේ ශික්ෂාපදය තේරුම්ගැණීමට සංස්කෘතප්‍රාකෘතකාව්‍යාලංකාරාදිය ඕනෑ නැත්තේය. මෙබඳු ඉතා ලඝුවූ ශික්ෂාපදයක හරි තේරුම් නොදත් අය ගැඹුරු ශාස්ත්‍ර ධර්මය දන්නවාය යන ක්‍රම පුදුමයෙනුත් පුදුමයකි, තමාගේ අදහස තහවුරු කරණු පිණිස මීට සම්බන්ධනැති බොරු ගැලපීමෙන් අඥතයන් මුලා කරණ පමණමුත් මේ යටකීවාට වඩා ලොකුහර තේරුමක් විනයේ කොතනාවත් නැත්තේමැයි ශෛක්ෂ්‍ය ශික්ෂාපද සප්තාපත්ති සකන්ධයන් අතුරෙන් ඉතා පහත් තරමේ කොටසකි. ඒ කොටසේ තේරුම්ගන්ට දුෂ්කරවූ ගැඹුරු අර්ථයකුත්නැති බැවින් අර්ථකථාචාර්‍ය්‍යවරයෝ ඒවා වර්ණනාකිරීමටද විස්තර කථා නොලියති. කොට්ත්ම සියමේ ඒකාංශ පෙරවීම කවදාවත් රජතුමාගේ ශාසනීයමෙක් නොපැවතුනානම් මේ ලංකාවේ අලුත් තේරුමත් කෙරුමත් දෙකම පුරාණ එක්තර සිව්පාවෙකුගේ වලිගය රජගෙට අඩුවී කපාදැමු බැවින් ඒ කැපීම් කාටත් කරවන්ට කාලී උත්සාහයට සමානයි මේ ආගම් නියමයයි.

මෙහි ලොකශ්‍රුතිය මෙසේයි, සර්වඥයන්වහන්සේ ප්‍රත්‍යේඛකර වදාළ ලොකොත්තර ධර්මයන් අහස තිබියදී උන්වහන්සේ ලොව විසූ සියලු දෙනාට වඩා කායසංයමය වාක් සංයමය දෙක පුරුදුකලාවූ උතුමෙකි. උන්වහන්සේ බුදුවන කාලයේදී සමහර ජටිලයෝ නග්නව සිටියෝය. සමහර ජටිලයෝ රහසඟ පමණක් වසාගණ සිටියෝය. සමහරජටිලයෝ අඩියක් වසාගණ සිටියෝය. එබැවින් ලොව ඇති සියලු ශිෂ්ටාචාර ඇඳුම්ව

ලට වඩා අගතැන්පත් හස්තපාද ශීර්ෂයන පඤ්චාඞ්ගයන් හැර ඉතුරු මුළු ශරීරය වසන ඇඳුම තමන්ගේ ශ්‍රාවකයන්ට පුරුදුකල බව පෙනේ. එක අතක් එක උරහිසක් එකතනාකිසක් එළියේදමා පෙරවාගන ඇතුල්ගම්වලට සභාවලට පැමිණෙන්නට බුදුන් විසින් නියමකලානම් උන්වහන්සේ ලෞකික ශිෂ්ටාචාරයට විරුද්ධවූ කෙනෙක් බව දැන් ලෞකික ශිෂ්ටාචාරයෙන් අගතැන්පත්වූ යුරෝපිය පණ්ඩිත සමූහයාගෙන් ඔප්පුදිය හැකිය, ශරීරයේ ප්‍රධාන පඤ්චාඞ්ගයහැර අනික් අවයවයක් එළියේ දමා මගතොට යාම සභාවලට යාම වනචරකමක් බව දැනට ශිෂ්ටාචාර සිංහලයෝ පවා දනිති. එබැවින් පාළි නොතේරුනාත් බුදුන් ලොව පැවති ධර්මයන් අතුරෙන් යහපත් උතුම් ශිෂ්ටාචාර පැවතුම් ඉගැන්නූ ශාස්තෘවරයෙක් බැවින් එක පැත්තක් ඇරගෙණ ප්‍රසිද්ධ ස්ථානවලටයාමට නියමකෙරේ යයි යන්තම් මොලේ ඇති කව්රෙක් පිළිගණීද ? මේ ලෝකයුක්තියයි.

මෙහි ශාස්ත්‍ර යුක්තිය මෙසේයි පෙරවීමට ගන්නා සිව්රු දෙක තනිපට සිව්ර හා දෙපට සිව්රයි, තනිපටසිව්ර විහාර සෙනසුන්වල ඉන්නාකල එක උරයක් වසා පොරවන සිව්රයි. එබැවින් ඊට " උත්තරාසඟ " ය " ඒකාංසික " ය යන නම් දෙකක් විනයේදී ව්‍යවහාරකරත්. උත්තරාසඟ යන වචනයේ තේරුම උඩකයෙහි නොහොත් උතුරු දසරුවේ ඇලී පවත්නා සිව්රය යනුය. " ඒකාංසික " යන දෙවෙනි නාමයෙන් ඒ අර්ථය ස්ඵුටවේ. ' උත්තරිය " යන නමත් මීටම පර්‍යාය නාමයකි එබැවින් තනිපට සිව්ර විහාර සෙනාසුන්වල වසනකල එක උරයක් වසා පොරවන වස්ත්‍රය බව පෙනේ. දෙපට සිව්ර " සංඝාටිය " නොහොත් " සංඝාටිකා " යයි විනයේ දක්වයි. මේ වචනයේ තේරුම යුගලය නොහොත් දෙකය යනුයි. කන්සඟල ඇස්සඟල වහන්සඟල යනාදී වචන මීට සාධකයි. මේ සඟල සිව්රට මේ නම ලැබුනේ අංශයුග්මය හෙවත් උර දෙක වසා පොරවන සිව්ර බැවිනි දෙපටින් මසන අර්ථයෙන් මේ නම ලැබුනේයයි නොසිතියහැකිවේ. දෙපටින් මසන වස්ත්‍රයන්ට " දුපට්ට " යන නමක් වෙනම තිබේ. මෙසේ මේ වචනාර්ථයන් ගැණ සලකා බලන කල තනිපට සිව්ර වාසස්ථානයේදී එක උරයක් වසා පොරවන වස්ත්‍රය බවද දෙපට සිව්ර ගමන්බිමන් ඇතුළු ගම්වලදී දෙඋර වසා පොරවන වස්ත්‍රය බවද තදීමට ඔප්පුවේ.

ඇරත් දෙපට සිව්ර කබායක්මෙන් පාවිච්චිකල යුතු බව
පෙනේ. එබැවින් දෙපට සිව්ර යටකරගන නොහිත්ද යුතු බව
ත් ඊට ඇවත් නියම බවත් ආගමෙන් පෙනේ. ඒ සඟල සිව්ර
එක උරයක් වසා පෙරවාගණ සිසි කලක එසේ වාඩිවෙන්නට
නුපුළුවන. මේ ශාස්ත්‍ර යුක්තියයි. මේ ආදිය සලකා මේ වාදය
කරණ ගිහිපැවිදි භවතුන් විසින් මේ ශාසනය පසුබැස්වීමට
සුදුසුවූ මේ අධර්ම ලබ්ධිය ලෝකයාට නූගාත්වා මෙපමණකින්
නැවතී නියම ශ්‍රමණලිඟය ඇතිකිරීමට උත්සාහ කටයුතුයි.

(ල. මිණිපහණ)-5-2-98.

---

මා විසින් මේ මස 5 දින දරණ පහන් පත්‍රයේ පළකරවන
ලද වාක්‍යයට උත්තරයයි සිතා ශ්‍රී. රතනපාල උන්නැහේ
විසින් ශ්‍රීලංකොදයෙහි ඉතා දික් ලියවිල්ලක් පළකරවා
තිබේ. මෙබඳු කාරණයක ඇත්ත තීරණය කරගැනීමට චුව
මනාවෙනාවන පුද්ගල ගර්භාදියට හැර අනිකුත් සියල්ලට
උත්තරදීමට මම සූදානම්ව සිටිමි හේමනාව ශ්‍රවණයකරව.
ලක්මිණිපහණ පාරුපනවාදය පටන්ගත්තැන්සිට එක උර
පක්ෂයට නිගාකරණ පත්‍රයක් බව සඳහන්කරතිබේ. මේ වාද
ය ප්‍රමණක් නොව බුඩාගමට ඉඳුරා ප්‍රතිපක්ෂව කරණ සියළු
වාදවලට සහ හොරමැර තක්කඩින්ටත් නිතරම පහරදීමට
මේ පත්‍රය සැරසී සිටියි පොදු පත්‍රයයි කියන නමේ අදහස රත
නපාලට හොඳටම තේරුම් ගන්නට සංඝිකයේ උපමාව දක්
වමි සංඝික යන වචනයේ තේරුම පොදු සමුහයාට අයිතිය
යන්නයි නුමුත් සංඝික වස්තුව යහපත් සංඝයාටමුත් දුස්සී
ලයන්ටවත් ගිහින්ටවත් අයිති නැත එමෙන්ම පත්‍ර පො
දුය කියන්නේ යහපත් බම් ලබ්ධික සියල්ලන්ට අනු
බල දෙමින් හොරමැරයන්ට පහර දෙමින් ඇත්ත හප්
නය කරණබවටයි පොදු පත්‍රය කියා අධර්මවාදීන්ට ඔවු
න්ගේ ක්‍රියා යහපත්යකියා අනුබලදෙන වාක්‍යාදිය පත්‍රවල
පලකරවන්ට නුපුළුවන්වේ හොරුන්ට විරුඩව ලියනවායකියා
හොරු රැකුවුවත් සිටගණ ඔය පත්‍රය එක පක්ෂයක් හජනය
කරණවාය කාවදුවත් අපට හිතපිණිස අපේ ක්‍රියාවලට අනු
බල්දෙන වාක්‍යයක් පලකරවාගන්ට නුපුළුවනැයි කියත්නම්
ඒ කිමට පත්‍රයක් ඉඩදේයයි නොහගිමි එමෙන්ම පාරුපන

ඡාදය පමණක්නොව සියළු වාදයන්ගේ වරද පක්ෂයට ලක්මිණි පහණ අසණිප්‍රහාරයක් වැනි බව දතයුතුයි සඳ රැස ආදි පත්‍රත් මේ යුක්තියපිට පවත්වන පත්‍රයයි හිතමි 'ලක් දිව මහා විහාරවංශයෙහි හාත්පසින්ම නොතිබුනු උභයාංශ පාරුපනය සියම් නිකායේ ධම්විනයධර ආචාර්‍යයන්වයෙහි පුරු දු නොකරවූබව ඔප්පුවේ" යන වාසගමෙන් ලක්දිව මහාවිහාර වංශයත් සියම්නිකායත් එකක්බව පෙන්නාතිබේ එසේනම් මහාවිහාරනිකායයි නොකියා සියම් නිකායයි කියන්නේමන්ද? මෙසින් මෝඩයන්ට අගවන්නේ මහාවිහාරවංශයෙන් පැවත පෙරවිම රතනපාලතැනලා පමණක් කරගණියන බවයි ලං කා ඉ ති හා ස ය නො ද ත් පි ටි ස ර අ ය මේ වා අ ද හ ත ත් වෙත රටේටු නොඅදහති ලංකාවේ මහා විහාරනුගත කාශාව වස්ත්‍රධාරින් නැතුව අවිරුදු සියගණනක් පැවතුනාට පසු සිය මේ උපාලි ආදි තෙරුන් විසින් මැතභාගයේ පිහිටුවනලද සමූ ගමට මහාවිහාරයක් කොයින් ලැබුනාද ? ඒ මහානිකාය පවා මහචිනයෙන්සියමටබෝවූබව,වජිරඤාණමහාසංඝරජතුමාගේ සන්දේශ කථාවලින් පැහැදිලිව පෙණේරතනපාලතැන ලිංමැ ඩියක්මෙන් රටේ වටේ කිසි තොරතුරක් නොදැන තමන්ගේ පුරුද්දත් තමන් කිඳේත් ස්ථිරකරන්නට වෑයම්කරණ පමණ මුත් නොයෙක් රටවල පවත්නා සාසන පරම්පරාවවත් සිරිත් වත් නොදන්නා කෙනෙක්බව පෙනේ-සියාම් සමාගමේ මූල් පරම්පරාදිය දැනගනු කැමතිනම් වජිරඤාණ මහා සංඝරාජ තෙරුන් විසින් ශුලව බෙන්තර බෝපාගොඩ නායක ස්ථවිර තුන්පොලට එවා තිබෙන විශාල සන්දෙශකථාවක් බලා සැක හැරගතයුතුයි. ඒ සන්දෙශාදිය දඩල්ලේ වාළුකාරාම පුස්තකා ලයෙන් විමසනු මිලහට "ලක්දිව සියළු ගිහිපජනයාද ආගම ඇදැහිම සඹන්ධව රැස්වනවිට ඒ හැමදෙනම දෙළුර පෙරවීම හාත්පසින්ම පිළිකුල්කල බව දුටු දන්නා බෞඩයෝ තවමත් වාසයකරති" යන වාසගම දැක පුදුමවීමි,ආගමඇදහිමටදෙවුර පොරවන්ට කිවේ කවුද ? අපිකියන්නේ විහාරය වාසස්ථානය අඩාහ මාර්‍ග යනාදි තැන්හැර ජනසංකීර්ණවූ ඇතුළුගම් වීථි ආදියට පමණක්බුඩාංශුවපරිද්දෙන්දෙවුරවසාසුපිළිකන්ව පෙර

වියයුතු බව පමණකි ගෘහස්ථයෝ යම්සේ සජ්ජිත වාසස්ථාන
වල සතරරියන් පමණ රෙදිකඩක් ඇඳ උත්තාසු නමුත් ගම්මැ
ද් විට් ආදියේ යනකල තමන්ට ඇතිතරම් වස්ත්‍රයක් ඇඳ
දෙවුරවැසෙන කෝට්කමිස ආදියද හැඳ විලිවසායෙද්ද එපරිද්
දෙන්ම ශ්‍රමණයන් විසිනුත් විහාරයෙහි එකංශිකය පොරව,
හිඳ ඇතුල්ගම් ආදියට යනකල දෙවුරවසා සුපිළිසන්වයායුතුයි.
ගිහිගෙයි සිටියදී එකඋරයක් තනකිසක් කිසිල්ලක් එළියේ
දමා ගෙසින්පිටයාමට තුබූ විලිලජ්ජාව මහණවූ හැටියේ නැති
වීම නොයෙදේ.

“ එකාංශපෙරවීම ආගමානුකූල නොවේ නම් අප මිත්‍රයන්
ඒ පෙරවීම පණවාවදාල ඒ පෙරවීමෙන් පැවිදිවීවදාල බුදුරජා
නන්වහන්සේ ශාස්තෘකොටගෙණ වාසයකරන්නේ මක් නිසා
ද ” යනු රතනපාලතැනගේ ප්‍රශ්නයකි, මෙයින් හැගෙන්නේ
රතනපාලතැන මේ පෙරවීමට උපදෙස්දීමට කිසිසේත් නුසුදුස්
සෙක් බවයි; එකාංශපෙරවීමවිහාරාරාමාදිසුදුසුතැනටවරදයයි කී
වේකවුද? ඒ පෙරවීමෙන්පැවිදිනොකරවයි කීවේ කවුද? එකාං
ශපෙරවීමෙන් පැවිදිකරවූවන්ට ඒසැටිම ගම්වදින්ට නොකියා
නැවතත් “සුපටිච්ඡන්නො අන්තරඝරෙගමිස්සාමි නිසීදිස්සාමි”
යන ශික්ෂාපදපණවන්ට ඕනෑනැත, එපමණින්ම ඇතුළුගමට
වැඩිපුර අතිශය ප්‍රතිච්ඡන්නයක් ඇති බව නොහැඟෙන්නේ
කාටද ? “ සුපටිච්ඡන්නො විහාරනිසීදිස්සාමි ” යන ශික්ෂාපද
යක් නොපණවා ඇතුළුගම පිළිබඳවම ශික්ෂාපදය පැණවූ
බැවින් මහණකිරීමේදී කරණ එකාංශ පාරුපනය හැමතැන
ටම නොගතයුතු බව නොහැගේද ? එකාංශ පෙරවීමෙන් පැ
විදිකරණු ලැබූතැනැත්තාට නැවතත් “ සුපිළිසුන්ව ගම්වදි
න්ට ” කල නියමයේ ඇතිමනාසේ වැසීම කුමක්ද ? පැවිදිකර
ණවේලාවේදී “ එකංසංඋත්තරාසඞ්ගං කාරාපෙත්වා උක්කුටිකං
නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා ” යනුවෙන් උත්
තරාසඟය එකාංශකරවා උත්කුට කාශනයෙන් හිඳුවා ඇඳිලිගා
න්වා යනාදීන් වදාල බැවින් ඒ පෙරවීම හැමතැනටමතිබියයුතු
යයි කියන්නම් ඒ උත්කුටකාසනයෙන්හිඳීමත් ඇඳිලි බැඳීමත් ප
ණතියෙහානුරූහිබියයුතුනොවේද?රතනපාලතැනබුදුන්විසින්
දුන් පැවිදිකමේ අගවූ උත්කුටිකය හා ඇදිලිබැඳීම කැරදම්?
අත්දෙක වතවනා ඇවිදින්නේ මන්ද ? මනුෂ්‍යයෙක් උපදින්

යේ නිර්වස්ත්‍රවයි නුමුත් මැතභාගයෙහි විලිවසනා රෙදිපිලි
ආද්‍ය හදින්නට පටන්ගණි එමෙන්ම ශාසනයේ ඉපදීමත්වැ
නිවූ පැවිදිකමේදී ලැබුනු එකාංශය ඇතුළුගමටඅයුතුබව නො
හැගෙන්නේමන්ද ? ඇරත් ගිහිවසිටියදී ගම්මැදිවලට දෙඋර
වැසෙන ඇඳුමක් ඇතුවසිට පරම ශිෂ්ටාචාරය ඉගැන්වූ බුදුන්
ගේ ශ්‍රාවක බවට පැමිණිකල එකඋරයක් එලියේදමා ගම්මැදි
වලට යන්ට කියන්නම් මේ ආගමෙන් උගන්වන ශිෂ්ටාචාරය
කුමක්ද ? එහෙයින් අලකොල මිවනකොලමෙන් ඇකුලකර
නොගෙණ එක උරවැසීමකුත් දෙඋරවැසීමකුත් යන දෙවිධි
යක් ආගමේ නියම බවත් ඒ දෙවිධිය මේ මේ තැන්වල කටයු
තුය යන විභාගයත් දැන රතනපාලතැනගේ සභභාගිකයන්
ට වෙන ශ්‍රමණගුණ නැතත් මේ ශ්‍රමණලිඟයවත් හරියාකාර
පුරුදුකරවිය යුතුයි. “ අප මිත්‍රයාලා උභයාංශික ප්‍රතිමාරූප
ඇති විහාරකනත්ට පටන්ගත් කල් දක්වාත් බුබ පාරුපනය
එකාංශපෙරවීමම බව තදින් සිතාගතයුතු ” යන නියමනා රත
නපාලලාවැනි පුගුලන් විසින් ව්‍යවහාර නොකටයුතුයි කොළ
ඹ එක්තරා උපාශිකාවක් පෝයදා සිල්සමාදන්වීමට කොළඹ
විහාරයකට ගියකල උපාසකම්මාලා අනුරාධපුරාදී පුරාණ
විහාරස්ථාන දුටුවානොවේද ? ඒ කොතනවත් දෙවුරවැසූ පිළි
මදුටුවා ඇද්දැයි ඒ විහාරේ තෙරුන්නාන්සේ විසින් විචාරණ
ලද්දේය අනේ ස්වාමිනි මම ගියපමණ විහාරවල දකින්නට
ලැබුනේ විහාරේ සිටින වැඩඉන්න සැතපෙන පිළිම පමණකි
ඒ සියල්ලම එකාංශපෙරවීමෙන්ම දුටුයෙමි නුමුත් ග්‍රාමවීථි
ආදියේ වඩිනා ඉරියව් ඇති පිළිමයක් නුදුටුයෙමි වඩිනා කල
කෙසේ පොරවන්නේදැයි නොදනිමියි උපාශකම්මා උත්තරදු
න්නේය. සියගණන් කථාවස්තුවල ග්‍රාමනගරාදියට පිඩුපිණි
ස වඩිනා බුදුන් රහතුන් ගම්දොර නුවර දොරසිට සිවුරුගැට
වටුගන්වං පාත්‍රය අතින්ගෙන ග්‍රාමාදීයට ඇතුල්වූ බව සිංහල
කථාවස්තු බණඅසා පුරුදු උපාසකම්මාලාටමතකඇත.මහණ
කමේදී දුන්අඟයපිට ගම්නොවැදී ගම්දොරසිට ගැටවටුගැන්
නුවේ කුමටද ? විහාරෙන් පිටත්ව ආවේ සිවුරු කිසිලිගහග
ණද ? “ සිවුරුගැටවටුගැන්වීම ” යන වචනය අවුරුදු දහස්
ගණන් පරණවූ පොත්වල ඇවිත්තිබේ. මේ වචනය එකාංශ
පෙරවීමට කවදාවත් ව්‍යවහාරනොවේ සොපාරාවේ සඟ හිමාල
කඳුඅසලද පොලවේ තුබූ පුරාණ බුබප්‍රතිමා අතුරෙන් ජුදෙ
වුන්රජ ගෙදර ආදී තැන්වලට පිඩුපිණිස වැඩිය ආකාරදක්

වනතන්හි දෙවුරවැසෙන ගැටවිටුවෙන් ශියබව් ශෛලමය
බුඩප්‍රතිමා වලින්ද දඹුළුවිහාරේ තිබෙන ගැටවිටු ප්‍රතිමා ව
ලන් හා තිස්සමහාරාමෙ ගල්පිළිමයෙන්ද දැනගතයුතුස්. විහා
රතැන්ම ඇතැමෙක් විහාරයේ වැඩඉන්නා ආකාරයටමයි ඉතා
ස්වල්ප තැනක ගම්නුවරවලට වඩිනා ආකාරත් තිබේ විහා
රයේ ඉන්නාතැන් ඒකාංශයෙනුත් ගම් වදනා තැන් ගැටව
ටුවෙනුත් තිබිම වරදක්ද?

"මේ කාරුණුගැණ විනය පිටකය පමිණක්ගොව දික්
සඟි ආදි සූත්‍රධර්මයද සාධකාවේ" යනුකී පමණින්ම විනයගැ
ණ මනා පටුත්වයක් ඇතිබව පෙනේ විනයපෙල අටුවාදිය
නොසලකා සූත්‍ර අටුවාවක් බලාගන ශාසන චාරිත්‍ර උගන්ව
න්ට යාමෙන් එබඳු සැකදුරුකරන්ටම හපනාබව පෙණේ ම
න්මතු විනය ශික්‍ෂාවක් සඳහා යම් යම් කෙනෙකුගේ චාරිත්‍ර
ගුරුකමට නොගෙණ ඒ ශික්‍ෂාපදයම තේරුම් ගන්නට ආන
ධනාකරම් අභිධර්ම ක්‍රමයෙන්ම ආණාවෝහාර ධර්මයන් නිශ්
චයකරගන්ට ගියහොත් මංමුලාතවත්වියහැකි.සි"යනුද මහත්
විකාරයකි අභිධර්මයේ ප්‍රකාශිත අවිපරීතාර්ථවූ පරමාර්ථයදන්
නා කෙනෙකුට ආණාවෝහාර දෙශණා සංඛ්‍යාත විපරීත
ධර්මය නිශ්චයකරන්ට නුපුළුවන යන කියමන රත්රන් ඇති
පුරුෂයෙකුට තඹ පිත්තල යකඩ ඊයන් ආදිය කොයින්දැයි ඇ
සීමක්වැනිවේ නුමුත් අභිධර්මයනොදැන ආණාවෝහාර දෙශ
ණාවන් දැනිමෙන් බුඩාගමේ සිසිමධර්මනිශ්චයකට පැමිණෙ
න්ට නුපුළුවන්බව අර්ථශාලානි අටුවාවෙන් තේරුම්ගතයුත
සි."අත්ථිපත සික්ඛාපදං කුසලං අහපිඅව්‍යාකතං බත්තිංසෙවහි
අපත්තිසමුට්ඨාපකචිත්තානි අට්ඨකාමාවචරකුසලානිචාදස අකු
සලානි දසකාමාවචරකිරිය චිත්තානි කුසලතොච කිරියතොච
වෙ අභිඤ්ඤාචිත්තානි" යනාදිය අභිධර්මය නුගතුන්ට කෙසේ
හැනේද? එබැවින් අපමිත්‍රයා විනය අභිධර්මය යන දෙකම දුදුසු
ගුරුවරයෙකුගෙන් ඉගෙණගත්කලක මේ දුල්ළ බදිය මගහැ
රියයි සිතමි ශෙක්‍යාවෙත් ඒකාංශපාරුපනය විදුරා තිබෙන
ක්‍රමය අපට බලන්නට ප්‍රසිඩ කලහොත් යෙහෙකි මේ ශෙඛියා
ව වදාලේ ගිහින්ටද ශ්‍රමණයන්ටද? ශ්‍රමණයන්ටනම් ඒකාංශ
වෙශයෙන් පැවදිකලාටපසු හැවතත් ඒම ඒකාංශයම දේශනා
කාළේ කුමටදැයි සෙවියයුතුයි. අප විසින් දක්වනලද නම්දව

ටෝරුවේ සදහන්වූ අයට කරතිබෙන පරිහාසගැණ රතනපාලලාට නින්දුවක් නොවේනම් අපටත් එසේමැයි ඒ සදහන්වූ අයසියම්නිකායේ උපාධ්‍යායවරුමෙන් ගණන්ගෙණ බොහෝ දෙනා ගෞරව කරණබැවින් ලිවාමිස ඒ ඇත්තන්ගේ දෙවුරවැසීමවත් එකළුරවැසීමවත් මේශික්ෂාපදයට කාරණයක් නොවෙයි පුරාතන සියම්නිකායේ පැවති දෙවුරවැසීම එක්කෙනෙක් අතරේවත් නොපැවත නැතිවීයන්ට පුළුවන්දැයි යන මිත්‍රයාගේ ප්‍රශ්නය මෝඩයන්ට කාරණයක්මෙන් හැගෙතත් අපට එසේ නොහැගේ දැනට වසන භික්ෂූන් අතුරෙන් එකනමක්වත් රූපිය පටිග්ගහණාදී ශික්ෂාපද රක්නේයයි අවංකව සිතට අවිරුඬව කියහැකිද නිස්සග්ගියාපත්තිසංඛ්‍යාතම්හ ඇවැත් නිදෙස්සයි මඬින අය අතරේ සැබිය ශික්ෂාපද සෙවීම ලමසීන්කන ගෙදර කුකුලන් සෙවීමක් වැනිවේ ජාතිමානයට වාල්නොවී බුඬාගම රක්නා ගෘහසථයෝ මිත්‍රයාලාගේ මේ රහස් දැනගන්නුනම් වෙන්නේ මහවිපතකි.

" සියම්රට මහනිකායේවත් ඒ මහානිකාය පරම්පරා පිහිටි කාම්බෝජ ජේතුත්තරාදී දෙශාන්තරවලවත් මෙදක්වා මව්වර ග්‍රහණාදිය ඉගැන්වියයුතු සාම ණේරපැවිදි ගෝලයන්ට දෙවුරවසනා පෙරවුමක් පුරුදුනොකරවිමන්යන වාර්තා ධර්මයක්ව තිබේ—සියමේ මහානිකායෙහි ඇතුළුනුවරවසනා සංඝයා පමණක් අන්‍ය නිකායගැණ වැඩිබැදීම පැහැදීම ඇති රජුන්ගේ නියෝග කඩකළ නොහැකිව රජවාසල ආදියම යන එනකල දෙවුරවැසීමක්ද? " යනාදී යාම්හැල්ල දැක පුදුමයෙන් පුදුමයට පැමිණියෙමි. වජිරඤාණ මහාසංඝරාජනුමා අට්ඨකථා ටීකාසහිත ත්‍රිපිටකය සම්පූර්ණයෙන් ඉගෙණ විසිඅවුරුද්දක් සංඝරාජව ද සූසි අවුරුද්දක් සියමෙ අගරජව ද අචල ශුඬාවෙන් යෙදීමේ සූසාළිස් අවුරුද්දමුළුල්ලෙහි සියම්තාබූ පොත්පත් ඇතුළුවූ ශාසනාය ශුඬකෙලේය. මේ රජතුමා චීන බුරුම ලංකාව ඇතුළුවූ බුඬාගම පවත්නා මුළුලෝකේ රටවලට දූතයන්යවා ඒ රටවල පැවැති සාසනවංස හා පොත්පත්ද එකතුකොට බලා සියම්රට ශාසනය ශුඬකළබව රතනපාල නොදන්නා තුමුන් ලංකාවාසී උගත් බෞඬයෝ කවරුත් දන්නී මිත්‍රයා සියම්රටවත් අන්‍ය බෞඬරටක්වත් ගැණ කිසිත් දැනගත් කෙනෙක් නොවනබව මේ ලියවිල්ලෙන් පෙනේ සියම් බුරුම රජවරු ආගම අදහන්නේ මිත්‍රයාලාමෙන් නොවී ආගම දැන ඒකාන්ත ශ්‍රඬාවෙනි ඒ උතුමෝ ආගමා

නුකූලභනාවන සිරිත්ගැණ සංඝයාට බලනොකරති අගම පිළිබඳ කටයුතු කැණ මහසංඝයාගේ සභාවෙන් කරණතින්ද රජතුමා පිළිගන්නවාම්ස රජුන්ගේ නියෝගයෙන් බුඩනියෝගය කඩනොකරති සියම් රජතුමා විසින් සියම්රටේ කවදාවත් එකාංශ පාරුපනයක් නොපැවතිබවකීවෙත් එසේ පොරවන්නෝ කාෂබ්රිපරිබ්‍රාජකයන්බවකීවෙත් 'සුපටිච්ඡන්නොඅන්තරඝරෙ' යනාදියකියා මේ ශික්ෂාව දන්නවාද කියා ඇසූවෙත් මහමුදලිතුමා ඉදිරියේය රාජනියෝගයනම් මේ ශික්ෂාපදය දන්නවාදැයි ඇසූවේ කුමටද ? ඒ ශික්ෂාපදය සියමේ තෝරන්නේත් දෙවුර වසාකරණ පෙරවීමබව රජතුමාගේ ප්‍රශ්නයෙන්ම ඔප්පුගාවි සියමට අයත් ලාඕ ආදිරටවල එකාංශව පොරවා අසූත්පටයනා ගැනුත් සමග එකපතේ කන ශ්‍රමණකොටසකුත් සිටිති ඒ මහණ්කායේ නියම මූලකාරගත්තට කැමතිනම් මම ඊට විරුඩ නොවන්නෙමි.

උභයාංශය වසා පෙරවීමහරිබවට පොතක්ද අච්චුගසා දැනට එකාංශපක්ෂයේ සිටින රත්මලානේ සුමනතිස්ස සථවිරයන් වහන් සේ මේ කාරණය පරීක්ෂාකරණු සඳහා සියමට ගොස් දැනට මහානිකායේ නායකධූරය දරණ ධම්මතිලොකා චරිය මහා තෙරුන්නාන්සේගෙන් මේ පෙරවීම විචාලකල සියම්රටේ මහනිකායේ කිසිකලක එකාංශයෙන් ගම්වදින සිරිතක් නැතැයි කීබවත් ලංකාවාසීහු මාකෑකාඅටුවාවපවා නොගෙන්රණඅවසත්තයෝයයි කීබවත් තවම ජීවත්ව වසන එම තෙරුන්නාන්සේ අපසමග කිවේය එක් අනෙකින් රජතුමාගේ ගැසට්ය තිබ්යදී මෙවාසෙවීම බෑයියි එබැවින් මිත්‍රයා මහණිකායේ පෙරවීම ගැණ කී සියල්ලම අමූලික බොරුබවකියමි. මිත්‍රයාගේ කීම ස්ථිරකරණු කැමතිනම් සියමේ මහණ්කායේ ප්‍රධාන නායක සථවිරයන්ගේ ලියුමකින් මේබව ඔප්පුකලයුතුවේ එසේ ඔප්පුකරණතුරු ඔබඳු ප්‍රලාපනොදෙඩවියයුතුයි.

රතනපාලට එකාංශය ස්ථිරකරගත්තට ඕනෑනම් උන්නාන්සේට ඇනුම්බැණුම් ප්‍රලාප තොලියා විනයේදී එනඋරයක් එලියේදමා ඇතුළුගමට පොරවන්ට නියමකල ශික්ෂාපදයේ භාවාර්ථයත් රතනපාලලාගේ මූල්නිකායවූ සියමේමහණ්කායේ දැනට වසන ප්‍රධානීන්ගේ හරිඅත්සන්දරණ ලියුමකින් එකාංශ පෙරවීම ඒ නිකායේ මූල්සිරිතබව හා දැනට සමහරු රජවාසලටදෙවුරවීසන්නේ රාජනියෝගයකිබවත් ඔප්පුදීයයුතුවේ ඒ

ෂේ නොකොට බෝධ ගැනුන්ට විහාරවල බුධරූප බලන්ට නිසා රවටන්නාක්මෙන් අප නොරවටා තුෂ්ණීම්භූත වෙන්නට ආරාධනා කරමි—

---

මාර්තු මස 5 දින නිකුත්කල ලංකොදය පත්‍රයෙහි මගේ ලියවිල්ලට දක්වන උත්තරවලට ප්‍රත්‍යුත්තරයි "බුදුවරයන්ද පසේ බුදුවරයන්ද අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක රහතන් ආදි උතුමන්ද ශාසනයෙහි පැවිදිවනතාක් මහණ මෙහෙණිවරුන්ද ඒකාංශවම ශ්‍රමන ලක්ෂණය ලබද්දි පහත් වාක්‍යකාරයා උභයාංග පාරුපනය ශ්‍රමණ ලක්ෂණයයි කියන්නේ උමතුවකින් නොවේද? පහත් වාක්‍යතැනට පුළුවන්නම් උභයාංග ශ්‍රමණ ලක්ෂණයෙන් බුධාදි උතුමෙක් තබා මේකාලේ වසන ශ්‍රමණ කෙනෙක්වත් පැවදිලත් අසවලායයි නාම නියමකොට පෙන්වියයුතුයි" යනු රතනපාලගේ කීමයි මිට සුදුසු උත්තර මින් ඉහත මගේ ලියවිල්ලේ සඳහන්ව ඇති පැවදිකරණ ස්ථානයෙහිදී උත්තරා සඞ්ගනම්වූ තණ්පට සිවුර ඒකාංශකොට පොරවා උක්කුටිකයෙන් හිඳුවා ඇදිලිගත්වා උභතො ශුද්ධ සරණාගමණයෙන් පැවිදිකලයුතුබව කියාතිබේ. පැවිදිකම පිහිටන්නේ මේ සරණාගමණයෙනි මෙහිදී නොකලාවූ පුරුද්දක් ඇතුළුගම් වදනාකල නොකටයුතුනම් සංඝාටිය සඟුණකොට සුපිලිසන්න්ව ගැටවටුනැන්වීම පැවිදිවීමේදී නොවදාල බැවින් පසුව සහල සිවුරු ගැටවබු ගැන්නීම් ආදියද ආගම විරොධයකි. ප්‍රව්‍රජ්‍යාසීලය සමාදන්වියයුතු ප්‍රස්තාවෙහිදී නියමකල ඒකාංශිකය හැමතැනටම සාධාරණයයි යම් විනය පොතකින් පෙන්වනතුරු බෝධ උපැසිකාවරු රවටන මෙබඳු හිස්බස් නොලියයුතුයි. බුධානු බුධ බුධ ශ්‍රාවක සියඑදෙනාම ඇතුළුගාමිවදවනා කල නගර ග්‍රාමචාරාදියෙහිසිට සඟලසිවුරු ගැටවටු ගත්වා පාත්‍රය අතින්ගෙණ පිඬුපිණිස ආගියබවමුත් පැවදිකලදී ලැබුනු ඒකාංශයෙන්ම ගම්වැදුනුබවක් පොතකින් නොපැණේ පැවිදිඋනොත් ඒකංශයෙන්නම් විහාරෙඋත්නොත් ඒකාංශයෙන්නම්නුවරදොර ගම්දොරසිට සඟලසිවුරු ගැටවටුගන්මනවාය කියන්නේ කෙබඳු ගැටගැසීමක්දැයි රතනපාල විසින් විස්තර කටයුතුයි එබැවින් මින්මතු රතනපාල විසින් පැවදිසාමෙන් නොලැබුනු සඟලසිවුරක්සහ ගැටවටුවකුත් ඇතුළුගමට බුධාදී උතනම්යන් විසින් පැවැත්වූබවත් මේදක්වාම නියම

.ශාසන පරම්පරාවඇති රටවල ඒපෙරවීම් පවත්නාබවත් දැන
ගතයුතුයි. එකාංශපෙරවීමෙහිදී සිවුරුකොන්කැටිකර නිසලිගස්
නාගැණීම මස ගණ්ඨිපාසඇවිනීමක් නොකලහැකිබව සැල
කියයුතුයිමහණෑකිරීමේදී "එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා"
යනුවෙන් තනිපටසිවුර එකාංශකොට පොරවා පැවිදිකරවන්
ට කලනියමයත් ඇතුළුගම්වැදීමේදී "සුපටිච්ඡන්නො" යනුවෙ
න් සගලසිවුර සුපිළිසන්ව පොරවා ගම්වදින්නට කලනියමය
ත් දෙක එකකැයි තේරුම්ගත් මිත්‍රයා මේ බුධාගම තේරුම්
ගෙන සිටින්නෙකැයි මෝඩලෝකයාගේ පිලිගැණීම ආගම වි
නාසයට කාරණයකි ? එබැවින් මිත්‍රයාට පූර්වපක්ෂනම්රාහු
ලකුමාරයන් පැවිදිකිරීමේදී සැරියුත්තෙරුන්ට වදාල "එකං
සං උත්තරාසඞ්ගං කාරාපෙත්වා" යන වචනයත් ශෛඛියාවේ ව
දාල "සුපටිච්ඡන්නො" යනාදි ශික්ෂාපදයත් දෙක එක
ක්බව පෙන්වියයුතුයි පැවිදිකිරීමේදී උත්තරාසඞ්ගයෙන් එ
කාංශකරන්ට කලනියමයත් ගම්වැදීමේදී සගල සිවුරෙන්
සුපිළිසන් කරන්ට කලනියමයත් යන දෙක හාත්පසින්ම ව්‍ය
ඤ්ජනවශයෙන් හා අර්ථවශයෙන්ද කාලවශයෙන්ද දේශව
ශයෙන්ද ප්‍රඥප්ති වශයෙන්ද ආකාරවශයෙන්ද චීවර වශයෙ
න්ද යන සජාතාකාරයකින් වෙනස්වූප්‍රඥප්ති දෙකක්බව දැන
ගතයුතුයි මේ දෙක එකක්නම් එකක් ප්‍රථම ප්‍රඥප්තියහා අ
නිත අනුප්‍රඥප්තියද වියයුතුයි. එසේ ගත්තත් එහි වෙනස්
ඇතිවියයුතු බැවින් අනුප්‍රඥප්තියක් වදාලබව හැඟේ. එසේ
හොව මේ දෙක එකක්නම් කවර ප්‍රඥප්තියකට ඇතුලත්වේද
කියාත් විස්තර කටයුතුයි එකංශිකය සුපටිච්ඡන්නය යනදෙක
තේරුම්ගතනොහැකි අප මිත්‍රයාගේ අනුශාසනා පිලිගන්නා
අය ඇතිවීමෙන් ශාසනය පහලබැස ගියතරම පෙනේ—

මිත්‍රයාගේ ලියවිල්ලේ සියම්රටේ නිකායමටමහානිකායේ එකාංශ
පෙරවීම් ඇතුළුගමට ඇතැයි කී මිත්‍රයාගේ කියමන දැනට බුදු
න් වැඩිමට ලඩකාවට ඇවිත්සිටින මහානිකායේ භික්ෂූන්ගෙන්
විචාලතැන මෙබඳු විලිබියනැති බොරුකියන රහතපාල දැකී
මට ඒභික්ෂූන් කැමතිබව කියන්නට සෙදුනේය. සියම්රට පැමි
ණිනාත් සියම්රටේ සියලු ප්‍රවෘත්ති දැනගත් අගරජතුමා ලංකා
වට පැමිණි මහසභා මධ්‍යයෙහිසිට එකාංශ පෙරවීම ඇතුළත්

මට භාවිතාකරණ කිසි නිකායක් සියම්රටේ කිසිකලක නො පැවැත්තේය සෙකියාම් මොවුන් නොදන්නාහුදැයි ඒවාලේරජ තුමාගේ කිසි ඊර්ෂ්‍යා සහගත කල්පනාවකින් නොවේ. ඒ කිය මන ඇසූ සියගණන් මනුෂ්‍යයෝ සිටිති ඒ රජතුමා ඇවිත් අව රුද්දක් පිරෙන්නට මත්තෙන් රතනපාල විසින් මෙබඳු බො රු ප්‍රලාප පළකරවන්ට පටන්ගත්තේ ශාසනාලයකින් නො වේ. රත්මලානේ විසූ ධම්මාලොක තෙරුන්නාන්සේ තමන්ගේ ගෝලසින්ට දෙවුරවසා පොරවා පිඬුපිණිස යන්නට කිසිකාල ක ඉගැන්නුවේ නැත යන කියමනත් මහාසාවද්‍ය බොරුවකි ධම්මාරාම නායක ස්ථවිරයන් වහන්සේ බොරුනොකියන සත්‍ය වාදී කෙනෙකි උන්වහන්සේ ළදරුකාලයේ පටන් වැඩුනේ රත්මලාණේ ගමේ පිඬුසිඟාසැප්මෙනි උන්වහන්සේ කිසිකලක දෙවුරවසාපොරවා රත්මලාණගමේ පිඬුසිඟුවේනැත යන වග න්තිය උන්වහන්සේගේ අත්සනින් ඔය පත්‍රයෙන් ප්‍රසිද්ධකල හොත් මගේ කියමන අසත්‍යබවත් රතනපාලයේ කියමන ස ත්‍යබවත් ලොකයාවිසින් පිලිගතයුතුයි මෙහි;සඬ්වූසත්‍යය මෙ සේයි ධම්මාලොක තෙරුන්නාන්සේගේගෝලබාලයන් සහඒ විහාරේ ඉඳ පෙරත්විසූ අඩුපේආදී භික්ෂූන්වහන්සේලාත් කැල ණියේ වාදයටබැහිනතුරු දෙවුරවසාපොරවා පිඬුපිණිස ගොස් සිට කැලණියේවාදයෙන්පසු සුල්පකාලයක් එකඋරයවසාපො රවා මැදින් පටියක්බැඳ පිඬුපිණිසහැසිර දූනට ඒ පටියත් හැ රදමා එකඋරයවසා ඒ විහාරෙන් පමනක් පිඬුපිණිස යන බව ත් අනිකුත් සියම්නිකායේ සියළු ස්ථානවලින් පිඬුපිණිස යන කල දෙවුරවසා යනබවත් සත්‍යයකි මේ කියමනට රත්මලානා ගම්වාසී සියලු සත්පුරුෂයෝම සාක්ෂිදෙතැයි විශ්වාසකරමු.—

තවද ඉංග්‍රිසි ආණ්ඩුවගණනේ උඩරට අල්වන්නට ගිය යුධ හමුදාව බාරේගිය දොක්තර් ඩේවිස් මහතා විසින්උඩරට පැව ති සියලු ප්‍රවෘත්ති සඳහන්වූ පොතක් ඉංග්‍රිසි භාෂාවෙන්ලියා වර්ෂ 1821 දී ලන්ඩන්නුවර අච්චුගස්වාතිබේ. ඒපොත ආණ්ඩු ව සම්බන්ධ බොහෝ පොත්ගුල්වල ඇතැයි සිතමි. මෙම පො තේ කොපියක් මහනුවර පත්තිරිප්පුවේ පොත්ගුලේද තිබේ ඒ පොතේ මහනුවර වලව්වකාදි ගණනාලද ස්ථවිර කෙනෙකු

ගේ සහ දිසාමහත් කෙනෙකුගේත් ඡායාරූප දෙකක් තිබේ ඒ සවිරරූපය දෙව්රවසා පොරවා තිබෙනබව පෙණෙන බැවින් පූරාණ සියම්සමාගමේ දෙඋරවසාපෙරවීමතිබී පසුව සමහරුන් අතර අන්තර්ධානවූ බව මාවිසින් දක්වනලදි. මෙබඳු ඔජ්පූ ශාස්ත්‍ර නැතිව මහණකරණ නැවි බලාපල්ලා ගෙදනිළයේ වැඩඉන්නා ලීලාවට විහාරතුල අඹාතිබෙන බුඩරූපබලාපල්ලා යනාදී ජලතල ශෛවාලවැනි සිස්බස් දෙඩවා දනදැන බුඩවචනයන් පෙරළන්ට උත්සාහකොට බොහෝ දෙනෙකුත් සමග අපාය භාග්‍යනොවීමට රතනපාලට අවවාදකරමි.

මීලඟට හික්කඩුවේ නායක සුවිරපාදයන් වහන්සේ මහ පිරිස් පිරිවරාගණ මෙසම්බන්ධවාදයකට කැලණියට ආබවකුත් එහිදි ධර්මාලෝක සුවිරාදින් විසින් විචාල විනය පිළිබඳ ප්‍රශ්නයන්ට "කියනුනොහැකිය" යනාදි උත්තරලියාදි ගැලවීයබවකුත්මේ උභයාංසපෙරවීම බුරුමනිකායේ කෙරෙණබවකුත් යනාදි අපෙදනා හැල්ලක් ලියාතිබේ හික්කඩුවේ නායක සුවිරපාදයන් වහන්සේට උත්තරදීගත නොහැකි විනයපිළිබඳ ප්‍රශ්නමේ ශත වර්ෂයෙහි ලක්දිව ශ්‍යම්නිකායේ යමෙකු විසින් විචාරණලද්දේය යන කියමන පිළිගත්තේ ලක්දිව උගතුන්ගේ ප්‍රමාණනොදත් පට්සරගැණු අම්මන්ඩිලාස්ස වෙනඅයනොවේ ස්වල්පවිලාවක්වත් ඌරවපහුවූවක්ට බැරි මෙබඳුබොරු ප්‍රවෘත්තිපත්‍රවලට ලිවීම අශෝභනයෝවරසි ලක්දිව මේ ශතවර්ෂයතුල ධර්මවිනය දැනගත් නියම පණ්ඩිතයන් අසවල්එයයි ප්‍රත්‍යක්ෂව දන්නා අයට මේවා පුදුමකාරණායි බුරුම නිකායේ පෙරවීමය යනාදි විශේෂවභාගයක් නුවනැත්තෝ පිළිනොගණිති.

බුඩාගම පවත්නා සියඑරටවල සිවුරුවැලඳීමකරන්නේ සේඛියාශික්ෂාවට අනුවයි ඒ ශික්ෂාවට යම්නිකායක පෙරවීම අනුකූලනොවේනම් වැරදීමක බුඩමතයයි කියාලොවට උගන්වානම් එබන්දන්ට නියම්ශාසනික භික්ෂූන්ටදෙන ගෞරවනොදියයුතුයි මේපෙරවීම අනුදැන වදාලේ පචිත්තිපොතේ සේඛියාවේදීය එහි අර්ථ නා නා ප්‍රකාරයෙන් විස්තරකරණලද සමන්තපාසාදිකා අටුවාව මාතෘකා අටුවාව සාරත්ථදීපනිටීකාව වජිරබුද්ධිටීකාව විමතිවිනොදනිටීකාව විනයගණ්ඨිය විනය විනිශ්චය විනයාර්ථ මංජූසාවය යනාදීපොත් රාශියක් තිබේ මේ සියඑ පොත්හිම "සුපටිච්ඡන්නො අන්තරඝරෙ" යනාදි ශික්ෂාප

දළුගල්ලේ අර්ථමහාසේවිස්තරකරතිබේ මේසියළුපොත්එකතු කොට බැළුවාම ලංකාව සියම බුරුම යන දෙශත්‍රයෙහි ඇතිවූ සියළු විනයාචාර්‍යස්ථිරවයන්ට හැඟිගියේ සුපිළිසන් පෙරවීම දෙවුර වැසීමබවයි කලියුගයෙහි ඇතිවූ රතනපාලනම්වූ අප ස්ථවිරවිශූවයස්සයාට පමණක් එකළරයබව හැඟියාම මහත්පුදුමයකි එහෙයින් අපමිත්‍රයා මෝඩම්හිසුත් රුවටනගම්මැදිහැලවලින් කාරණයට පිරිහොමසිනා නිරර්ථක දික්කළාවත් නොලියා පචිති සෙඛියා ශික්ෂාව විස්තරකළාවූ අටුවා පොත්වලින් හෝ, "පටිසංඛායොනිසොචීවරංපටිසෙවාමි,, යනාදින් වදාල සිවුරුපිළිසෙවීමේ ආනිසංස පාඨයෙන් හෝ මේ කාරණය ඔප්පුදී නිදහස් වියයුතුයි එසේනොකොට අන්නඅතනාව්හාරේ පිළිබේ බලාපල්ලාය මෙන්න මෙතන මහණකළසැටි බලාපල්ලාය යනාදී නිස්සාර හිස් ප්‍රලාපයවලින් කාලය ගතකරන්ට නොහිතියයුතුයි.

---

### ඒකාංශ පෙරවීම හා සියම්රජතුමාට බැණුම්.

මාර්තුමස 12 දින නිකුත්කළ ලංකාදයපත්‍රයෙහි යු. රතනපාලගේ ලිපුමට පිළිතුරුයි.

මෙ පත්‍රයේ තිරපහක් පමණ ලියා තිබෙන ලිපුමේ එකාංශ පෙරවීම ගම්වැදීමට කටයුතුය යන අර්ථය ඔප්පුදීමට එකමවචනයක්වත්නැත්තේය.

"අප මිත්‍රයන් තව තමන්ගේ අඹුදරු ඈසි දසාදීන්ට වරින් වරට එක එක විධියේ ඇඳුම් පෙරවූම් කරවා බලන්නාක් මෙන්" යයි කිවේ එබදු හැඩබැලිමක් ශිෂ්ටාචාර මිනිසුන්අත රේකොයින්ද? මිට සුදුසු වචන පාවිච්චිකරන්ට දන්නානුමුත් මටශ්‍රමණ වෙස් ගත්තෙක් නොවනබැවින් එසේනොලියමි

ඉතින් මෙබදු නැතවචන පාවිච්චිකරණ මේ පුද්ගලයාට අනුව පිළිපදිනා අනුචරකයෝ කෙබදු අයවියයුතුද ? එකාංශය හරිබව ඔප්පුදෙවීමට මෙබදුහපනෙක් තෝරුම්කරගත් එකාංශ පක්ෂියාට ස්තුතිකටයුතුයි

සංසුන්කායවාක් සමාචාරඇති ධර්මලබ්ධිකයෙකුගේ මුඛයෙන් මෙබදුවචන නොනික්මේ පුරාතන බෞද්ධරජ්ජුන් බොහෝ දෙනෙක්සිවිය නුමුත් වීරජ්ජුන් විනාශවීගොස් මෙවකට බුදුන්ගේ සරණගිය ඔවුනුපලන් අග්‍රාජනුවෙක් ඇත්තෙත්සියම් රජතුම

පමණයි මේ අගරජතුමා නැව්වරාය පාලමලඟදී බුද්ධරූපයලඟ දණින්හිඳනමස්කාර කරද්දී එදුටු කවරනම් බෞද්ධයෙකුගේ ලය හුනුනොවීද ? ඒ රජතුමාට දිවිපුදන්නට කවර බෞද්ධයෙක් නොකැමැතිවීද ? මේ රජතුමා ලන්ඩන්, පැරිස්, බර්ලින්, වියානා සැන්ට්පීටර්ස්බර්ග්ආදී මේ කාලයෙහි මහේශාක්‍ය මහානුභාව සම්පන්න නරදෙවයන්ගේ අගනුවරවලදී සාමාන්‍ය සහෝදර රජකුලයන් විසින් හා සකල නගරවාසී වෙළඳ සිටුප්‍රභුවරයන් විසින්ද පුවද මල්වඩමක් සමාදරයෙන් පැලඳගන්නාසේ රජතුමා වැලඳගෙන ගෞරවදුන්බව ප්‍රවෘත්ති පත්‍රවලින් දුටු කවර බෞද්ධයෙකුගේ සිත් ඔදනොවැඩියේද ? සියම්රජකුලයේ ඇතිවූ සියළු රජුන්ටවඩා මේ රජතුමා ඥාණවන්ත උත්තමයෙකැයි මුළුලොකවාසී පණ්ඩිත පත්‍රකතෘවරයන් විසින්ද වර්ණනාකරණුලැබුයේය නුමුත් මේ හපනා පමණක් "සියම්රට අරාජකවගිය කාලේදී එරට වැසියෙක්වූ යුධසේනාපතියෙක් මහජනයාගේ සම්මතයෙන් රජයහි අභිෂේකකළතැන් පටන් පැවතඑන සමූහ සම්මත පෙලපතක්වේ ශාක්‍යරජුන්ටනවා පුරාණ සියම්රජුන්ටවත් මේ අළුත් පෙලපත සම්බන්ධනොවේ,, යනුවෙන් මේ රජතුමා රජකුලැත්තෙක් නොවනබව ඔප්පුදීතිබේ. යුධසෙනාපති තනතුරු ශක්ති සම්පන්න නිවයන්වපවා ලැබෙනනිසා මොහුගේ අදහස රජතුමා නීචයෙකකියා ඔප්පුදෙන්නටයි රජකුලැත්තෙකුට සෙනෙව්වසිට රජවෙන්ට බැරිද නැත්නම් රජකමක් ඉද්ද ? පහන්කතෘ ශාක්‍යරාජ පෙලපතයකිවේ බ්‍රහ්මඬඩයෙහි සියළු රජපෙලපත් හරියාකාර ලියාතිබෙන බුරුම රාජවලියේ ආක්‍රමයට බව ඔහුගේ වාක්‍යයේතිබුනාමතකයි අප මිත්‍රයාගේ එරට ඉතිහාසය මොනභාෂාවෙන් ලියවීතිබෙන පොතක්ද ? මේ කාරණය සඳහන්වී තිබෙන්නේ කීවෙනි පිටේද ? යනාදිය විස්තරකටයුතුයි පහන්කතෘ ශාක්‍යවංශය නැතත් ඒ උතුම් වංශයට මේ රජපවුල සංසන්දනයකොට ලීවායකියා සියම්රජතුමා කෙරෙහි ආඝාතබැදගත් රතනපාල මිත්‍රයාහැර සිත්පිත්ඇත්තාවූ කිසිවෙක් පහන්වාක්‍යයට අපහාශනොකෙළේය පහන්වාක්‍යය ඉංග්‍රීසිපත්‍රවලින් බැළූ සියම්රජපවුල සතුතිකෙළේය. ජීවමාන තෙජො බල පරාක්‍රමාන්විත මහ රජුන්ගැන බොරු පළකරණ පහන්මිත්‍රයාට ශ්‍රමණවගීයාගැණ බොරු පළකිරීම කුමන දුෂ්කරයක්ද ? යන මෙයින් රතනපාල කෙබඳු අදහස් ඇත්තෙක්දැයි තේරුම්ගතයුතුයී රතනපාල කියන ආකාරයට නීචකුලයකින් පැවතෙන මෝඩ රජෙක්නොව ශාක්‍ය වංශයෙන් පැවතෙන උතුම් රජකෙනෙකැයි පහන්කතෘගේ කීමට රජතුමා උදහස් නූනාඇති නොවපිනා කෙනෙකුට වටිනා උත්තම

යෙකැයි ආගමාලයෙන් මුළාව වර්ණනාකළ පහන්කතීඃට අප මිත්‍රයා
විසින් ඔහුකළ ගැරහුම්මදී, දෙශදෙශාන්තරගැණ පහන්කතීඃටම්
බා විශාල දැනුමක් මිත්‍රයාට ඇතිබව සහ පොත්පත් සියල්ලම මිත්‍රයා
ට ශාක්ෂිදෙනබවත් කියාතිබේ දෙශදෙශාන්තරගැණ දත්නාහරම
ඔය එකාංශ පෙරවීමෙන්ම ඒරටවල ගියඅය තේරුම්ගණින් පොත්
පත් ශාක්ෂිදෙනහැටි මතුබලාගනිමු මේ වාදයකරන්නේ පහන්ක
තීඃයයි හැඟෙන්නට ලියාතිබෙන නුමුත් අප මිතුරා සමග මේ කාර
ණය බේරාගන්නට අපට බැරිවුනිනම් මිස පුළුවන්නංක් අප පහන්
කතීඃ මේ ගැණ වෙහෙසනොකරවමි. මේ රජු කෙතරම් ගුණ නැණ
වතෙක්ද යනු ශ්‍රී දන්තධාතූන්වහන්සේට පුදකළ එකම ඉටිපන්දම
පවා නිවාගනිමින් එකමලකුත් නොපුද ධාතූන්වහන්සේට උදහස්
ව පිරිනැමූ පුදපඬුරුත් ආපසුගෙන්වාගැනීමෙන්ද ඉංග්‍රිසින් ඉදිරියේ
දළදා මාලිගාවට සාපකර දිවස්ලා වදලකරණුවලින්ද නැණවතුන්
ට ප්‍රත්‍යක්ෂවිය මේ රජුගේ මුඛපද්මයෙන් වෙරිමරගාතේ නුමුත් නී
කුත්විතිබෙන්නේ නිසිපෙරවුම් ශික්ෂාපදයයි,, යන රතනපාලගේ ව
චනපන්තිය හා ''රජුගේ සිනාව වෙරි ඇතුවවත් නැතුවවත් වැටීති
බෙන්නේ අප මිත්‍රයාලාගේම දෙවුර පිටට නොවේද ? යන වාක්‍යය
ත් රතනපාල මිත්‍රයාගේකටේ මිස හිතේ බුඩාගමකාවැදී ' ඇත්නම්
ඒකාන්තයෙන් නොලියනවග බෞඩයන්ට හැඟෙනවා ඇත. පාන
බොක්කේ උන්නැගේ දළදාවටකළ නෙරෙක්කුවගැණ ලංකාවේ න
ම්බිලා විශෙෂයෙන්ම කිපීසිටියෝය මරක්කයන් මිසදිටු නුමුත් සිංහල
බෞඩයන් හා සමග ඇති දෙශජාතිසම්බන්ධය නිසා ඔවුනුත් සියම්රජතු
මා ගැණදිවිපුදනතරම් ආදරගෞරවයක් ඉපදවූබව දනිමු අප රත
නපාල මිත්‍රයා ශ්‍රමණකෙනෙකුත් සිංහලයෙකුත් වෙලා අපේ එකම
බෞඩරජතුමාට මේ කළ අපහසගැණ මගේ ලය දෙදරයි රජතුමා
බේබද්දෙක රජපවුලේ කෙනෙක් නොවේය යහපත් නැණවතෙක්
වත් ගුණවතෙක්වත් නොවේය කියා මේ ඊයේ පටන්ගත් ඇවිලක
බයෙන් කීවාමිස බෞඩයන්ට සතුරුවූ කතෝලික පත්‍රයෙන්වත් මෙ
බදු අපහසයක් නොකළේය. කතෝලිකසමූහයා ආගමඅහින් වෙන
ස් නුමුත් ජාතිවශයෙන් හා දෙශවශයෙන්ද බෞඩයන්ගේම නෑකො
ටසකි එබැවින් ඔවුන් අහෝ මේ අපේ රජතුමෙක් නොවේදැයි කියා
මහත් ගෞරව ඔවුන්ගේ පත්‍රවලින් පැවැත්තුවා මතකයි. අගරජතු
මෙකුට බේබද්දෑයයනකීම නීත්මාගීයට කොහේවේදකියා පරීක්ෂාකා
වීම සියම්රාජාධිරාජෝත්තමයාගේ ලාංකික ඖපනික්ෂිප්ත ධුරයදර
ණ මහතුන්ගේ යුතුකම්කි අගරජතුමෙකුට තබා සාමාන්‍ය මනුෂ්‍ය

ලංකාවටවත් බෞද්ධයන් සොරායයනාදී වචන නියම නම් ගම් ඇතුව
ප්‍රවෘත්තිපත්‍රවල පළකරවීම ඒකාංශනීතියට හරිවෙතත් ඉංග්‍රීසීනි
යට හාත්පසින්විරුද්ධයි ආගමටවත් ලෝකයටවත් නොදත්සමහරු
ලෝකාන්තිමේදී පහළ වෙනවායයි අන්තක්‍රිස්තු මේ හෘදයායකියා
ශිනාගණ ලිය ලියා දෙන බොරුප්‍රලාප පළකරවීමෙන් මෙබඳු ම
හත් අනාගතවාක්‍යනවලට අසුවනබව සිහියෙන්යෙදී සැලකියයුතුයි. අ
න්තක්‍රිස්තු දහඅටහාරාවම දනගත්තම් ඒකාංශපාරුපනයෙන් ගම්
වදින්ට අනුදනවදලතැනක් ආගමෙන් ඔප්පුදුන්නොත් අන්තක්‍රි
ස්තුට මුළුලක සහරාජතනතුරලබාදෙන්ට උත්සාහකරම් අන්තක්‍රි
ස්තුගේ ඒකාංශය ඇතුළුගමට හාත්පසින් බොරුබව ඔප්පුදීගන්ට
බැරිඋනිනම් මගේමිලියනඅත රේල්පිල්ලක් උඩහබා බුඩාගම වෙ
හුවා පුදනබව දනගතයුතුයි රතනපාලනැන ලියන්වපලමුවෙන්
මේවාදයේ ඒකාංශපක්ෂය උසුලන ගෞරවනීයාවායසිශ්‍රීධර්මාරාමාභිධා
න දෙපලාතේ සහ දෙපිරිවෙණේ මහානායක සර්වීරපාදයන්ගෙන්
වත් ටිකක් විමසාලියන්ට තරකද ? උන්වහන්සේ කුමාරභික්ෂුවපැ
විදිවන දවසේ වස්කඩුවේ පොත්ගුල්විහාරය උඩ වැඩසිටගත "සිය
ම්රජවංශයෙහිවූ මේ කුමාරයා බුදුරජානන්වහන්සේටත් නෑයෙක්
වෙන්ට පුළුවන මක්නිසාද ? සියම්රාජවංශය ශාක්‍යවංශය බැව්
නැයි" යි දසදහස්ගණන් ගිනිපැව්ද්දන්මැද කුරව්කනාද නිර්විශෙ
ෂාශ්වාහසමුජ්ජන බ්‍රහ්මඝෝෂා විහිදුවා ප්‍රකාශකළබව එදමවත් ඇ
හුනා ඒබවට ඒ මුළුසභාවම සාක්ෂිදෙනසේක්වා, පහණේවාක්‍යයලී
වේ මේ විවරණසිරිල්පතුදෙවා වදලාට කීමාසයකට පසුවද යනාව
ග අප රතනපාලනැනට මතකඇත තවද යථොක්ත දෙනායකසර්
වීරපාදයන් නමින් කොලඹ රජගෙදරදී ඔප්පුකරන්නට ගෙණගිය
රත්රණින් මුද්‍රණයකරපු කදිමලක්ෂණ ස්තුතිප්‍රබන්ධය සම්මතාමර
වංශ කුමාරයාඅනාටගෙණ විසිකලතැන ඇ:හිදගෙණ දනට මාලග
තිබේ එහි "බුධංකුරාහොදිතො,, යනාදි කදිමගාථාවලින් සියම්රජ
තුමා බුඩාංකුර බොධිසත්වයෙක්බව ප්‍රකාශකරතිබියදී කිසිවගක්තු
ශක් නොදත් රතනපාලනැන ඒ රජතුමා බෞද්ධයෙක ගුණනැණ
නැත්තෙක කියා ප්‍රසිද්ධයේ පත්‍රවල පළකරවීම කොපමණ දරුණු
පාපයක්ද ? දන්ඉතින් සියම්රජතුමා බෞද්ධයෙක ශාක්‍යවංශයෙකි
කෙනෙක්නොවේය. යනාදි රතනපාලගේ බොරු අපහාස සියල්ලම
අපලංකාරලෙක තිලකායමානවූ අපේ මහාදෙනායක සර්වීරයන්
ගේ අවිලංඝනීය සාක්ෂිවලින්ම ඔප්පුකරඹවරයි. අප දෙපක්ෂයම න
වවනතුරු ශික්ෂාපද විස්තරයට බැහැසේනැත ඒවාත්මෙසේමවන

බව කල්හීයාදූනගන්ට හොඳයි. සියම්රජතුමා ඒකාංශපක්ෂයට වාසි
ඇති ඒකවචනයක්වත් කිවානම් පූජ්‍යාතිපූජ්‍යතරාචාර්‍ය්‍යයී අප දෙනා
යකසළුවිරයන්ට බෝධිසත්වයෙක්සේ පෙනීගියාක්මෙන් රතනපාල
තැනටත් බුදුවරයෙක්මෙන් පෙනීයනවාඇත, වාසියට උත්තරලැබු
නාය යනකීම අසත්‍යබව රජතුමාට කරතිබෙන බරපතල රාජාප
රාධ අපහසවලින් ඔප්පුවේ. යම්සේ එක්පියාපතක්ඇති පක්ෂියාට අ
හසින් නොයාහැකිවේද; එක්පයක් ඇති සත්වයෙකුට පොළවේනො
යාහැකිවේද එක්සකක්ඇතිරිය ගමන්නොකෙරේද එක්රෝදයක්
ඇති දුම්නැව සමුද්‍රයේ නොයේද එපරිද්දෙන්ම එකළුරයක්වසා ගම්
වදිනා බික්සඟුන්ටද මේ සසරකතරින් එතරවියනොහේ මක්නිසා
දයත්, ශෛඛියාවත නොපුරන්නවුන්ට ශීලවිශුද්ධියද සීලවිශුද්ධිය නැ
ත්තන්ට චිත්තවිශුද්ධියද චිත්තවිශුද්ධිය නැත්තන්ට අවශෙෂපචවිශුද්ධි
යද නොලැබෙනහෙයිනැයි සකලබෞද්ධයන් විසින් අවබොධකට
යුතුයි.

මාර්තු 19 දින නිකුත්කරණලද ශ්‍රී බරපත්‍රයෙහි පූ. රතනපාල
තැනගේ ලියවිල්ලට පිළිතුරැයි.

මගේ මුල්ලිපුමෙහි මනාකොට අභප්‍රත්‍යගයන්වසා හැඳපෙරව
ගෙණ ඇතුල්ගමට යායුතුය ඉඳිය සිටිය යුතුයයි ලියනලද්දට අපහ
සකරමින් මෙසේ ආඥවක් අප බුදුරජානන්වහන්සේගේ විනයෙහි
නම් නැත එසේ පෙණෙනවානම් "සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ
ඩා තබ්බං" යන ශික්ෂාවකුත් තිබියයුතුයයි පරිහාසකොට විනයනය
ක් නොදත් මේ අවිනීතමිත්‍රයන් නොපවනලද්දක් පණවනලදැයි කි
යමින් සසුන් වනසා අපායභාග්වනු දුක්ම බෙදයක්මැයි කියාතිබේ.
නුමුත් සුපටිච්ඡන්නව ඇතුළුගම සිටියයුතුය යන ප්‍රඥප්තිය මා විසි
න් පෙන්වාදෙනලද්දේනම් විනයනය නොදන්මත් අවිනීත බවත්
පණවනලද්ද නැතැයි කියමින් සසුන් වැනසීමත් අපාය භාග්වීමත්
ආපසු අප මිත්‍රයාටම භාරගන්නටවෙයි පාලිමුත්තක විනයෙහි පිණ්
ඩවාරිකවත දක්වනතැන "පිණ්ඩවාරිකභික්ෂුව විසින් දැන්ගම්වදිමි
යි සලකා නෙමඩුළුවසා පිරිමඩුළුකොට අඳනයහැඳ කාබගණබැඳ
තනිපට දෙපට සිවුරුදෙක සඟුණකොට පොරවා ගණ්ඨිකය පාස
යෙහි අවුණාපාත්‍රය සොධාගෙණ මනාකොට සුහුසුළුනොවී ගමට
යායුතුය සුපිළිසන්ව ඇතුළුගම්හි යායුතුය යනාදි සියළු විධියහනා
ශ්‍රවනෙහි කී ක්‍රමයෙන්ම මෙහින් දතයුතුයි. නිවේසනයට ඇතුල්ව
න්නාවූ භික්ෂුව විසින් මෙයින් ඇතුල්වෙමි. මෙයින් නික්මෙමියි සල
කාගතයුතුයි වහාඉක්මන්ව ඇතුල්නොවියයුතුය ඉතා නුදුරු නො

ළංතැන සිටියයුතුය බොහෝවේලා නොසිටියයුතුය ඉතා ස්වල්ප වේලාවකින් හැරී නොයායුතුය එසේ සිටිනා භික්ෂුව විසින් භික්ෂාව දෙනුකැමැත්තාහු දේ හෝ නොදෙනු කැමැත්තාහුදේ හෝයි සැලකියයුතුය ඉදින් ඒ ගෙයි මනුෂ්‍යයෝ කටයුතු බහාතබද්ද හුන්තැනින් නැගිටිද්ද සැඳිහෝ අල්වද්ද භාජනහෝ අල්වද්ද එකල්හිභික්ෂාවදෙනු කැමත්තාහයි දැනසිටියයුතුයි භික්ෂාවදෙනුලබන කල්හි වමතින් සඟළසිවුරඔසවා දකුණතින් පාත්‍රය නැඹුරුකොට දෑතින් පාත්‍රය පිළිගෙණ භික්ෂාව පිළිගතයුත්තීය,, යි පෙණේ ‡ ඉතින් රතනපාලතැනේ පාළිමුත්තක විනයෙහි ආමේ පිණ්ඩචාරිකවතේ සතරපලකම සිටියයුතුයකියානිබෙන තැන්වලදී කයවිවෘතකොට හෝ නග්නව හෝ සිටියයුතුය කියාගණිමුද ? සුපිළිසන්ව අන්තර ඝරයට යායුතුය යනාදි සියළු විධිය භත්තාග්‍රවතෙහි කී ක්‍රමයෙන්ම මේ පිණ්ඩචාරිකවතෙහි දතයුතුයයි කිබැවින් සුපටිච්ඡන්නව සිටියයුතුයකියා ගණිමුද ? භික්ෂාවගන්නාකල්හි වමතින්සඟළසිවුර ඔසවා දකුණතින් පාත්‍රය නැඹුරුකරණවාය කී ක්‍රමය ඒකාංශව පොරවා මැදින් පටියක් බැඳ මඟුල්බුලත්දෙන්ට යන්නාක්මෙන් පාත්‍රයගෙණ යාමේදී කොයින්ලැබෙනඩාද? යනු විස්තරකටයුතුය රතනපාල මිත්‍රයා විනයනය නොදන විනය නයටගෙණ මෙබඳු වාදවලට එන බැවින් භයංකාර වූ මෙබඳු මහාප්‍රපංචවල වැටී කවළඩබලියාගණ හිඳීමට කාරණා පැමිණෙනබව දැක කනගාටුවෙමි. එහෙයින් මින්මතු තුන්වන සත

---

‡ පිණ්ඩචාරිකවත්තෙනපන පිණ්ඩචාරිකෙන භික්ඛුනාඉදානි
ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලංපටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවා
සෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණංකත්වා සඞ්ඝාටියො පාරුපිත්වාග
ණ්ඨිකං පටිමුඤ්චිත්වාධොවිත්වා පත්තංගහෙත්වාසාධුකං අතරමානෙන
ගාමො පවිසිතබ්බො—සුපටිච්ඡන්නෙන අන්තරඝරෙගන්තබ්බන්ති
ආදිසබ්බංභත්තග්ගවත්තෙ වුත්තනයෙනෙව ඉධාපිවෙදිතබ්බං—නිවෙ
සනං පවිසන්තෙනසල්ලක්ඛෙතබ්බං ඉමිනාපවිසිස්සාමි ඉමිනානික්ඛමි
ස්සාමීති, නාතිසහසා පවිසිතබ්බං නාතිදූරෙනාච්චාසන්නෙඨාතබ්බං
නාතිචිරංඨාතබ්බං නාතිලහුකං නිවත්තිතබ්බංඨිතෙන සල්ලක්ඛෙත
බ්බං භික්ඛංදාතුකාමාවා අදාතුකාමාවාති, සචෙකම්මංවානික්ඛිපති ආස
නාවා වුට්ඨාතිකටච්ඡුංවා පරාමසතිභාජනංවා පරාමසති දාතුකාමා
තිඨාතබ්බං භික්ඛායදීයමානායවාමෙන හත්ථෙනසඞ්ඝාටිං උච්චාරෙ
ත්වාදක්ඛිණෙනහත්ථෙනපත්තං පණාමෙත්වා උභොහිහත්ථෙහි පත්තං
පටිග්ගහෙත්වා භික්ඛාපටිග්ගහෙතබ්බා–( පා. මූ. වි. )

රචනසෙඛියා ශික්ෂාපදවලින්ම විනයානුලොමනයවශයෙන් ලැබෙ
න සුපටිච්ඡන්නව සිටිමන් තේරුම්ගතයුතුයි ඉතින් මිත්‍රයා විසින් අ
පට භාරදුන් යටකීහරිය ආපසු බාරගන්නාමෙන් දන්වමි.

සුපිළිසන්ව ඇතුළුගම්යායුතුය හිඳියයුතුය යන ශික්ෂාපදදෙකි
න්ව සිටියයුතුය යන අනුලොම ශික්ෂාවක් ලැබියයුතුබව මෙසේ පා
ලිමුත්තක විනයෙහි ආබව නොදත් මේ මිත්‍රයාට මේ ශාසනයෙහි
භික්ෂූන්ගේ සිවුරුවැලඳිමෙහිනියමය මෙසේමයි කෙසේ හැඳේදැයි සු
හින්විසින් සැලකියයුතුයි මෙසස්නෙහි දෙවුරවසා පෙරවීමක්නම්
නැතැයිකියා තුණුරුවන්කෙරෙහි සපථකොට අඥනයන් මේ අධර්ම
සමාදනයෙහි යොදවන රතනපාල මිත්‍රයාට මරණින්මතු කවර වි
නිශ්චයක්වේද ? රතනපාල මිත්‍රයා කොපමනකිව්ත් වෛතුල්‍යවාදී
හුකව්දකියා මේ වාදය අන්තිමෙදී තෙමේම ප්‍රකාශකරයි. වෛතු
ල්‍යවාදිය කියන්නේ බුඩානුබුඩ ශ්‍රාවකයන්ගේ නියම අදහස් පෙර
ළා විතඹමත බුඔධර්මයට එකතුකිරීමයි ශේද මේ කාලයෙහි කළ
නොහැකි වැඩකි මහාවිහාර වාසින්ගේ අරුත්බිණිමේමාගීය අන්
නොහැර ආචායයීබුඩඝොස මහාසාමිපාදයන් ඇතුළුවූ තදනුගත
ශාරිපුත්‍ර කාශ්‍යප වජිරබුඩි බුඔදත්ත වාගීශ්වරාදි විනයඅඨකථාචා
යයී ටිකාචායයීවරයන් විසින් ලියනලද විනයඅඨකථා විනයටිකා වි
නයසංග්‍රහ ප්‍රකරණාදිය අනුනවඇතිබැවින් එ පොතපත හා සංස
න්දනය නොවන්නාවූ මත වෛතුල්‍යයන්ගේ මතබව සුප්‍රකටයි.
එබැවින් යුෂ්මත්හු විසින් අපට වෛතුල්‍යවාදිය කිපමණින්වත් අප
විසින් යුෂ්මතුන්ට වෛතුල්‍යවාදිය කිපමණින්වත් දෙපක්ෂයම
වෛතුල්‍යවාදීහු නොවෙති. අප මිත්‍රයා මෙපමණ වෙහෙස දරන්නේ
මේ දෙවුරවසා පොරවන වෛතුල්‍යමතය ශාසනයෙන් පහකොට
පිරිසිදුකරදැම්මට බව කියාතිබෙන නුමුත් ලංකාවේ අප මිත්‍රයාගේ
අනුශාසනා පිළිගන්නා නූගත් මුග්ධයන් අතලොස්සක් පමණ එක
උරයවසා පොරවන පමනමුත් බුඩාගමේ කිසිපණතක් නොදත් අ
ඥන ගොනුන්රැලක් සැබැයි පිළිගන්නා නුමුත් ලංකාවේ මහත්
කොටසක් හා සියම් බුරුම රක්ඛඟ කාම්බෝජ රාමඤ්ඤාදි අනෙක
දෙශාන්තරවල වසන ලක්ෂගණන් භික්ෂූන්ගේ දෙවුරවසා පෙරවීම
වළක්වන්ට අප මිත්‍රයාට නොහැකිවේ සියම්රජතුමාගේ අණසක ප
වත්නා ප්‍රදෙශයක මිත්‍රයා වෙසේනම් මිථ්‍යාවාදිවූ අප මිත්‍රයාගේ හි
ස්සිදදැමීමට මේ මිථ්‍යාග්‍රහණය ප්‍රමාණවේ. මිලඟට රතනපාල තැන
විසින් "සුපටිච්ඡන්නො" යනාදී ශික්ෂාපද පාඨදක්වා එහි සම්පූර්ණ
එහුඩු අදහස මෙසේය කියා භාවය දක්වමින් සුපිළිසන්ව ශෙවත්‍ම

නාකොට හැඳපෙරව ඇතුළුගමෙහි යන්නෙමියි භික්මියයුතුය ;, යි
කියානිබේ මේ ශික්ෂාපද දෙකේ අර්ථ වර්ණනා කළාවූ කවර අටුවා
ටීකා ප්‍රකරණයක මනාකොට හැදීමක් කියා තිබේදැයි රතනපාලට
පෙන්වන්ට පුළුවන්ද ? සුපටිච්ඡන්න ශික්ෂාපදයන්ගේ අර්ථවර්ණ
නාව අටුවාදෙකෙහිද ටීකා සතරෙහිද ප්‍රකරණ කීපයෙහිද අනෙක ප්‍ර
කාරයෙන් විස්තරකරණතැන්වලදී කිසි ආචාර්යවරයෙකු විසින්
නොකියනලද මනාකොට හැඳීමක් මේ ශික්ෂාපදයට ඈඳගත් රත
නපාල සියුම් විනයනය දැනගත්තෙක මේ ශික්ෂාවන්ගේ විනිශ්චය
දීමට පෝසතෙකැයි කෙසේ ඒත්තුගනිම්ද ? එබැවින් රතනපාල
ගේ හිතුබුඩියේ තේරුම්වලින් ජයලබාගන්ට ඉඩලැබේයයි නොසි
තුවමැනවි." "මේ ශික්ෂාපද දෙකින් පණවනලද්දේ සුපටිච්ඡන්න පා
රුපනනම් පෙරවීමකැයි මෙකල සමහරු වැරදිලා සිතාකියා සිටිති
තවත් සමහරු මේ ශික්ෂාදෙකම සුපටිච්ඡන්න ශික්ෂාගෙයින් සුපටි
ච්ඡන්න පාරුපනත් දෙකකැයි සලකත් මේදෙපක්ෂයම මතිභ්‍රෂ්ට මි
ථ්‍යාවාදීන් බව ශික්ෂාපණත්වල අදහස්තේරුම්ගත් සියුම්නැනවත්තු
න්ට මනාකොටම අවබෝධවේ" යනාදීන් දක්වනයාම්ගැල්ල පුලා
පයකි මේ ශික්ෂාපදදෙකින් වදාළේ ඇතුළුගම යාම් ඒම් ඉඳිම් සිටිම්
කරණප්‍රස්ථාවලදී සිවුර පෙරවියයුතු ක්‍රමයබව සියළු විනයධරයන්
විසින්ම තේරුම්ගෙනතිබීම සත්‍යයකි. රතනපාලතැනටත් එසේ දැ
නගණුකැමතිනම් සමන්තපාසාදිකා විනයඅටුවාවේ මේ ශික්ෂාව අ
ර්ථවර්ණනා කරන්ට පටන්ගෙණ "සුපටිච්ඡන්නෙනාතිහ ඊසං පා
රුතෙන" යනාදීන් සුපිළිසන් පෙරවීමයයි අර්ථක්‍රමය දැනගතයුතු
යි සුපටිච්ඡන්නකියා වදාළ වචනය "සුපටිච්ඡන්න පාරුත" යයි අ
ටුවාචාරීන් විසින් අර්ථක්‍රමයට ඉහලින් තේරුමක් රතනපාලට තී
බේද ? එසේ වී නමුත් සුපටිච්ඡන්න පාරුපන දෙකක් ඇතැයි කි
යා තේරුම්ගත් කෙනෙක් අප මිත්‍රයාහැර මේ ලෝකේ වෙන නැත්
තේමැයි මුලින්කී ක්‍රමයට තේරුම්ගත්අය මතිභ්‍රෂ්ටයෝවෙත්නම්
මහා අර්ථකථාචාර්ය මහාකාශ්‍යපාදී මහරහතුන්ගේ පටන් මෑතවිනු
( අප මිත්‍රයා පමණක් හැර ) සියළු ආචාර්යවරයෝම මතිභ්‍රෂ්ටයෝ
වෙත් මැයි රතනපාලතැන ශික්ෂාපණත්වල නියම අදහස්දත් සියු
ම් නැනවතෙක් මෙතුන් සියළු විනය ග්‍රන්ථ කතෘවරයන් ඇතුළුවූ
මුළුලොව වසන සියළු ආචාර්යවරයන් මතිභ්‍රෂ්ටයන්මෙතුන් අභවා
ළුමටවඩා හිරිඹහප් නැතිකමක් මේ ලෝකේ ඇද්ද ? අත්ත වත්මා
න යන කාලවලයෙහිම මේ ශික්ෂාපදය ඔහොම තේරුගපනෙක් මුළු
පොළෝතෙළෙහි ( රතනපාලහැර ) වෙනන් සිටියා ඇද්දැයි පරීක්ෂා
කර බලන්ට නරකද ?

මිලඟට දක්වා තිබෙන ව්‍යාකරණ ක්‍රමවලින් මේ ශික්ෂාපද දෙකේ භාවය තේරුම් ගැනීමට කිසි උපකාරයක් නොලැබේ "ඇතුළ්ගමෙහි යාමත් හිඳීමත් යන ඉරියව් ප්‍රභෙදයහැර ඇඳුම් පෙරවුම්ආදි අනික් කිසිම වෙනසක් එහි නොලැබේ අසමානවූ යාම්හිඳීම් ඉරියව්දෙකින් දෙයාකාර පෙරවුම් පණත්දෙකක් ලැබේයයි සැලකීම අහෙතුක ළදරුකල්පනාවකි" යනපිඨ පමණක් විස්තරකර ගතයුතුව තිබේ අපමිත්‍රයාගේ අදහස යාමඉඳිමමිස සිවුරුපෙරවීම විහාරේළන්සැටිමැයි කියාද ? ඒ ප්‍රස්ථාවේදි සිටින්ටවූනොත් කෙසේ සිටින්නේද ? ඇතුළුගමට පෙරවීමේ වෙනසක් නැතැයිකියා අපමිත්‍රයා ඔප්පුකරන්නෙහිද ? එසේවිනම් ව්‍යාකරණ ලක්ෂණ අහඹුතබා අර්ථකථාටීකාවල අනෙකප්‍රකාරයෙන් දක්වා තිබෙන මේශික්ෂාපදයන්ගේ අර්ථවර්ණනාවකින් විහාරේ හිඳීමටත් ඇතුළුගමටත් පෙරවීම එකාකාර බව ඔප්පුදියයුතුයි.

"අබ්භාතිතාච යෙබුද්ධා වත්තමානා අනාගතා,
ධජෙනානෙන සුජ්ඣන්ති තස්මා එතෙන මස්සියා"

යනඅපදාන පාලිගාථාවෙන් අතීතානාගත වර්තමානවූ සියළු බුදුවරයෝම මේ අරහත්ධජනම්වූ සිවුර කාරණකොටගෙණ කෙලෙස් මලයෙන් පිරිසිඳුවන්නා හයි පෙණෙන බැවින් මේසිවුර ශාසනයේ පළමුවන අඟයබවපෙණේ එහෙයින් සිවුරපෙරවීම ටිකක් එහා මෙහා වුනත් එයින් ශාසනහානියට හේතුවක්නොවේයයි බෞද්ධයන් විසින් නොසිතියයුතුවේ බුදුන්විසින්පණවා වදාල සුපටිච්ඡන්න ශික්ෂාපදයෙන් වැසියයුතු ශරිරාඞ්ගයක් නොවැසියයුතුයයි හටගත් මේ අධර්මවාදය මිලඟශතවර්ෂයේදි උභයශරීරයම නොවැසියයුතුයයි යනවාදය හටගැණිමට කාරණාවේ මෙසේක්‍රමයෙන්ගොස් බොටුවේ කහනූලක්දුරීමෙන් ශ්‍රමණලිඟය සම්පූර්ණ වෙසීයනමතය ලොව ඇතිවීමටහේතුවේ සියළුමශාසන ප්‍රතිපත්තිපිරිහීමට යන්නේ මේනියායෙනි එහෙයින් සර්වඥශාසනය නිර්මලව පන්දහස පවත්වාගැණීමට සිතැතිසකල බෞද්ධයන් විසින් කපිලතෙරුන්වැනිවූ මේරතනපාලතැනගේ අධර්මලබ්ධිය දුරගසාලිමට උත්සාහ වැඩියයුතුයි දැනටමුළුලෝකේ බුද්ධාගමපවත්නාරටවල වසනසියළු ධර්මවිනය ධරයෝම ඇතුළුගමට දෙවුරවසායයුතුය යනමතඇත්තෝයි මේසියළුපොත්පතුත් ඒපක්ෂයෙහිය ඒකාංශපක්ෂයට ඇත්තේ එකමරතනපාලතැනපමණකි ඔහුගේමතය සපිරකරගැණීමට ඔහුවිසින් දක්වනලද සාධකපාඨත් ඔහුගේ අතානොමතයෙන් වරදවා තුහුරුඅතට තේ

රැම්කරගන්නා දුශීලමතවේ එබැවින් රතනපාලතැනගේ දුශීතය
බිඳහෙලීම බාරදූරවැඩක්නොවේ රතනපාලපක්ෂය දැනට කියාසිටි
න්නේ මේඋභයාංශය වසා පෙරවීම වෛතුල්‍යයන්ගේ පෙරවීමක්බ
වයි එහෙයින් අමරපුර රාමඤ්ඤාදි සියළු සමාගම්වල වසන ධර්මවින
යධරබහුශ්‍රැත ස්ථවිරයන්වහන්සේලා විසින් මේ උපන්ශාසනාර්බු
දය නැතිකරදැමීමට ශාසනාලය පෙරටුකොට උත්සාහවැඩියයුතුයි
දෙවුරවැසීම වෛතුල්‍යපෙරවීමනම් අමරපුර රාමඤ්ඤ සමාගම් වෛ
තුල්‍යයන්ගෙන් බෝවූසමාගම් ද්‍රෝහෝයි බෞද්ධයන්ටමහත් සැකය
ක් උපදි ඒමතය නිරාකූලකිරීම ඒසමාගම්වල ප්‍රධානස්ථවිරයන්ගේ
අවශ්‍යයුතුකමක්වේ, හික්කඩුවේ නායක ස්ථවිරපාදයන් වහන්සේ
ගෙන් ධර්මාලෝක ස්ථවිරයන් විසින් කැළණියේදි විචාළ ප්‍රශ්නයන්
ට “කියනු නොහැකියි,, යනාදීඋත්තරදී පැනගියාය යන රතනපාල
ගේකීම සැබෑද යනු දැනගැනීමට 1893 ක්වූ ඔක්තෝම්බ්‍රමස නිකුත්
කරණලද මේවාදය ප්‍රසිද්ධවූ සඳරැස පත්‍රය සොයාබැළුකල රතනපා
ල හාත්පසින් මුසාවාදියෙක්බව පෙනීගියේය ශික්ෂාපදයක් නෝරා
බේරා ගැනීම සඳහා මෙතරම් බරපතල බොරු සහ අනුන්ට නින්දා
අපහසත් ප්‍රසිද්ධකිරීම රතනපාලට රුචිවෙතත් පඬිහයන්ට රුචි
නොවේ. පසුගිය මගේලියවිල්ලක සෙඛියාවමහවගේයයි ප්‍රමාදයෙන්
වැටිතිබේ එය පච්ඡිපොතේ බව සැලකියයුතු.

පසුගියමාර්තු මස 26 වෙනිදින නිකුත්කළ ශ්‍රීමත් පත්‍රයෙහි යු.
රතනපාලගේ ලියවිල්ලට පිළිතුරුයි.

“සුපටිච්ඡන්න පාරුපනය යනනාමය පවා අභූතයක්බව නො
හැඟිමෙන් එසා ඔළාරික විපරිත මතයක්දරන්ට සිදුවි තිබේ පින්ව
න්නි සුපටිච්ඡන්න පාරුපනයයනනාම මාත්‍රයකුත් මේශාසනයෙහි
ව්‍යවහාරව නැතිබව අපමිත්‍රයන්ට දැනුන්ඇද්ද නැත්මය,, යනාදීන්
තිරතුණක් පමණ ලියාතිබෙන්නේ සුපටිච්ඡන්න පාරුපනයක් මේ
ශාසනයෙහිනැතිබව ඔප්පුදීමටයි අපමිත්‍රයාගේ ඊර්ෂ්‍යාපටලය කැපීමට
සුදුසු සධර්මනමැති බෙහෙත් අඳුන්ලා ඇස්දෙක පාදගෙණ පාළ්‍යර්
කථාටීකාදිය එකිනෙකට සංසන්දනයකොට බැළුවහොත් “සුපටිච්ඡ
න්න” යන බුද්ධවචනය පෙරවීම සම්බන්ධව වදාල වචනයක්බවත්
ඒවචනයෙන් වාච්‍යවන්නාවූ අර්ථයපෙරවීමනම් ඊට “සුපටිච්ඡන්න
පාරුපන” යනනාමය අතිගයින් යෝග්‍යබවත් ඇස්ඇත්තන්ට පෙ
ණේ, “සුපටිච්ඡන්නො අන්තරඝරෙගමිස්සාමි” යනමෙහි “සුපටි
ච්ඡන්නොහුත්වා” යනක්‍රියා සම්බන්ධයවේ නැවතකෙසේ සුපටිච්ඡන්
නවන්නේදැයි ප්‍රශ්නකටයුතුවේ මීටපරිහාර “නසීසංපාරුතො” ය

නාදියෙහි මෙසේ ඒ ඒ පදයන්ගේ චෝදනාපරිහාරවශයෙන් අවිපරී
ක්ෂාකරණකල "සුප්පටිච්ඡන්න" යනපදයේ තේරුම මනාකොට අග
ප්‍රත්‍යග වසාපෙරවීම බවහැඟේ විනයාර්ථමඤ්ජුසාවෙහි "සුප්පටිච්ඡන්
නොති ජත්තුම්පි උරම්පි අවිවරිත්වා පටිච්ඡාදෙ තබ්බට්ඨානෙ, පරි
ච්ඡාදනෙන පටිච්ඡන්නො නසීසංපාරුතො" යනාදින්ද කාංඛාවිත
රණියෙහි "සුප්පටිච්ඡන්නොති සුට්ඨුපටිච්ඡන්නො ගණ්ඨිකංපටිමුඤ්
චිත්වා අනුවාත නෙන නාභිං පටිච්ඡාදෙත්වා" යනුවෙන්හා එහිම "ග
ලවාටකතොපට්ඨාය සීසංමණිබන්ධ තොපට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංස
තො පට්ඨායපාදෙ විවරිත්වා සෙසංඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡන්
නොනාම හොති" යනුවෙන්ද සමන්තපාසාදිකාවිනය අටුවාවෙහි
"සුපටිච්ඡන්නෙනාති නසීසං පාරුතෙන" යනාදීන්ද මෙහි නොකී
සියළුවිනය ටීකාසංග්‍රහාදියෙහිද සුපටිච්ඡන්න ශබ්දයෙන් යාමක්
හෝ හිඳීමක් හෝ නොකියා පෙරවීම පිළිබඳ විශෙෂ විධානයන්ම
කීබැවින් සුපටිච්ඡන්න පාරුපනයයි කියනුම්ස මේ නාමය කිසිවෙකු
ගේ අනුනනොමතියකින් ගොදගත් එකක් නොවනබව දැනගතයු
තුයි. රතනපාලතැන සුපටිච්ඡන්න ගමන නිසිදනදෙකයයි කොප
මණ කැමොරගසාකිවක් පොතපත තිබියදී ඒ මතය පිළිගතනො
හැකිවෙයි. විහාරයටත් ගමටත් පෙරවීමේ වෙනසක් නැත්නම් සුප
ටිච්ඡන්න ශික්ෂාපදදෙක හා ඊට කරතිබෙන්නාවූ අර්ථවර්ණනා සි
යල්ලත් ව්‍යර්ථවී මහණකලද පෙරවූසැටියට අතුළුගම යාම්හිඳීම් ක
ටයුතුනම් පරිමණ්ඩල ශික්ෂාපදදෙක පමණක් සෑහේ. වැසියයුතු
අවයව ඒ ශික්ෂාදෙකින්ම සම්පූර්ණවේනම් සුපටිච්ඡන්න ශික්ෂාපද
දෙකක් පණවන්නටවත් අටුවාටීකාචාර්යවරු විසින් විශෙෂ ලක්ෂ
ණයකින් ඒ ශික්ෂාපදවල අර්ථදක්වන්නටවත් ඕනෑනැති බව ගම්
දරුවන්ටපවා තේරුම් යන කාරණයකි සුපටිච්ඡන්න ශබ්දය "සුනි
වත්ථ සුපාරුත" ශබ්දයන්ගේ පර්යාය නාමයකි සුනිවත්ථ සුපාරුත
ශබ්දයන්ගෙන් වැසියයුතුතැන් වසා කරණ යහපත් ඇඳුම් පෙරවු
ම් වාච්‍යවන්නාසේම සුපටිච්ඡන්න ශබ්දයෙනුත් වැසියයුතුතැන් වසා
කරණ යහපත් පෙරවීම මිස අනිකක් වාච්‍යනොවනබව සුපටිච්
ඡන්න ශබ්දයට අර්ථකියාතිබෙන සියළු අර්ථවර්ණනාවලින් පෙනේ.
එසේ තිබියදී රතනපාලතැන කීපලියට සුපටිච්ඡන්න ගමන නිසී ද
නයක් තේරුම්ගන්නේ කවර අර්ථවර්ණනාවකින්දැයි. නොහැඟේ.
මිලඟට "1 වෙනුව පරිමණ්ඩල නිවාසනයෙන් සිවුරුඇඳිමෙවන ස
ම්පූර්ණකොට 2 ව එකාංශ පරිමණ්ඩල පාරුපනයෙන් පෙරවීමෙව
න සම්පූර්ණකොට 3 ව පිරිවඩුළු ඇඳුම් හා පිරිමඬුළු එකාංශ පෙර

ඹුමද යන දෙකින් වැසියයුතුතැන් හොහැර මනාකොට හැඳපෙරව ඇතුළුගමෙහි යායුතුයයිද, 4 වෙ එසේම මනාකොට හැඳපෙරව ඇතුළුගමෙහි හිඳියයුතුයයිද පණවා වදාළේය යනු මේ සම්බන්ධ ශික්ෂාපද සතරේම සංක්ෂේපයෙන් සම්පූර්ණ අදහසවේ" යනු රතනපාලතැනගේ අන්තිම විනිශ්චයයයි මේ අදහස සැබෑවීනම් මෙසේවෙන්ට බැරි නැත. එතකුදුළුවත් 1-2 වන ශික්ෂාපදදෙකින් වැසියයුතුතැන්කිසිය ඉවරකොට වදළානම් 3-4 වන ශික්ෂාපදවලින් අසවල් අවයව නොවැසියයුතුය අසවල් අවයව වැසියයුතුයයි විස්තර නොකටයුතුයි. එපමණක්නොව 1-2 ශික්ෂාපදදෙකින් වැසියයුතුතැන් දක්වා හමාරනම් නැවත සුපටිච්ඡන්න ශික්ෂාපදදෙකක් පැණවීමම ව්‍යර්ථයි. විහාරයෙහි හිඳිනාකල්හි එකාංශ පාරුපනයෙන් වෙන්වනුන්නා තැනක් නොපෙණේ. මැහසපටන් සමහරු සිවුරු හරහාඇඳගෙණද අඳනයපිටින්ද කෙත්වත්ආදියටගොස් සිහැවීම් වීබෙදටීම් ආදිය කරණතැන්වලදි එකාංශපාරුපනයපවා නැතිබව පෙණේ එබඳුඅයටනම් නැවත සුපටිච්ඡන්න පාරුපන ශික්ෂාපදය ප්‍රයොජනවාමිය මගණකලසැටියට පන්සැලේ උන්සැටියට කිසිවෙනසක් නැතිව ඇතුළුගම්යායුතුනම් හිඳියයුතුනම් මේ ශික්ෂාපදදෙක එකාන්තයෙන්ම නිෂ්ඵලයි. පරිමණ්ඩල ශික්ෂාපදදෙකින් පිරිමඩුළුකිරිමත් පෙරවීමත් ඉවරනම් සුපටිච්ඡන්න ශික්ෂාපද විවරණයේදී යට ශික්ෂාපදදෙකින් කී අවයව මනාකොට වසා යායුතුයයි හිඳියයුතුයයි නොකියා "සුපටිච්ඡන්නො තිත සීසං පාරුතො අථබො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාතන්තෙන ගිවංපටිච්ඡාදෙත්වා" යනාදින් අමුතු පෙරවීමක් අමුතු වැසීමක් සියළුඅර්ථකථාචාර්යයන් විසින් කුමක් හෙයින් වර්ණනාකරණලද්දේද ? අප මිත්‍රයාගේ මතය ස්ථිරකිරීමට විරුධව තිබෙන ප්‍රධානශාක්ෂිනම්. තුන්වන සතරවන ශික්ෂාපදදෙකේ වැසියයුතු අවයව නියමකිරිමයි එසේ නොකළානම් මිත්‍රයාගේ කිමපරිද්දෙන් සුපටිච්ඡන්න ගමන නිසිදනයයි කියා ඒත්තුගන්ට පුළුවන්ව තුබුනේය.

විහාරයෙහි සිවියදී මහණකරණද වැඳූ අවයව වසාගණම සිටියානම් ඇතුළුගමට සුපටිච්ඡන්නත්වයක් පැණවීමෙන් ඇති විශෙෂ ප්‍රයොජනය කවරේදැයි නොහැගේ විහාරයෙහි අපටිච්ඡන්නත්වයක් ඇතිබැවින් ඇතුළුගමට සුපටිච්ඡන්නත්වයක් වදළබව ප්‍රාකෘත දැන නොගත්තත් තේරුම්ගතහැකිවේ. අප මිත්‍රයා විසින් දක්වූ සම්පූර්ණතාවයට වඩා පළමුවන දෙවන ශික්ෂාපද දෙකෙන් හඳනා පොරෝනා සියළු සිවුරු කොන් උස්පහත් නොවෙන්නට සමකිරීමය් තුන්වන සතරවන ශික්ෂාපදදෙකෙන් ඇතුළුගම යාම් හිඳිම් සිටිම්

වලදී වැසියයුතු නොවැසියයුතු අවයවත් දෙශනාකළේයයි සිතට
ගත්තොත් නරකද ? සැබවින්ම අගතියට දුසනොවී පාළිඅර්ථකථා
සමකොට බලත්හොත් මේ අර්ථය මනාකොට වැටහේ බුදුන් පිරිනි
වන්පා 2440 ක් පමණ ගතවියන්නාවූ මේ දිඝීකාලයතුල මේ ශික්ෂා
පද සතර මෙසේ තේරුම්කළ කෙනෙක් රතනපාලතැන හැර ත
වත් ලොවසිටියා ඇද්දැයි පරීක්ෂාකටයුතුයි. අප විසින් දක්වනලද
අර්ථකථානුගතවූ සුපිළිසත් පෙරවීමට බාලජන සම්මොහවූ බොරු
දෙස් ආරොපණයකොට ඒ අර්ථබිඳීම අටුවාචාරින්වහන්සේලාගේ
මතයක් නොවේයයි කියන අප මිත්‍රයා විසින් "ගලවාට සතොපට්
ඨාය" යනාදීන් දක්වූ පාඨයේ අර්ථනොලිඑක බෙදයකි සිද්ධාර්ථකු
මාරයාගේ පැවිදිවීමට දෙවියන් විසින් දක්වූ ශ්‍රමණරූපය එකළර
යක් වසා පොරවා දක්වූබව රතනපාලතැන කියන නමුත් කිසි අ
ටුවාටිකා ප්‍රකරණයක එසේ කියා නැත්තේය එක උරවසා පෙරවා
දක්වූවත් දෙවියන්ගේ දක්වීමක් අපට ඕනෑනොකෙරේ බුද්ධප්‍රඥප්
තියක් වෙනම ඇතනාවූ මේ කාරණයත් ගැණ දෙවියන්ගේ හෝ
වෙන යමෙකුගේ හෝ ආචාරමාත්‍රයක් පඬිතයෝ නොසලකති ආග
ම නියම දූන ගත්තරම මෙසින්ම ඔප්පුවේ ශාරිපුත්‍ර සථවිරයන්ටපවා
අවිෂයවූ විනය ප්‍රඥප්තියක් දෙවියන්ට පණවන්ට පුළුවන් වේද ?
එහෙයින් දෙවියන් විසින් මවාපානාලද ශ්‍රමණරූපය බුදුන්ගේ ප්‍රඥ
ප්තියට විරුඬවීනම් ඒ රූප ලක්ෂණය අපට ඕනෑ නැත්තේයි.

" ලංකාවේ මෑතකපටන් ස්වල්පදෙනෙක් හැර සියම් බුරුම කා
ම්බෝජ ලංකා යන රටවල පමණක් නොව නිමිල බුඩශාසනය පි
හිටි සියළු රටවලම පරිමඬල නිවාසනයෙන් හා පරිමඬල එකාංශ
පාරුපනයෙන්ද—බුඩකාලයේ පටන්ම මේ දක්වාත් පැවත එන්නේ
ය" යන චෛතිය බොරුව පත්‍රයක ලී මොහු පණපිටින් අවීචියට ඇද
ගත නොගිය එක පුදුමයකි මොහු මෙසේ කියතත් මේ කාරණය ඔ
ප්පුදීමට එකම ශාක්ෂියකුත් නැත්තේය පුළුවන්නම් පසුගිය සඳ
රුසේ ලියවිල්ලේමෙන් ශාක්ෂි පෙන්වාදෙනුමැනවි සියම් බුරුමාදිර
ටවල ගිය අය විසින් මොහුගේ හිසට කෙළගැසියයුතුයි සියම් රජතු
මාගේ කියමන සැබෑද මොහුගේ කියමන සැබෑදැයි පරීක්ෂාකරබලමු
හපනා පුළුවන්නම් පුරාතන චෛත්‍යයකින්වත් ආගම පොතපති
න්වත් යම් රටක ශාසනවංශයකින්වත් ඇතුළුගමට එකළර වසා
පෙරවූතැනක් නොපෙන්නුවේ මන්ද ? සමහර රටවල සපුන් පිරි
හෙන්ට ගියාටපසු සමහරු උභයාංශ පෙරවීම පුරුදුකලායයි යන
මොවුන්ගේ කීම සැබෑදැයි සොයමු නොටගමුකාලේදී ලංකාවෙන්

ගෙනගිය මහාවිහාර පරම්පරාව එදපටන් අදවනතුරු බුරුම සියම් කාම්බෝජාදී රටවල ආගම උගත් ශ්‍රධාවන්තරජුන්ගේ සහ සිල්වත් ත්‍රිපිටකධාරි මහතෙරුන්ගේද ආරක්ෂාව යටතේ පවත්වාගෙනඑයි ලංකාවේ ප්‍රභිකාලේ පටන් බුධාගම පිරිහීගනගොස් කසාවස්ත්‍රය ඇඳගන සියළු නොපනත්කම් කරණ අශ්‍රමණරැළ සිටින්නේ ලංකාවේ පමණකි අනික්වාහැර සිවුරු සම්බන්ධ පණත්වලින්ම නානා කඩවරක් හැඳ ඊපිට අඳනය වරක් හැඳිමද තනිපටසිවර වරක්හැඳ ඊපිට දෙපට සිවර එකාංශව වරක් පෙරවීමද වැසියයුතුතැන් නොවැසීමද ගණ්ඨිකපාශනො ඇමීනිමද සඟලසිවුරයටකොට වාඩිවීමද යනමේ කාරණා පසම ඇතම් ශ්‍රමණයින්ගේ අතර පවත්නා බැවින් සිවුරනිසාම ඇවත් පසකට පැමිණ වාසයට පටන්ගෙන සියක්අවුරුද්දට ලංවිය හඳනා පොරෝනා සිවුරු එකට නාල්ලා ගිහින් මෙන් එකපිට එක ඇඳීම පෙරවීම ආපත්තිකරවේ සිවුරු පිළිබඳ ඇවැත්පසකට නිතර පැමිණෙන රතනපාලලා යහපත් සංඝයාට නිගාකිරීම කටකබරවසාගන පයකබර පෙන්නූ මිනිහාට සමානනොවේද ? මේ ලියුමේ අගහරියේ විචාරාතිබෙන ප්‍රශ්නවලින් කුමක් විචාළේදැයි මටනොහැගේ රතනපාලතැනලා මේ වාදයකළ හැම තැන්හිදීම මේගැණ කිසිසේත් සම්බන්ධ නැත්තාවූ බොරු ප්‍රශ්න අතරතුරගෙලා “ඔන්න අපේ ප්‍රශ්නවලට උත්තරනෑ” කියා අඥානයන් අතරට පූජ්‍යවහුරේදමා විසිරයෙති; එබඳු මිථ්‍යාවාදකාර එක්තරා කපටයෙක් මෑතභාගයෙහි පරලොවගිය නමුත් රතනපාලතැන ඒ පාඩුව පිරිමසාලීමට වසවර්තිමාරයා විසින් මෙලොවට පහළ කෙළේයයි හැගේ ඒකපටිකම්වලින් ජයලබාගන්නට මේවර නොසිතුව මැනවි අපට මෙහි ඕනැකරන්නේ සුපටිවජ්ජන්න ශික්ෂාපදදෙකත් එහි අර්ථවණ්ණනාවත් පමණයි එබැවින් ශික්ෂාපදයන්ගේ භාවාර්ථ දක්වනවාමිස කමනැති බොරුවලින් මෝඩයන් රැවටීමට උත්සාහනොකොටයුතුයි. යම් ප්‍රශ්නයක් විචාරන්නෙහිනම් අසමල්කාරණයයි ව්‍යාකූලනොකොට විචාලයුතුයි මේ වාදය පිළිබඳ ප්‍රශ්නවිචාරීමට රතනපාලට උපදෙස් ලබාගන්නාපිණිස මාවිසින් විචාරණූලබන ප්‍රශ්නයන්ට පෙළ අටුවාටීකාතුණට සමවෙන්නට පුළුවන්නම් උත්තරදියයුතුයි විනයපොත් මෙපමණ සුලභවතිබියදී රතනපාලගේ ප්‍රාකෘත උත්තර පිළිගැනීමට බෞද්ධයෝ කිසිසේත් රුචි නොවෙති එහෙයින් තේරුම්ගතහැකි පරිද්දෙන් පොතපතින්ම උත්තර දෙනුමැනවි.

(මගේ ප්‍රශ්න මතුපත්‍රයේ බලනු.)

පසුගියපත්‍රයෙහි, පූ. රතනපාලගෙන් විචාරන්නෙමි.' මා විසින් පිළිනකරතුබු ප්‍රශ්න ස්වල්පය අසනුලැබේ. ඊට අත්තනොමතිකා උත්තර නොදී පෙල අටුවාටීකාදියෙන්ම උත්තර දියයුතු.

1 පරිමණ්ඩල ශික්ෂාපදදෙකින් හඳනා පොරෝනා සිවුරුවල කොන් උස්පහත් නොවෙන්නට කතුරකින් කැපූ පියුමක්සේ, වට කොට හඳින්නට පොරෝනට නියමකළාමිස වැසියයුතු අවයවයන්ගේ නියමයක්කළාද ? ඒදෙකින් හඳනා පොරෝනා විධිකියා හමාරකළානම් ඊට පරිමඬල ශික්ෂායයි පොත්පත්වල ව්‍යවහාරකරන්නේ මන්ද ?

2 පරිමඬල ශික්ෂාපදදෙකින් හඳනා පොරෝනා සියළු විධිකියා හමාරකළානම් නැවත සුපටිච්ඡන්න ශික්ෂාදෙකක් පණවන්ටත් එහි අටුවාවේ මේ මේ අවයව වසන්ටයයි නියමකරන්ටත් ඇතිහෙතුව කුමක්ද ?

3 මුලශික්ෂාපදදෙකින් දැක්වූ අවයව මනාකොට වැසියයුතුබව 3—4 වෙනි ශික්ෂාපදයන්ගේ අදහසයයි කියාතිබෙන්නේ කවරපොතකද ; මුලදෙකින් වසන්ටකීතැන්ම දෙවෙනි දෙකෙන් මනාකොට වසන්නේ කොහොමද, එසේවීනම් මුල්දෙක නිෂ්ප්‍රයොජන නොවේද, රතනපාලගේ අදහස මැනවිනම් "සුපටිච්ඡන්නොති නසීසං පාරුතො" යනාදීන් අර්ථවර්ණනා නොකොට යටශික්ෂාපදවලින් කී අවයව මනාකොට වසායයි අර්ථකියයුතු නොවේද ? විනයේ එක කාරණයක් ගැණ පණවන ශික්ෂාපදදෙකට ප්‍රථම ප්‍රඥප්ති අනුප්‍රඥප්තියයි කරණනියමයට මේ ශික්ෂාපද යුගලදෙක අයිතිද ?

4 "අනුවාතන්තෙන ගිවං පටිච්ඡා දෙන්ති" යන ක්‍රමයට ඒකාංශපෙරවීමෙන් ග්‍රිවයේ කිසිතැනක් නුවා කෙළවරින්වැසේද ? සියමේ මහානිකායේ පුරාණසිවුරුවල ගිවෙය්‍යකනම්වූනුවා ප්‍රදේශයේ කබායක කරපියන බොත්තම් දෙකක්මෙන් ගණ්ඨිකපාස ඇති බවත් එබඳු පුරාණ පටසිවුරු උඩපාතදෙරට පුරාණ විහාරවල තිබෙනබවත් දුටුවේ නැද්ද? ඇරත් ඒකාංශපෙරවීමට නුවාව කිසිසේත් ග්‍රිවයට ලංවේද ? ජංඝෙය්‍ය ගීවෙය්‍ය බාහන්ත යන නම් ඇති ආගන්තුක පත්‍රනුවාවට ඇල්ලීම තනිපට සිවුරුවලත් තිබේද ?

6 "සංඝාටිපච්ඡිමත්තෙන" යනාදි ගාථාවේ අගපදයේ "නථා ඒකංසිකස්සච" යනපදයෙන් දැක්වූ ඒකංසිකායත් සඟළසිවුරත් යන දෙකින්ම ඒකාංශ කටයුතුනම් ඒකංසික යන නම ලැබෙන්නේ කොයි සිවුරටද ?

6 මයි 1883 දි පාරුපනවාදය උපදින්නට මත්තෙන් සියාම් සමාගමේ එකාංශව පොරවා ගම්වැදුනු භික්‍ෂූන්ගේ සිවුරුවල ගණ්ඨික පාශතුබුනාඇත ගණ්ඨික පාශඇමිනීමකළාඇත යන කාරණාදෙක රතනපාලට ඔප්පුදියහැකිද ?

7 මේ වාදයට මත්තෙන් ධම්මාලොක තෙරුන්නාන්සේගේ ගෝලභික්‍ෂු සාමණේරවරු අතුළුවූ සියම්සමාගමේ සියළු භික්‍ෂූහු පිණ්ඩපාතගමනට දෙළුරවසා පෙරෙව්වේනැත යනබව ඒ ගම්වාසීන්ගේ සභාවකදී ඔප්පුදියහැකිද ? ධම්මාලොක තෙරුන්ගේ ආචාර්‍ය්‍යවූ අඹුපේ තෙරුන්නාන්සේ දිවිහිමියෙන් දෙළුරවසා පොරවා පිඩපාතකළේ නැතකියා ඔප්පුදියහැකිද ? දෙළුරවසා පෙරවීම වරදනම් අදදක්වාත් එකළුර වසන කොටස්වල පිඩපාත ගමනට පමණක් දෙළුර වසන්නේ මන්ද ?

8 කැලනියේ මේ වාදයකර ඇවිත් ධම්මාලොක තෙරුන්නාන්සේ තමන්ගේ ගෝලයන් එකළුරවසා පොරවා මැදින් පටියක්බැඳ බුඩාගමේ කිසිකලක නොපැවති නැසු නුදුටු පත්පොටය කියා කරුමගාතයකින් පාත්‍රයවසාගෙන පිඩුපිණිසයවා දෙතුන්මාසයකින් එය අත්හැරියේමන්ද ? ඒ විනයානුකූල ක්‍රමයක්නම් සියම්නිකායේ කිසිවෙක් එය බාරනොගත්තේමන්ද ? අප උගත් ධම්මාරාම නායක ස්ථවිරයන්පවා ඒ කාලේදි මැදින් පටියක්බැඳගෙන ඇවිද දැනට ඒ පටිය අත්හැරියේමන්ද ? මේවාට ඇවැත්නැතුවාද ?

9 එකාංශව පොරවා පිණ්ඩපාත ගමනේදි පාත්‍රය වසාගන්නට ක්‍රමයක් නැතිබැවින් රතනපාලගේ මරගාත පත්පොට බාරනොගෙණ පිඩුපාත ගමනට පමණක් සියම් සමාගමේ සියළු සංඝයා උභයාංශ වසනබැවින්ම ඒ හරිබව නොහැගේද ?

10 පැවිදිවීමේදි නොලැබුනු ලක්‍ෂණය වරදනම් පැවිදිවීමේදි නොපෙණෙන සංඝාටිය ඇතුළුගමට වරදනොවේද ? පැවිදිවීමේදි ,,එකංසං උත්තරා සඟං" යන ලක්‍ෂණයත් "ඇතුළුගම්වැදීමේදි "සගුණංකත්වා සංඝාටියො" යන ලක්‍ෂණයත් දෙක වෙනස්වූයේමන්ද ? සියාම් සමාගමේ එකාංශව පෙරවීමෙන් ගම්වදනා භික්‍ෂූන්ගේ තබා රතනපාලගේවත් ගම්වැදීමේදි අදදක්වාත් තනිපට දෙපටසිවුරු එකට ඇල්ලීමක් තිබේද ?

11 සියාම් සමාගමේ එකළුරවසන පක්‍ෂයේ ගණ්ඨිකපාසනො ඇමිනීමය නානාකඩ සහ අඳනය දෙවරට වෙන වෙනම ඇඳීමය ගැප් නැති අඳනය ඇඳීමය තනිපට දෙපට සිවුරුදෙක සගුණනොකොට ලෙන වෙනම ඇඳීමය වැසියයුතුතැන් නොවැසීමය සගලසිවුරයට

කොට හිඳිමය යන කාරණා පැවත ආවාද ? නැද්ද ? මේවා මහාවි හාර පරම්පරාවේ සිරිද්ද ? මේවාට ඇමැත්නැතුවාද ?

12 බුද්ධොපස්ථාන සංඝකර්ම් අධාන මාගීාදි සුදුසුතැන්හැර අතුළු ගමට බුඩාදී කිසිළුතුමෙක් එකාංශපෙරවීමෙන් ගියතැනක් පොත පතකින් පෙන්වියහැකිද ?

13 පාරාජිකාපොතේ සුදින්නවස්තුවේ සහ රඨපාලසූත්‍ර අටුවාවේත් ඤාතිදාසින් විසින් ඒ ස්ථවිරයන්වහන්සේලාගේ මිණිබහන් පටන් දෙඅතත් පිඩුමස් පටන් දෙපයත් ශබ්දයත් හිසත් යන මෙකී අවයව පමණක් දැක ඇඳිනගන්නාලද්දේයයි කීවෙන් රතනපාල කියනහැටියට එලියේතිබෙන දසරුව ලැපැත්තග්‍රීවය ආදීතැන් දුටුබවක් නොකීවෙයිමන්ද ?

14 "සඤ්චිච්චගිවං මණිබන්ධංව අපටිච්ඡාදෙන්තස්ස දුක්කටං" යන ශික්ෂාපදයේ ක්‍රමයට එක්මිණි බහණක් වැසියයුතුනම් වමහෝ දකුණහෝ වැසියයුතුයයි නියමකොට අටුවාටීකාහි අර්ථවර්ණනා නොකට යුතුද ? එසේ වර්ණනා නොකළබැවින් කොයිපැත්ත වැසුවත් ඇවතින් මිදියහැකිනොවේද ?

15 "නභුංජමානො සබ්බංහත්ථං මුඛෙපක්ඛිපිස්සාමි" යන ශික්ෂාපදයේ සියළු අතයයි කීතැන එකඟිල්ලක්වත් මුවතුළ බහන්නාහට ඇවැත්නියම නම්වසන්නට ග්‍රීවය සහ මිණිබහණකුත් නොවසන්නාහට ඇවැත්නොවෙන්නට ඇති යුතුකම මොකද ?

16 සර්වඥයන්වහන්සේ සිව්රුවැලඳිමගැණ ශික්ෂාපද පැණවා වදාළේ සීතොෂ්ණාදිය වැලක්විමත් ලජ්ජාවැසීමත් යන ප්‍රයොජනය සඳහානම් ග්‍රීවය මිණිබහණ දසරුව ලැපැත්ත කිසිල්ල ආදි අවයවයන්ගෙන් ඇතම් අවයව වසන්නටත් ඇතම් අවයව නොවසන්නටත් වදාලේ කවරයුක්තියක් සලකාගණද ? වම්දසරුව දකුණුදසරුව වමත දකුණත වම්කිසිල්ල දකුණුකිසිල්ල වම්ඇලපත දකුණුඇලපත යන මේවායින් ලජ්ජාඇතිවා කොයිවාද ; නැතිවා කොයිවාද ?

17 "මණිබන්ධතො පඨායගහෙත්‍වා" කීතැන වැසියයුතු මිණිබහණ පටන් එක අතකැයි තේරුම්ගන්නටත් "පිණ්ඩිකමංසතො පඨාය පාදෙ" කීතැන වැසියයුතුවන්නේ එක කෙඩයක පටන් එක කකුලකැයි තේරුම්නොගන්නටත් ඇතියුක්තිය මොකද ?

18 මහාපරිනිර්වාණසූත්‍රයේදි බුදුන්ගේ පිරිනිවීමේදි රහතුන් පන්සියයක් පිරිවරා චිතකස්ථානයට ආ මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ "එකංසං චීවරං කත්වා අඤ්ජලිංපණාමෙත්වා" යනුවෙන් සිව්ර එකාංශකොට ඇඳිලිබැන්දයයි කීවේ මන්ද; එකාංශව පොරවාගන ආවානම් නැවතත් එකාංශකලේ කුමටද ? සිව්රු ගැටවට්ටුගන්වා ඇතුළුගම්වත පූරාඅවුත් බුද්ධුපස්ථානකාලේදී සිව්රු එකාංශකළබව නොහැඟේද ?

19 සියළු රටවල ධම්විනයධරයන්ගේ මේ ශික්ෂාපද තේරුමත් පෙරවීමත් පුරාණ පොළවයටතිබී යුරෝපිය පඬිතයන් විසින් සොයාගත්තාලද බුඬප්‍රතිමාවල පෙරවීමත් එක්වැනිව තිබෙන්නවත් රතනපාලගේ තේරුමත් පෙරවීමත් පමණක් වෙනස්ව තිබෙන්නමත් කාරණය මොකද ? බුදුන්ගේ පෙරවීම සියැසින්දුක ගල්රූපවල ඒ පෙරවීම යොදතිබියදී බුදුන් කිසිකලක එසේ පෙරෙව්වේ නැතයත කීමට ඇතිශාක්ෂි මොනවාද ?

20 සියමේ මහා නිකායේ උපාලිසථවිරාදීහු ඇතුළුනමට එකාංශ පෙරවීම කළාය යන කීම ඔප්පුදිමට ඇති ශාක්ෂිමොනවාද ? සියම්රජතුමා ලංකාවට පැමිණ සියම්රටේ කිසිකලක එකාංශයෙන් ගම්වදනාභික්ෂුන් නැතැයිකී ශාක්ෂිය අප මිත්‍රයාට බොරුකරන්ට තිබෙන විරුඬශාක්ෂි මොනවාද ? ඒ ශාක්ෂිකාරයාගේ නමදියහැකිද ?

මේවරට මේ ප්‍රශ්නවිස්සට මොනපතම ශාක්ෂිකොට උත්තරදෙනසැටි බලා නැවතත් ප්‍රශ්නඅසන්නෙමි.

මිලඟට මේ මස 9 දින දරණ ශ්‍රීමත්පත්‍රයෙනුත් රතනපාලවිතුයා මගේ දෙවෙනි ලියුම්වලටත් උත්තරලියන්ට පටන්ගෙණ කදිම උත්තරටිකක් ලියාතිබේ, එහිමුලට කියාතිබෙන්නේ "එකාංශපෙරවීම විරදයයිකීවේ කවුද" යන මගේ ප්‍රශ්නයට උත්තරයි, මේවචනය මෝඩයන්ට අවබොධකරවනු පිණිස මොහුවිසින් ලියාතිබෙන මිථ්‍යාප්‍රලාෂ රාශිය බැළුකල මොහුගේ තරානිරම පහසුවෙන් තේරුම්ගතහැකිවේ. එකාංශපෙරවීම විහාරය බුද්ධුපසථානකිරීමය සංඝකම්කිරීමය අධානමාර්ගය යනාදි සුදුසුතැන්වලට වරදනැතැයි නැවතත් කියමි. නුමුත් ඒ පෙරවීම ඇතුළුගමට පොරවායන්නාවූ භික්ෂුවට පියෙන් පියට දුක්කෘතාපත්ති සිඬවනබව දැනගතයුතුයි. ආගම පිළිබඳ විනිශ්චයවලදී මෙබඳු කෛරාටික චපලඋත්තර නොලියා පොතපතපිහිට කොටගෙණ ලියන්ට අවවාදකරමි.

මීලඟට කියන්නේ මහාවිහාරපරම්පරාවත් සියම්නිකායත් එකක්බවයි, එසේ කරණ්නට පුළුවන්නම් අපෙන් ඊට බාධාවක්නැත්තේය. නුමුත් සියමේ මහාවිහාරපරම්පරාවේ පැවැති ඇතුළුනමට උභයාංශයවැසීම නැතිවීගියේනම් එබඳු නිකායකට මහාවිහාරපරම්පරාවය කියාවත් සියම්නිකාය කියාවත් ව්‍යවහාර නොකටයුතුය. කාලේබරිනිකායයි ව්‍යවහාරකටයුතුයයි කීවේ රතනපාලලාගේ ස්වාමියාවන සියම්රජතුමාමයි. මේ පරම්පරාව ගළපාදීම සියම්රට පඬිතයන්ටබාරයි, ලංකාවේ කිසිවෙකුට මේ පරම්පරාව කියන්ට නො

හැකිබව ලද්රැවත්වපවා හැගේවි, එබැවින් සියම්රට ශාසනවංශ සන්දෙශාදියකින් මහානිකාය මහාවිහාරයෙන් බෝවූබව ඔප්පුකර ණතුරු රතනපාලලාකියනපේන කිසිවෙක් බාරනොගනී මීලගට දික්සගිඅවුවාවේ "සත්ථු දස්සනට්ඨානෙ උභොඅංසෙපාරුපති-පෙ-අයංසප්පරිඅගාරණවා" යනාදි පාඨයක්දක්වා බුදුන්දක්නාතැන් ආදි යට දෙඋරණපරවීම අගෞරවබව පෙන්වාදීතිබේ, රතනපාලට ඉතා ලඟදීසිහි මුළාගතියක්හටගතීයයි සිතියහැකිවේ. බුද්ධුපස්ථාන සංඝකර්මාදියට දෙඋරවසන්ට එපායයි කීපවරක් තහනම්කරතිබියදීත් නැවතත් ඒගැණ කෑමොරගහන්නේකුමටද ? එබැවින් රතනපාලගේ සඝභාගීන්ට ඇතුළුගමයාමට සහ හිඳීම සිටීමටත් පමණක් බුදුන්සමගයතත් දෙඋරවසායන හැටියට අවවාදකටයුතුයි අත්තිබිය ආදි පිටිසරපලාත්වල මෝඩ අම්මණ්ඩිලාට මෙබඳු බොරුබණ උගන්වා අටසිල්සමාදන්වූ දවසේ සැට්ට ගළවා එකඋරයක්පළා රෙදිකඩක්දමාගන පන්සලට එන්ට පුරුදුකරතිබේ එක්දිනක් මෙසේ පෙරවාගත් තරුණියන් කඩායමක් දැක මේ කිමෙක්දැයි ඇසූකල අදඅපි බුදුන්රතනුන්ට අනුව සැට්ටඇරදමා මෙසේ පොරවාගතිමුයයි කීවෝය. ස්ත්‍රීන්ගේ ලමැද ආදී අවයවයන් දක්නාපිණිස මෙබඳු බොරු ප්‍රයොගයක්කල ශ්‍රමණයන් ගැණත් මේ මෝඩ ස්ත්‍රීන්ගැණත් අනුකම්පාකටයුතුයි. බුඩාගම පවත්නා කිසිරටකවත් ලංකාවේවත් ස්ත්‍රීන්ට මෙබඳු සිරිත් ඉගැන්වීමක් ඇද්දැයි සොයන්ට නරකද ? වලානේ උඩුගම්පලආදි ධර්මවිනයධරයන් විසින් මෙබඳු ඉගැන්වීම් ඒ පලාත්වාසි ස්ත්‍රීන්පිළිබඳවකලාද යනවග මේ පලාත්වාසී වෘඩයන්ට මතකඇත.

තව්ද මාර්තු 12 ද ලංකොදයෙන් සියම්රජතුමාට අපහාශකොට ලියනලද ලියවිල්ලට කමාඉල්ලීමක්මෙන් මේ පත්‍රයේ කර්තෘවාක්‍යයක් පලකරතිබේ එහි කියාතිබෙන්නේ "ඒ ලියුම ප්‍රසිඩකිරීම ගැණ අපිඅතිශයින්ම කනගාටුවෙමු ඒහෙයින් ඒ වචන සියල්ලම මෙයින් අහක්කරණබව සහ නිෂ්ප්‍රභා කරණබව දන්වන්නෙමු,, යනාදින්ය මෙයින් රතනපාලතැනගේ ඒ ලියුම කර්තෘවිසින්ම නිෂ්ප්‍රභාකල බැවින් එහි කියාතිබෙන පාරුපනවිධියත් භාත්පසින්ම නිෂ්ප්‍රභාවූ බව පෙණේ. බෞඩරජතුමෙකුට අපහාශනොවන පරිද්දෙන් සංසුත් ලීලාවෙන් ලියුමක් ලියාගන්ට නුහත් රතනපාලට බුදුන්ගේ අදහසමෙස්යයි මේ ශික්ෂාපදයන්ගේ අර්ථකියන්ට පුළුවන්වේද යනු පරික්ෂාකටයුතුයි.

නුමුත් රජතුමා වෛරිකාරයෙකැයි කිමත් රජකුලැත්තෙක් නොවේයයි කීමත් මෙපමණින් කාමාවේයයි නොසිතා සුදුසු අන්දමේ සමාවක් ඉල්ලීමට සිතට ගතයුතුයි. රජතුමා බොධිසත්වකෙනෙකැයි කියමින් සිට එකාංශ පෙරවිම සියමේ නැතැයිකී පමණින් මෙෂමණ අපහාශලැබුවානම් අපවැන්නන්ට කියනුකිම.

රතනපාලගේ මුඛයේ හටගෙණ තිබෙන දිවතැමති පොරවනිසා රතනපාලත් විනාශවී තවත්බොහෝ සමූහයක් විනාශවනබව-සලකා වෙනබොරුකියනත් දෙශනාපද වෙනස්කරණ මහාසාවද්‍ය බොරුනොකියන්ට අවවාදකරමි.

අප්‍රේල් 23 වෙනි දින ලංකොදයෙන් පෙනීහිටින ශ්‍රී. රතනපාලට පිළිතුරුයි.

රතනපාලගේ ලියුමේ'' මොහු ශික්ෂාසඹන්ධ වාග්ව්‍යවහාර පමණකුත් නොදත්තෙකුබව ලඝුවූශික්ෂාපදයකැයි කිමෙන්ම විනයඥයන්ටහැගේමය විනයෙහි ලඝුවූද ඇවැත්දක්වන ලද්දේවිනමුත් ශික්ෂාපදයන්ගේ ලඝුගුරුබවක් නොදක්වනලද්දේය'' යනාදන් ලඝුවූ ශික්ෂාපදයකැයි යනමගේ වචනයෙහි එල්ලී දීගව ලියාතිබේ ලඝුකාපත්ති සඳහාපැණවූ ශික්ෂාපදයන්ට'' "ලඝුශික්ෂාපද" යයි නොකියා ලහුගරු ශික්ෂායයි කියන්ම කියනවාද ? ලහුගරුඇවැත් දක්වා තිබෙනබව අපමිත්‍රයාවිසිනුත් පිළිගත්බැවින් ඒ ඒ ඇවැත්පිළිබඳ ශික්ෂාපදත් ලහුගරුශික්ෂායයි මෙයින්මතු තේරුම්ගතයුතුයි පැල්පිටිකෝරාල එක්තරාගමක නඩු විසඳීමටගොස් කිසිවරදක් ගම්මුන්ගේ නැතිබව දැක කෝරාල අහතුබුහෝඩිය වක්කඩකගන්නා නැවත ඒඅල්වාගණ" අනිච්චං බොල තුන්පිටකේත් මුලහෝඩියනොවේද ? ඒ හෝඩිය නොපි වක්කඩ ගැහුවානොවේද ? නොපිලාට රිදීහිඟ ගණනේ දඩයයි සියළුගම්මුන්ට රිදීහිඟ ගණනේ දඩගැහු කථාව මෙහිදීමතක්විය මේ කාරණය කෙසේඋනත් ඒකාංශපෙරවීම ගම්වැදීමට හරියන තේරුම මෙයින් ඔප්පුනොවේ රතනපාලට පුළුවන්නම් මේ බොරු ප්‍රලාපවලින් කාලයගතනොකර හරිකෙළින් ඔය පාරුතය හරිබව දේශනාරී කථාවලින් ඔප්පුදියයුතුයි "පල්ලත්ථිකය" යන්න කුමක්දකියා රතනපාලට තවම තේරුම්නැතිබව ප්‍රත්‍යක්ෂවදනිමි එබැවින් පල්ලත්ථිකයගැණ කරණවාදය මතුවට තබමු අපේ දූත්වාදය ඇතුළුගමට උභයාංශපාරුතය හරිද වැරදිද ? යන්න නිශ්චයකරගැන්මයි නැවත ඉතුරු පල්ලත්ථිකාදිය ගැණත් වාද කරණබව සැලකියයුතුයි නුමුත් එතකලට සංඝාටියේ සිව්රුපටවල් විනාශවනපරිද්දෙන් යටකොටවාඩිවී ශික්ෂාපද මර්දනයකොට ඇ

වනට නොපැමිණීමට අවවාදකරමි අපමිත්‍රයා සඟලසිවුරු පෙරවී
ගෙණ ඇවැත්නොවෙන්නට වාඩිවෙනක්‍රමය සියම් බුරුම රටවලින්
පැමිණෙන මහතෙරුන්වහන්සේලාගේ පෙරවීම්වලින්හා පුරාතන
ඉන්දියාවෙන් සොයාගත් ශෛලප්‍රතිමාවලින්ද ඉගෙණගතයුතුයි ප
ලල්පිකය නොදන්න සියම් බුරුම තෙරුන්වහන්සේලා ඇවතට පැමි
ණෙත්යයි කිසිවෙක් පත්‍රයකින්වත්කටින්වත් කියනවචනයක් කව
දාවත් නැසිම් පුළුවන්නම් ඔප්පුදියයුතුයි පලල්පිකය සමහරු දැන
ගන්නේ සියම් බුරුම තෙරුන්වහන්සේලාට පින්සිඹවෙන්නටයි සු
ඛවජ්ජාදවිභාවිනියේ ලියාතිබෙන හරියගැණ පලල්පිකවාදයම බැස්ස
තැත කාරණාදක්වමි අප මිත්‍රයා නිතරම මිනැකාරණය මූවාකරද
මන්නට තීනාගෙණ පරගලවාදජත්‍රැවාද පලල්පිකවාද මේ අස්සේ
පටලයි; ඒ සියල්ලටම පසුව උත්තරලියමි, දූත්පටන්ගත් වාදයට ප
මණක් උත්තරදී ජයගන්ට හිතටගත මැනවි මිලගට රතනපාල මි
ත්‍රයා තහනම්කරවදළ ගිහිපෙරවුම් සමානවාද ශ්‍රමණපෙරවුම් සමා
නවාද කියා නොදන්න තමනුත් අවුලේවැටී තවලොකයාටත් අවුල්
කරණ අදහසින් සම්ප්‍රලාපරයක් ලියාතිබේ. "සම්බුද්ධයන්වහන්සේ
ස්වකීය ශ්‍රාවකයන්ට සකලශරීරය වස්වන්ට හෝ දෙවුරවස්වන්ට
හෝ අදහස්කළසේක්නම් මෙකී දෙවුරවසන ගිහිපෙරවුම් තහනම්
කරවදරන්ට කරුණක්නැත,, යනාදිය ප්‍රකෘති සිහියෙන් ලිවායයි
නොසිතියහැකිවේ මෙහිදී අපමිත්‍රයා විසින් විධිවිරොධවූ සියළු ඒ
කාංශ උභයාංශපෙරවුම් වරදබව තේරුම්ගතයුතුයි, පරිබ්‍රාජකාදීන්
ගේ වරදවූ උභයාංශපාරුපනත් පාලිකාරකාදීන්ගේ වරදවූ ඒකාංශ
පාරුපනත් දෙකම වරදයයි තහනම්කළ බැවින් විධිවිරොධවූ සියළු
පෙරවුම්ම වරදබව නොහැගේද ? අප මිත්‍රයා විසින් භික්ෂූන්ගේ උ
භයාංශපාරුපනයත් පරිබ්‍රාජකාදීන්ගේ ගිහිපාරුපනත් එකක්බම ගෙ
වා ලියාතිබෙන අභූතරූප බොරුබව මෙසේ දතයුතුයි, යම්සේ සම
හර පරිබ්‍රාජකයෝ ලයවිවෘතකොට දෙදසරුවෙහිපොරොනාවසත්‍රය
දමාගණිද්ද ඒකසාටක මනුෂ්‍යයෝ හැඳි වස්ත්‍රයේ එක්කොණකින්
පිටපොරවා දෙකොළවර දෙදසරුවෙහි දමද්ද, රාජසාඹආදීහු සළු
වෙන් ග්‍රීවය වෙළන්නාහු දෙකොළවරලයෙහි හෝ එල්වද්ද පිටව
හෝ දමද්ද † යන මෙකී දෙවුරවසන පෙරවුම් එකකටවත් භි

---

† යථාවඑකචෙව පරිබ්බාජකාඋරං විවරිත්වාඋභොඅංසකූටෙසු පා
රුපනංඅපෙන්ති යථාවඑකසාටකමනුස්සානි වත්ථසාටකස්ස එකෙ
නඅන්තෙනපිට්ඨිංපාරුපිත්වා උභොසුඅංසකූටෙසුඨපෙන්ති යථාවසුරා
සොණ්ඩාදයො සාටකෙනගීවංපරික්ඛිපන්තා උභොඅන්තෙ උරෙවා
ඔලම්බෙන්ති පිට්ඨියාවාඛිපන්ති,

ක්‍ෂුන්ගේ උභයාංශපෙරවීම සමවේදැයි බැලියයුතුයි, මේ සියළුපෙර
වීම් දනට මනුෂ්‍යයන්අතර පවත්නාබව ප්‍රත්‍යක්‍ෂයි, පාලිකාරක භි
ක්‍ෂුව එකාංශපෙරවීමෙන් පෙරවනලද සිවුර වම්උරය එලියේදමා
දසරුව මතුයෙහි සිවුරනංවාද එබඳුම්රදවූ එකාංශපාරුතයන් නො
පෙරීවියයුතුයයි කීබැවින් ‡ විධිවිරොධවූ සියළුපෙරවුම් නහනම්බව
පෙණේ මෙහිදී කොටින් තේරුම්ගතයුතු අභිප්‍රායනම් මේ සියලු පෙර
වුම් කොත් උස්පාත්කොට පෙරවනබැවින් එසේ නොකරන්ට වද
ලාම්ස වැසිය නොවැසියයුතු අවයවගැණ වදල එකක් නොවනබව
යි මෙහිකී සියළු භීතිපෙරවුම් හා පාලිකාරකපෙරවුමත් විස්තර
කළේ පරිමඬල ශික්‍ෂාපදය ගැණද සුපටිච්ඡන්න ශික්‍ෂාපදයගැණද
කියා නැවතත් මාතෘකාඅටුවාව පෙරළාබලන්ට අවවාදකරමි, පරි
මඬල ශික්‍ෂාපදයේදී වැසියයුතු නොවැසියයුතු කිසිඅවයවයක් අපෙ
ක්‍ෂානොකොට සිවුරුකොත් සමකිරිමපමණක් වදළබැවින් මෙහිදී
සකල ශරීරය හෝ දෙවුර හෝ වස්වන අදහසක් බුදුන්ට නොපෑ
වැත්තේය, අනිකක් ගැණ කීදෙයක් තවත්කාරණයක් ගැණ කියා
පාන්නේ මෝඩයන් මුළාකරවන්ටයි නුඹුන් එකී ගිහිපාරුතවල වස්
ත්‍රකොත්ගැණම කීබැවින් රතනපාලගේ අදහස වෙනඅය තේරුම්
නොගනිති සමන්තපාසාදිකා විනයඅටුවාවේ ප්‍රථම පාරාජිකා වර්ණ
නාවේදී බණදෙසන භගවත්තෙමේ එයි භික්‍ෂුභාවයට උපනිශ්‍රය සම්
පන්න පුද්ගලයෙක් දක රක්තපාංශුකූල විවරය ඇතුළෙන් රන්වන්
දකුණත මැත්කොට බ්‍රහ්මස්වර විහිදුවමින් මෙසේ එව මහණෙනි ම
නාකොට දුක්ගෙවනපිණිස මාගී බ්‍රහ්මචය්‍ය්‍යාව පුරවයි යන වචනය
වදරයි ඒ බුදුන්ගේ වචනය හාසමග ගිහියටහත් අතුරුදන්වෙයි
ප්‍රව්‍රජ්‍යාවද උපසම්පදාව පිහිටයි මුඩුවූහිසක් සහ කසාවත් ඇත්තේ
වෙයි එකක් හැඳ එකක්පෙරව එකක් දසරුව පිටදමා වම්දසරුවේ
එල්වනලද නිළුපුල්වන් මැටිපාත්‍රයක් ඇත්තේ තුන්සිවුරු ආදියුක්
ත යොගී භික්‍ෂුවගේ පරිස්කාරයයි කියනලද ශරීරයෙහි වැලඳගත්
නාලද අටපිරිකරින් යුක්තවම හැටවස් පිරුණු මහතෙරකෙනෙකු
මෙන් සංඝුන් ඉරියව්වෙන් යුක්තව බුඩාචාය්‍යී බුඩොපාධ්‍යායයන්

---

‡ යථාවපාලිකාරකොභික්ඛු] එකංසපාරුපනෙන පාරුතංචාම
බාහුං විවරිත්වා අංසකූටෙ ආරොපෙති. ( කංඛාවිතරණී )

ඇතිව සම්‍යක් සම්බුද්ධයන්වඳිමින්ම සිටින්නේය * යි කිතැත පිරිස්මැද බණදෙසන බුදුරජාණන්වහන්සේ රක්ත පංශුකූලචීවරයඇතුළෙන් දකුණුඅත මැත්කළාය කියන්නේ මොකද ? රතනපාල කියන ක්‍රමයට ඒකාංශවපෙරවූකල එලියේ තිබියයුතු දකුණුඅත චීවර ගර්භයෙන්එලියට ගන්නේ වසාගනතිබෙන චීවර ගර්භයෙන් නොවේද ? පුරාණ දඹදිව ශෛලප්‍රතිමාවලින් මේ අත එලියටගන්නා ක්‍රමය මතු දක්වන අපේ සිතුයම්වලින් බලාගන්නට පුළුවන මෙහිදී එහි භික්ෂු භාවයෙන් රහත්වූ ශ්‍රාවකයෝ බුද්ධොපස්ථාන පිණිස එකඋරවසා පෙරවා බුදුන්වැඳ වැඳසිටින රහත් බුදුන් දෙව්රවසා පිරිස්මැද දහම්දෙසන රහත් බැළුවාමමන්ද ? මෙසේ ඉරසඳමෙන් ප්‍රකටවූ ඇතුළගමට දෙව්රවැසීම නිර්ම ශාසනික චාරිත්‍රයක් නොවේයයි ඔප්පුකරන්ම පුළුවන්උනිනම් මේ මහ පොළවත් අහිත්පිට පෙරළිය හැකිවේ මෙබඳු එකම ශංකියකුත් නැත්තාවූ රතනපාලගේ දුර්මතයට වාල්වසිටින ආගම නුගතුන්ට මේශංකියම ප්‍රමාණවේයයි හගිමු. පරමාර්ථධර්මවිභාගයවනාහි අපවැනි ලෞකික ඥාණයඇත්තන්ට විෂය නොවූ ධර්මයකි අද්‍රව්‍යවූ අරූපිවූ චිත්තයෙහි මේ ස්පර්ශය මේවේදනාය මේසංඥාය මේ චෙතනාය යනාදි ධර්මයන්ගේ බෙදීම පස්වමහාගඟාවේ ජලයඑකභාජනයකවත්කළාටපසු වෙන්කරදීමක් කරනත් ඒවා රූපධර්මනිසා සමහරවිට පුළුවන්වෙයි නාමධර්මයන්ගේ මෙවෙනස පෙන්වීම ඊටත්වඩා දුස්කරවේ එබඳුතැනදී අපවිසින් පිළිපැදියයුත්තේ මෙසේයි ධර්මයන්ගේතත්වූ ස්වභාවකෘත්‍ය ස්වකීය ලක්ෂණය ඇතිසැටියේපිළිවිද භගවත්හුවිසින් ඒ ඒ ධර්මයන් බෙදන ලද්දුහුයයි භගවත්හුකෙරෙහි හෙවත් උන්වහන්සේගේ සර්වඥතාඥ

---

* භගවාහි එහි භික්ඛුභාවාය උපනිස්සය සම්පන්නං පුග්ගලං දිස්වා රත්තපංසුකූලන්තරතො සුවණ්ණවණ්ණං දක්ඛිණහත්ථං නීහරිත්වා බ්‍රහ්මඝොසං නිච්ඡාරෙන්තො එහි භික්ඛුචර බ්‍රහ්මචරියං සම්මාදුක්ඛස්ස අන්තකිරියායාතිවදති තස්ස සහෙව භගවතො වචනෙන ගිහිලිඞ්ගං අන්තරධායති පබ්බජ්ජාච උපසම්පදාචරූහති භණ්ඩුකාසාව වසනොහොති ඒකංනිවාසෙත්වා එකංපාරුපිත්වා එකංඅංසෙඨපෙත්වා නීලුප්පල වණ්ණමත්තිකාපත්තො–තිචීවරඤ්ච–පෙ–යුත්තයොගස්ස භික්ඛුනොති එවංවුත්තෙනහි අඨහි පරික්ඛාරෙහි සරීරෙ පටිමුක්කෙහියෙව වස්ස සට්ඨිකත්ථෙරොවිය ඉරියාපථ සම්පන්නො බුද්ධාචරියකො බුද්ධුපජ්ඣායකො සම්මා සම්බුද්ධං වන්දමානො යෙවතිට්ඨති.

( සමන්තපාසාදිකා )

නයෙහි ව්‍යාසයෙන් මේ ධර්මයෝ මෙබඳු විශේෂ ඇත්තාහයි අවකල්
පනයකොට ඉගෙණිම් පිළිවිසීම් ආදිවශයෙන් ඒ ධර්මයන්ගේ ස්වභා
ව අවබෝධයපිණිස උත්සාහකටයුතුය ඒ ඒ තැන වරදවාපිළිපන්
නන්විසින් මුළානොවිය යුතුය යනුමෙහි ආචාර්යයන්ගේ අනුශාස
නාවයි. ** යනන්‍යාය පළමුකොට සිතතබලා බාල රතනපාල
ලා වන්නන්විසින් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට පවා අවිෂයයි වදාළමේ වි
නය ශික්ෂාගැණ වැඩිදුර වාදකොට තමන්වත් අනුන්වත් අනර්ථක
රනොගන්නා පිණිස අවවාදකරමි රතනපාලලාගේ මුල්පරම්පරාව
පැවැති සියමේ කවදවත් එකඋරවසා ගම්වදින භික්ෂූන්නැතිබව සි
යම් රජතුමා අප ඉදිරියේ කිබැවින් සියමෙන් ඔයතැනට කිසිපති
වක් නොවේ බුරුමරටින්වත් ලංකාවේ බුරුම සමාගම්වලින්වත් පි
හිටනොලැබිම කුමටකියමුද බෙන්තර වලානේ මහාස්ථවිරයන්ව
හන්සේලාත් සුද්ධසුතැන්වල දෙවුරමැසූබැවින් එසිනුත් මිත්‍රයාට පිහි
ටක් නොමැතියි මේ ශතවර්ෂයෙහි ලංකාවේ ඇතිවූ සැබෑඋගතුන්
නම් බටුවන්තුඩාවේ ශ්‍රීදේවරක්ෂිතාචාර්යයන් හා ආචාර්ය හික්කඩු
වේ ශ්‍රී සුමඞ්ගල මහානායක ස්ථවිරපාදයෝත්යයි මුළුලෝකයා පිළිග
ත්තේය මුන්වහන්සේ සතළිස්වර්ෂයකපටන් මුළුලක්දිව සියළු නිකා
යවලට මහොපාධ්‍යාව ත්‍රිපිටකධර්මය ප්‍රධානකොට ඇති පූර්විග ශා
ස්ත්‍රසියල්ලම උගන්වාගණඑයි සියම් බුරුම එංගලන්තාදි සියළු දේ
ශවාසීන් විසිනුත් මේ කාරණය මෙසේම පිළිගත්තේය මුන්වහන්
සේ තරම් ධර්මවිනයධරයෙක් මුළුලකනැතිබවට රතනපාලමිත්‍රයා
හැර ලංකාවේ සියළුනිකායවල සියළු උගතුන්ලවා ශාක්ෂිඔප්පුදෙව
න්ටපුළුවන උන්වහන්සේ දෙඋරවසන්ට පටන්ගත්තේ ශ්‍රීදේවරක්ෂි
තාචාර්යාදි ලංකාවේ සියළු පණ්ඩිතමත හා පොතපතත් සංසන්දනය
කොට නිසැකවූතැනයි භේද අන්‍යනිකායවලින්වත් දායකාදීන්
ගෙන්වත් අමුතු යශ ලාභාදියක් ප්‍රාර්ථනාකරනොගෙණබව මුළු
ලෝකයාමදනී සතලිස්වර්ෂයක් මුළුල්ලේහි ත්‍රිපිටකය පරීක්ෂාකොට
සියළුසැකහැර සියළු පණ්ඩිතමත රැගෙණ ඒ මහොපාධ්‍යායයන් ව
හන්සේ ධර්මවිනයානුකූලයයි පිළිගත්මනය රතනපාලලාවැනි කුඩා

---

** ධම්මානංතංතං යථාවසරසලක්ඛණං සභාවතො පටිවිජ්ඣි
ත්වා භගවතා තෙනෙ ධම්මා විභත්තාති භගවතිසඩාය එවංවිසෙසා
ඉමෙ ධම්මාති ඔකප්පෙත්වා උග්ගහණ පරිපුච්ඡාදිවසෙන තෙසංස
භාව සමධිගමාය යොගොකරණීයො නපනතත්ථතත්ථ විප්පටිපජ්ජ
න්තෙහි සම්මොහො ආපජ්ජිතබ්බොති අයමෙත්ථ ආචරියානං අනු
සාසනී—( අ. වි. ටි. )

වරයින් විසින් උන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ඇදහියයුතුය පරමාර්ථය අපට වෙන්කරගන්ට බැරිබැවින් බුදුන්කෙරෙහි විශ්වාසයෙන් පොතේ කීහරිය පමණක් විශ්වාසකරගන්නාක්මෙන් මේ විනය ශික්ෂායෙහි කිසි පරිචයක්නැති ඉතා ලදරු බොලඳ විනයාචාර්ය පරම්පරාවක් නැති රතනපාල මිත්‍රයා විසින් හිතුබුද්ධියෙන් කටට ආ ආ විධියට බොරු පලනොකර අප කාගේත් මහොපාධ්‍යායයන්වහන්සේ නොදන නොපිළිපදිතයන විශ්වාසයෙන් පිළිගැනීමත් අවශේෂ මන්දබුද්ධීන් විසිනුත් පුද්ගල ප්‍රමාණය පලමුකොට සලකා මුල් සියම්රටේ පැවැත්මත් අපේ ලංකාවේ පලමුවෙනි ධර්මවිනයධර මහොපාධ්‍යායයන්ගේ චරිතයත්බලා ඊටඅනුව ක්‍රියාකරන්ට උත්සාහ කටයුතුයි.

පු. රතනපාලගේ ලියුම් කීපයක දක්වනලදකරුණු හාත්පසින් ආගම විරෝධබව මාවිසින් පෙන්වාදී ලියනලද ලියවිලි ගැන අවකාටම පිළිතුරුනොදී ඒවා වසා බැඳතියා අප්‍රෙල් 16 වෙනි දින විචාල ප්‍රශ්න විස්සෙන් දහයකට අප්‍රෙල් 30 දා ලංකොදයෙන් කාදිම උත්තරපිකක් ලියාතිබේ රතනපාලගේ උත්තර වහසිබිණීමමිස ආගමානුකූල උත්තරනොවේ” පහන්මිත්‍රයා තමන්ගේම වාක්ශස්ත්‍රයෙන් තමන්ගේම වාදශරීරය පළුදුකොටගෙණ මහත් වනසටපත් වූසැටි” යනාදි අත්තුක්කංසන පරවම්භනවහසි බස්බිණීම අපදෙපක්ෂයටම ඕනෑනැත්තේය රතනපාලගේ පක්ෂයබලත්නත්ත් පලින් පලකියා පාන්නේත් ඔයවහසිබිණුම්පික පමණක්බව පෙනේ ප්‍රසිද්ධ පත්‍රමාගීයෙන් කරණ වාදයකදි ඔබදුවහසිබස් නොබිණුවත් ඇත්තමේය නැත්තමේය යනුප්‍රාඥයෝ විනිශ්චයකරගණිති අපදෙදෙනාගේ ලියුම්වල කොපමණ වහසීබිණුවත් කාරණයට පිරිමසිනාතරම් හෙතොදහරණ නැත්නම් ඒපක්ෂය වරද බව ලෝකයා ඒත්තුගණී එබැවින් රතනපාලට (තාල්කට්ටිවහන්සේ පිළිමවහන්සේට වඩා මහත්කරනොගෙණ) වහසීබිණුම්වලින් අඩුවෙන්ටත් ආගම නිදසුන්වලින් වැඩිවෙන්ටත් ලියන්ට ආරාධනාකරමි මේගැණ අපදෙදෙනාගේ ලියුම් බැළූ මධ්‍යස්ථසත්පුරුෂයෝම මෙහි ප්‍රමාණවෙති එසේදවුවත්මගේ ලියුම් හතඅටකට කිසි උත්තරයක්නොදී මේ ප්‍රශ්නයන්ට උත්තරලියන්ට පටන්ගත් එකම කාරණයෙන්ම රතනපාලගේ විනයනය දැනීමේ ප්‍රමාණය ලෝකයාඅතර ප්‍රකටවේ රතනපාල කවදත් කටට ආවක් කියන සුල්ලෙක්බවදැන මාවිසින් විචාල ප්‍රශ්නයන්ගේ ආදිභාගයෙහි “අත්තනොමතික උත්තර නොදී පෙළඅටුවා ටීකාදියෙන්ම උත්තරදියයුතුය” යි සඳහන්කළ

තුමුත් රතනපාල පෙරපුරුද්ද හැටියටම කමට ආ ආ ප්‍රලාපඋත්තර යයි සිතා ලියාතිබේ. මෙපමණ විනයපොත්පත් තිබියදී විලිලජ්ජාව සා අඳින පොරෝනාවිධියවත් ඒ පොතපතින් තේරුම්ගැණීමට ශක්තිනැත්තාවූ රතනපාල සිඟුම් විනයනයපිළිබඳ ප්‍රශ්නයන්ට හිතුවක්කාරකමට දෙනඋත්තර කොසේ විනයටගැළපේද? මේ පත්‍රයෙහි ප්‍රශ්න දසයකටදී තිබෙන උත්තර හාත්පසින්ම වචා ප්‍රයෝග කපටි උත්තරබව ඒපත්‍ර දෙක කියවා බලන්නාවූ නැණවතුන්ට මනාසේම වැටහේ මේඋත්තර රතනපාලගේ ඒකාංශය පිළිගෙණසිටින රැලට ඔබිනත් ඥණවන්තයන්ට කිසිසේත් නොහොබි මායිසින්විචාල 1 වෙනි ප්‍රශ්නය 1–2 වෙනි ශික්ෂාපදදෙකින්වැසිය නොවැසිය යුතු ස්ථාන නියමයක්කළානම් ඊටපරිමණ්ඩල ශික්ෂායයි ව්‍යවහාර කරන්නේ මන්දකියාය ඊටදුන් උත්තරය "ශික්ෂාපදයන්ට ඒ ඒ නාම ප්‍රඥප්ති අන්වර්ථවිතවම ලැබෙනනිසා එහි විධිවිභාග විනයඥයන්කරා එළඹ විස්තරසේ ඉගෙණගතයුතුයි කියාය ශික්ෂාපදයන්ගේ නාම ප්‍රඥප්ති අන්වර්ථවිතවම ලැබේනම් 1–2 ශික්ෂාපදවලයෙන් වැසිය නොවැසියයුතු අවයව විභාගයක් නොකළබවින් කොහේ උස්පහත් නොවෙන්නට පිරිමඩුළුකිරීම් මාත්‍රයක් වදළබවත්හැංහේ එසේ ඇත්කල රතනපාලගේ කිමේඝැටියට හඳනා පොරෝනා සියළු විධි මේ ශික්ෂාදෙකින් කීවාය යන කීම හාත්පසින් බොරුවකි.

2 ප්‍රශ්නයට දීතිබෙන උත්තරයනම් "සුපටිච්ඡන්න ශික්ෂාපණවන්ට හේතුව සවග භික්ෂූන් දුෂ්ප්‍රතිච්ඡන්නව අන්තර ඝරයෙහි යාම්ඝදිම්කිරිමයි" යනුයි මේ සවග භික්ෂූන්නපුරුකොට වැසූඅවයව මොනවාද නොකියා මෝඩයන් මුළාකරවන "දුෂ්ප්‍රතිච්ඡන්න,, වචනයක් යොදාලිවීම කපටිකමකි බුදුහු සැවැත්නුවර වසනසමයෙහි සවග භික්ෂූහු උරහිසකුත් ලැපැත්තත් එලියේදමා ඒකාංශපෙරවීමෙන් ඇතුළුගමටගිය බැවින් සුපටිච්ඡන්න ශික්ෂාපදවල පණවනලදී ඒ එලියේදමාගිය උරහිසත් ලැපැත්තත් දෙක ඒකාංශපෙරවීමේදී එලියේතිබෙන උරහිසත් ලැපැත්තත් බව විමතිවිනෝදනී ටීකාවේ සම්පූර්ණයෙන් දක්වාතිබේ සවග භික්ෂූහු සිවුරුඉනේඔතාගණ ගියා නොවවිහාරයට අනුදනවදල ඒකාංශපෙරවීමෙන් උරහිසකුත් ලැපැත්තත් එලියේදමාගියබැවින් ශික්ෂාපදපණවන්ට හෙතුවිය එසේ නොවේනම් සවගභික්ෂූහු එලියේදමාගණගිය අවයව මොනවාදැයි රතනපාලවිසින් විස්තරකටයුතුයි.

3 වෙනි ප්‍රශ්නයට උත්තරදී මොනඝැටියකින්වත් පිරිමසන්ට නුපුළුවන් බැවින් ඊටපල්බොරුවක් ලියාතිබේ එකම කාරණයක වෙනස් වෙනත් ආකාරගැණ පසුපසුව පණවන ශික්ෂාපදයන්ට ප්‍රථ

ම ප්‍රඥප්ති අනුප්‍රඥප්තියයි විනයේ ව්‍යවහාරයකි එබඳු ව්‍යවහාරයක්
නැතිබැවින් මේ ශික්ෂාපද යුගලවල අන්‍යොන්‍යසම්බන්ධයක් නැත්තේ
යි මුල්ශික්ෂාපද යුගලය පණවන්ටවූ නිදානය සවග මහණුන්ඉදිරි
යෙහුත් පස්සෙහුත් කොන්එල්ලා විසමකොට සිවුරුඇඳීම පෙරවීම
යි දෙවෙනි ශික්ෂාපද යුගලය පණවන්ටවූ නිදානය සවග මහණුන්
කය විවෘතකොට හෙවත් දසරුවසුත් ලැපැත්තත් විවෘතකොට
ඇතුළුගම යාමහිඳීමයි ඉතින් රතනපාලකියන ක්‍රමයට මුල්ශික්ෂාපද
යකින් නියමකල අවශ්‍යම හොඳටවසාගෙන ඇතුළුගම්යාමහිඳීම පිණි
ස දෙවෙනි ශික්ෂායුගලය පණවාවදලාගෙයනකිම කොපමණම්හත්වූ
බොරුවක්ද ? සවග මහණුන් ගමටගියේ විහාරයේදි පෙරෙවූ ඒ
කාංශපාරුපනයෙනැයි විනාශවි නොආවානම් රතනපාල කොපම
න උඩ නොපනීද ?

4 ප්‍රශ්නයට උත්තර “අනුවාතන්තෙන ගීවං පටිච්ඡාදෙත්වා”
යන ක්‍රමයට එකාංශපෙරවීමෙන් ග්‍රීවයේ වැසිය යුතුතාක්නුවා කො
ළවරින් වැසියයුතුමය, යනුයි එකාංශපෙරවීමේදි නුවා කොළවරින්
ග්‍රීවය වසන්ට නියමකලේ කොයිපොතේද යනු සඳහන් නොකලා
වරදයි එක කරකින් වස්ත්‍රයක්දමා අනිත්පැත්තේ කිසිල්ලෙන්ගෙ
න එකළරයක් වසාගත්කල එයින් බෙල්ලේ කොතනවත් වැසේදයි
මේ කියවන්නන් විසින් පරීක්ෂාකටයුතුයි දූන දූන ග්‍රීවය හෝ මිණි
බහණ හෝ නොවසන්නාහට දුකුලා ඇවැත්වෙති වදළපණතේ
බෙල්ලේ කොයිපැත්ත නොවැසුවොත් ඒ ඇවතවේද මිණිබහන්දෙ
කෙන් කෝකනොවැසුවොත් ඇවැතවේද යන නියමය ඔය සියුම්වි
නය ලක්ෂණදනනා රතනපාලට පොතපතකින් පෙන්වියහැකිද ?
සැබවින්ම අටුවාටිකා ප්‍රකරණ ගැටපද සන්න මෙපමණ රාශියක්
ලියූ විනයාචාර්‍යයිවරු ඔය වයත්වකිවේ අසවල් පැත්තයයි කියාතුබු
නානම් මෙබඳු වාදයක් උපදිද ? රතනපාලටත් මොලකබලක් ඇත්
නම් විහාරයට්නොව අතුළුගමටම ග්‍රීවය හා මිණිබහණුත් වසන්ට
නියමකලේ එකාංශ පාරුපනයෙන් නොවනබව නොහැගේද ? එ
කාංශපෙරවීමෙන් නොකලහැකිදෙයක් කුමටවදාරාද ? එකපැත්
තක් වසන්ට නියමයනම් ඒ අසවල්පැත්තයයි මෙපමණ ඇත්තාවූ වි
නයපොතක නියම නොකරායයි සිතනවාද ? *

5 වෙනි ප්‍රශ්නයට දිනිබෙන උත්තරය මයුරත්වටි “එකංසික”
යන නම සගළසිවුරටත් වැටේයයි මොහුකියයි අනියුත් සියළු කා
රණාම අඟකතබා මේ කාරණය ඔප්පුදුන්නොත් මොහුගේ සියළු
කීම් පිළිගතයුතුයි.

---

* කායංවිවරිත්වාති ජත්තුම්පිඋරම්පි විවරිත්වා–යනුද–කායංවිව
රිත්වානිසීදතො අනාපත්ති–යනුද–විනයඅටුවායි, විවරිත්වානිසීදතො
ති විහාරවිය එකංසපාරුපනංසන්ධායවුත්තං ( වි. වි. ටී. )

6 ප්‍රශ්නයට කියන්නේ සියම් නිකායේ මේ වාදයට ඉනතින් ගණ්ඨිපාස බැඳීම ඇමිනීම පඤ්ඤමිත්‍රයාලුවා ඔප්පුකරණ වගකී හෝ දැයි එසේකලාවේ මේත් උත්තරද ?

7 වෙනි ප්‍රශ්නයට දිනිබෙන උත්තර මෙබඳු ධර්මවාදයකට ඕනෑ ශූනාලෙව් ධම්මාලෝක තෙරුන්නාන්සේ වාදයට මත්තෙන් දෙවුරවැසුවේ මන්දැයි ඇසූ ප්‍රශ්නයට තික්කඩුවේ මහානායක ස්ථවිරයන්වහන්සේ ඉහත එකල්‍රමැසුබවක් කියාතිබේ පිඩපාතයට දෙවුරවසන්නේ දෘෂ්ටානුගතියටළු, ඇසිතීජීවක පෙරවීමයයි කියන දෙවුර පෙරවීම කරන්ට ඉඩදී නායකස්ථවිරවරු බලාඉන්නේ මොනවාද ?

8 වෙනි ප්‍රශ්නයට දුන් උත්තර ටිකත් කදිමයි ධම්මාලෝකාදි තෙරවරු ටිකදවසක් කදමැඳපටියක් බැඳ පසුව අත්හැරියේමන්දැයි විචාලවිට "චීවරංපාරුපිත්වාකායබන්ධනං බන්ධමෙව වට්ටති" යන පාඨය ඉගෙණගන්ට කියාතිබේ. මේ පාඨය කත්තෘකාරකයෙන් නොකියා කර්මකාරකයෙන් කීනිසා රතනපාලලාගේ ආගන්තුකපටියට කිසිපිහිටක් නැත්තේය මේ ඇර අඳනය මතුපිට මුලදී බඳිනලද පටියම්බව දැනගත්තාටපසු ධම්මාලෝක තෙරුන්නාන්සේලා හැරදමු බව කීවානම් මීටවඩා නම්බුයි මේ පටිය විනයානුකූලනම් එකාංශ පක්ෂයේ සියළුදෙනම මේපටිය හැරදමුබැවින් ඔවුන්ට අලජ්ජියයි කියොත් වරදද ?

9 වෙනි ප්‍රශ්නය මරගානපත්පොටයි මේ පත්පොට කෝයි විනයපොතෙන් දුටුවාදයනු නොකිව්වාවරදයි. එසේම ඒපොටහැරදමා බත්කෑමට එනකොට පමණක් දෙවුරවසනඅයට අලජ්ජියෝය කියොත් වරදද ?

10 වෙනි ප්‍රශ්නයට දීතිබෙන උත්තරත් රතනපාලටම කොඩිවිනේ වීතිබෙන්නා "සගුණංකත්වා සංඝාටිංයෝ" යන්නෙන් පැවිදිවූ ශ්‍රමණලක්ෂණයට විරුද්ධ පෙරවුමක් තෝරුම්නොගතයුතුයයි කියාතිබෙතත් පැවිදිවීමේදී සහලසිව්රු සගුණකිරීමත් තුවා කෙලවරින් ශ්‍රීවය වැසීමත් මිණිබගන්දෙක වැසීමත් ගණ්ඨිකපාස ඇමිනීමත් නොපෙණේ ඇරත් රතනපාල මිත්‍රයාලාගේ නිකායේ එකාංශ පාරුපන කාරයන්ගේ අඳදක්වාත් තනිපටසිව්ර වරකටත් දෙපටසිව්රුවරකටත් සගුණ නොකොට පෙරවා ගණ්ඨිකපාසනාමුතා එකළරතිසකුත් සම්පූර්ණබෙල්ලත් සම්පූර්ණඅතකුත් ලැපැත්තේ අර්ධයකුත් ඇතීත්අතේ වැලමිටෙත් පගලත් නොවසා අතුළුගම්වදිනබව පමණක් පෙණේ, රතනපාලමිත්‍රයාගේ කතාව ඉද්දමගේ නුමුන් කියාව රොද්දවගේයි තවම සිව්රුපෙරවීමනිසා නිතරපැමිණෙන ඇවැත් පසින් නොමිදුනබව දැකිම ඛෙදයකි.

තවද රත්නපාලමිත්‍රයා මේවාදය පටන්ගත්තැන්පටන් අනත්‍ය නොමනියෙන් ප්‍රකාශකළහොත් කරුණුඑකාන්ත අසත්‍ය බොරුබව ඔප්පුකිරීමට එකම නිදසුනක්දක්වමි, මිටපුළුවන්නම් උත්තරදී නිදහස්වියයුතුයි; මැදුම්සඟියේ චූලසච්චකසූත්‍ර අටුවාවේ "සුවණ්ණවණ්ණොකායංවිවරි,, යනපදයට පන්සියයක් ක්ෂිණාශ්‍රවයන්වහන්සේලා විසින් ලියනලද අටුවාපාඨය මෙසේයි. රන්වන්කයවිවෘතකළාය යන මේ වචනයෙහි සියළුකය විවෘතනොකළේයි. සච්ඡකවරයෝ වනාහි ගන්ධිකයපාසයෙහි අවුනාමනාකොට සුපිළියත්කරණලද ශරීරඇත්තාහුම පිරිස්මැද දහම්දෙසනාහුවෙති .( බුදුන්ට ඩහදිය උපන්නායයි සැකයක් මිනිසුන්ට ඇතිවූ බැවින් ) භාග්‍යවතුන්වහන්සේ ගළුටළුව ඉදිරිපිට ස්ථානයෙහි සිවුරුපටඅල්වා සතරඟුලක්පමණ පහළව බැස්වූයේයි. ඒ සිවුර පහළබැස්වූ ක්ෂණයෙහි ඒ ස්ථානයෙහි රන්වන්රුස්පොදි පොදි ගැසී රන්කළයකින් වත්කරණලද රත්රන් රුස් දහරක්මෙන්ද රත්වලාගැබකින් නික්මෙන විදුලිසමූහයක් මෙන්ද නික්මී රන්මිහිඟක්වැනි මහත් ග්‍රීවයක් ඇති උතුමශිෂීය පැදකුණුකරන්නාහු අහසට නැගුනාහුය, භාග්‍යවතුන්වහන්සේ විනාහි කුමක්පිණිස මෙසේකළසේක්දයත් ? මහජනයාගේ සැකදුරුකිරීම සඳහායි, මහජන්තෙණේවනාහි ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ මට ඩහදිය නැතැයි කියති, සච්චකනම් නිගණ්ඨපුත්‍රයාට වනාහි යන්ත්‍රයකතංවා පෙළෙන්නාකුටමෙන් ඩහදියවැගිරෙයි ශ්‍රමණභවත් ගෞතමයන්වහන්සේ වනාහි ගණමු දෙපටසිවුරක් පොරවාහුන්නේය ඇතුළත ඩහදියඇතිබවවත් නැතිබවවත් කෙසේදැනගන්නට හැකිවේදැයි සැකකළේය; ඒ මහජනයාගේ සැක දුරුකරණුපිණිස ගලව ළව ඉදිරියෙන් සතරඟුලක් පමණ සිවුරුපාත්කොට කයදැක්වූයේයි † යනු අටුවාකථා මාර්ගයයි;

---

† සුවණ්ණවණ්ණංකායං විවරිති, නසබ්බංකායංවිවරි බුද්ධානාම ගණ්ඨිකංපටිමුඤ්චිත්වා සුපටිච්ඡන්නසරීරා පරිසතිං ධම්මංදෙසෙන්ති අථභගවා ගලවාටකසම්මුඛට්ඨානෙ චීවරං ගහෙත්වා චතුරඞ්ගුලමත්තං ඔතාරෙසි ඔතාරිතමත්තෙනපන තස්මිං, සුවණ්ණවණ්ණරස්මියො පුඤ්ජපුඤ්ජාහුත්වා සුවණ්ණඝටතො රත්තසුවණ්ණරසධාරාවිය රත්තවලාහකතො විජ්ජුලතාවියච නික්ඛමිත්වා සුවණ්ණමුරජසදිසං මහාඛන්ධං උත්තමසිරං පදක්ඛිණං කුරුමානා ආකාසෙ පක්ඛන්දිංසු කස්මාපන භගවා එවමකාසිමහාජනස්ස කංඛා විනොදනත්ථං මහාජනොහි සමණොගොතමො මය්හං සෙදො නත්ථිති වදති සච්චකස්සතාව නිගණ්ඨිපුත්තස්ස යන්තාරුළ්හස්සෙවිය සෙද පග්ඝරන්ති සමණොපන ගොතමො ඝනදුපට්ටචීවරං පාරුපිත්වා නිසින්නො අන්තො සෙදස්ස අත්ථිතාවා නත්ථිතාවා කථංසක්කාඤාතුන්ති කංඛා කරෙය්‍ය තස්ස කංඛා විනොදනත්ථං එවමකාසි.

( ප්‍රපචසුදනී–චූ–ස-සුත්තඨකථා )

රත්නපාලමිත්‍රයාට උපන්දසිට තේරුම්ගන්ට බැරුව ආකූලව්‍යාකූලව තිබෙන සුපටිච්ඡන්න පාරුපනය මේ පාඨයෙහිජේන "සුපටිච්ඡන්න සරීරා" යන පදයෙන් මනාසේ අවබෝධකටයුතුයි. එසේම සුපටිච්ඡන්නව පොරවන අමරපුර සියාම් නිකායෙදෙනෝම සංඝයා ධාතුවඩාගෙණමුන් චෛත්‍යයක්මෙන් කරගත බුද්ධොපස්ථානකරමින් බණපිරිත් කියන මඩුවලට එකළුරවසා පොරවනසැටිත් එසේ නොවන මහපිරිස්මැද බණපිරිත් දෙසිම්බලදී දෙළුරවසන සැටිත් ඉගෙණගතයුතුයි එකදසරුවක් එකකිසිල්ලක් එකඅතක් සහ ලැපැත්තේ අඩියකුත් විවෘතකොට සිවුරුපෙරවීම බුද්ධන්ගේ සිරිතනම් ඒ ස්ථානවලින් බුදුන්ට ඩහදියවැගිරෙණබව දැනගන්ට නුපුළුවන් වුනේමන්ද ? ඒ තැන්එලියේ තිබෙනවානම් කය විවෘකොට පෙන්නිමට වමහින් ඕවිරඅල්වා වම්පැත්තට නොගෙණ ගලවළුවෙන් සතරඟුලක්පමණ සිවුරපාත්කොට පෙන්වීමයයි කිවෙත් මන්ද ? ඒ විවෘතකළතැනින් පමණක් රශ්මිනික්මුනායයි කිවෙත් එලියේතිබෙන දකුණුඋදරුව දකුණත ආදියෙන් රශ්මිනික්මුණුවගක් නොකිවෙත්මන්ද ? පැහතක්එලියේ තිබුනානම් ගණදෙපට සිවුරක් පෙරවාහුන්බැවින් ඩහදියඇතිවගවත් නැතිවගවත් දැනගන්නේ කෙසේදැයි මගජනයාසැකකළේ මන්ද ? සැබවින්ම රත්නපාලකවදවත් මේ අටුවාපාඨය දුටුවානම් මේතරම් දුරට මේවාදයගෙණ ඒයයිනො සිතමු පුරාණප්‍රතිමාදියත් වෙනරටවල පවත්නා දෙළුරවැසිමත් ශාසනයකිඑටුවීමෙන් පසුවකටගත්තායයි රත්නපාලකියයි මේ අටුවා ලිවේකවුද ? මේ මහාවිහාරපරම්රාවේ වැඩද නැතහොත් දෙවුරව සන අයපසුව තනාගත්පාඨදැකියා මීටකෙළින්උත්තරදී නිදහස්වියයුතුයි.

පසුගියමගේ ලියවිල්ලේ සමන්තපාසාදිකා අටුවාවෙන්ගෙණ පැනිද සුනෙන් පිරිස්මැද බණදෙසන බුදුහුගේ දකුණු ග්‍රීහස්තය සිවුරුගැබින්නිකුත්කොට භික්ෂූන්ට අඩගාවදරණ බවත් මේ චූලලසච්චකසූත්‍ර අටුවාවේ බුදුන්ගේ ශිග්‍රගා හස්තපාදයත් පමණක් ගණවු දෙපට සිවුරන්වසා පොරවා බණදෙසූබවත් දමල්සූයයිමෙන් ප්‍රකටවිය මෙනිදසුන්වලට රත්නපාලදෙන උත්තරමොනවාදැයි දැන් ලෝකයා පුළුපුළබලාසිටී සැබවින්ම මිටනිසිඋත්තරදුන්නොත් රත්නපාල නැමදුම් ලියනකියතදේ සැබෑයයි ලෝකයාපිළිගනී රත්නපාල සුපටිච්ඡන්න ශික්ෂාවගැණලියුතාක් ඒකාන්ත අසත්‍යඅවිනය හිතුවක්කාරමතබව මෙහින් ලෝකයාට ඒත්තුනොගියේනම් මිටවඩාමැ

දගත් ශාක්ෂිමාලගහිබේ ඉතින්මේනිදසුන් නැමතිශාස්ත්‍රයෙන් රත
නපාලයන් වාදශිෂ්‍ය සිද්ධියේය මේගැණ තවදුරට රතනපාල ලිය
න්නේනම් මාවිසින් දක්වනලබන නිදසුන්වලින් රතනපාලයේ
කීර්තිය භාත්පසින්නැතිවී රතනපාලමිත්‍රයා කාසාවකණ්ඨකයන්
ගේ ආදිපුරුෂයාමෙන් ලෝකයාවිසින් පිළිගනුලැබේ.

ශු. රතනපාල මිත්‍රයාගේ මේ වාදයට පැමිණීම ශුදකොට ජය
ගනිමැයි සිතා සමසක් උතින්වැහැරිහිය දුර්වලපුරුෂයකුගේ හිස්අ
තින් ශුඬභූමියකට පැමිණීමක් වැනිවේ. මාවිසින් විචාල ප්‍රශ්නාවිස්සට
පෙල අටුවාදියෙන් උත්තරදියයුතුයයි විශෙෂවශයෙන් ඉල්ලූ නුමුත්
කිසි පොතපතකින් නිදසුන් නොදක්වා ජලතල ශෛවාලවැනි අ
මූලික උත්තරදුන්සැටින් ඒවා මේ වාදයට කිසිසේත් ප්‍රයෝජන
නොවනසැටින් පසුගිය මගේ ලියවිල්ලෙන් පහදදීඇති සිවුරු 'පෙර
විලලකෙසේවුවත් එයින් ආගම්' අදහාගැනීමට අපට බාධාවක්නැ
තැයි කියන අඥාන බෞද්ධයන්ගේ හිස්බස් පිළිනොගෙණ නියම ශ්‍ර
මණලක්ෂණය පිරිහෙන්නට යන මේ කාලයෙහි ඒ ප්‍රකෘතිමත්කර
ගැනීමට බෞද්ධයන් විසින් උත්සාහකටයුතුයි බුදුන් විසින් සිවුරුඇ
දිම පෙරවීමගැණ නියමකළ එක එක ශික්ෂාපදය අගරුවශයෙන්
කඩකරනනාගට එක එක දුකුලා ඇවතසිදුවේ එබඳුඅයට දෙනනාවූ
දනය මහත්ඵල මහානිසංසනොවේ ඇරත් ඔවුන්ගේ අධර්මලබ්ධියට
බලදෙනනාවූ දායකවරුන් ආගම පසුබැස්වීමට අනුබල දෙන්නෝ
නම්වෙත් මිට පණස්වශීයකට පමණ මතෙනන් අමරපුර රාජධානි
යට නොස් කලන්වසු ශික්ෂාකාමි අත්තුඩාවේ මහාසථවිරයන්වහන්
සේ එක්දිනක් ප්‍රමාණයට මදක් කුඩාවූ සිවුරක් ගැටවටුහන්වා පිඩු
පිණිසගියකල එක්තරා තරුණ ස්ත්‍රියෙක් පිඬපාතයදීමට අවුත් පිඩ
පාතයනොදී "ස්වාමිනි ඔබවහන්සේ "සම්ච්චචක්වං මණිබන්ධච අප
විච්ජාදෙන්තස්ස දුක්කටං" යි වදාලක්‍රමයට මිණිබහණ නොවැසීමෙ
න් සාපත්තිකවසිටියි මාගේ පිඩපාතය මහත්ඵලවන පිණිස ඒ ඇව
තින් නැගීසිටුවයි කීකල තෙරුන්වහන්සේ වහාම පාත්‍රයතබා මිණි
බහණවසා සිවුරුපොරවා පිඩපාතය පිළිගත්තෝය යන ආරණ්‍යවිය
උන්වහන්සේ ලංකාවේදි ප්‍රසිඬකළේය. ඉතින් දනට සම්පූර්ණ උ
රහිසකුන් අතකුත් කිසිලලකුත් අනිත්අතේ වැලමිට පටන් හස්ත
යත් එලියේ දමා ගම්වදිනඅයට දෙන දනය කෙසේ මහත්ඵලවේද
එහෙයින් දායකවරුන්ගේ පින්කෙත්වූ සඟරුවනගේ නොපෙණ
නනුණාග කෙසේවෙතත් ශ්‍රමණලිංගයවත් සම්පූර්ණකරගැනීමට

උත්සාහගතහුතුයි. දැනට මේ වාදය තීරණයකරගැනීමට තිබෙන
බාධාවනම් යු. රතනපාල මගේ ලිපුම්වලට හරියාකාර උත්තර
නොදී නිදවැටිමයි.

මිලගටත් රතනපාලගේ සැකදුරුකනුනා නම් තවත් ශාක්ෂිදක්ව
ශ්‍රී මැදුම්සඟියේ බ්‍රහමායු සූත්‍රයේදී බුදුන් පරීක්‍ෂාකරණු පිණිස යැවි
අභිපණ්ඩිතවූ උත්තරනම් බ්‍රාහ්මණ මානවකතෙම සත්මසක් බුදුන්හා
සමගවැස සියළු තතුදැන අවුත් තමුන්ගේ ආයසීවූ බ්‍රහමායු බ්‍රහමණ
යාහට මෙසේ සැලකෙළේය පින්වත්නි යනනාවූද සිටිනාවූද ඇතු
ළුගමට වදනාවූද ඇතුළුගම තුෂ්ණිම්භූතව හිඳිනාවූද ඇතුළුගම ව
ළඳනාවූද වළඳ තුෂ්ණිම්භූතව ඉනනාවූද වළඳ අනුමෙවෙනි බණව
දරනනාවූද නැවත ආරාමයට යනනාවූද ආරාමයටගොස් තුෂ්ණිම්
භූතවහිඳිනාවූද ආරාමයටගිය පිරිසට දහම්දෙසනනාවූද භාග්‍යවත්
හු දුටුයෙමි ආචාරින්වහන්ස ඒ භවත් ගෞතමයන්වහන්සේගේ ශ්‍රී
ශරීරයෙහි සිවුරු ඉතාඋස්කොටද නොපොරවන්නේය ඉතාපහත්
කොටද නොපොරවන්නේයයි සිවුරු පොරවනක්‍රමය ප්‍රකාශකළේ
ය * මේ දෙපදය අටුවාවේ තෝරාතිබෙන්නේ යම්භික්‍ෂුවක් තෙමේ
සිවුරු හණුඇටෙන් උඩටනගා පොරවාද ඔහුගේ ඒ පෙරවිට ඉතා
උස්කොට පෙරවීම නම යමෙක් ගොප්වසඳක්වා පාත්කොට පොර
වාද ඒ පෙරවීම ඉතා පත්කොට පෙරවීම නම නොහොත් යමෙක්
දෙපැත්තෙන් සිවුරනගා පොරවා උදරය එලියේදමාද ඒ පෙර
වීමද ඉතා උස්කොට පෙරවීමනම යමෙක් සිවුර ඒකාංශකොට තන
ය එලියේදමායේද ඒ පෙරවීමද ඉතාපාත්කොට පෙරවීමනම ඒ
ගෞතමයන්වහන්සේ මේ සියල්ලම නොකරණසේක † යනුයි මෙහි
භාවය ඇතුළුගම් වදනා සමහර භික්‍ෂුහු ගැටවටුගැන්වීමේදී ග්‍රීවය
වෙළන සිවුරුවැටිය ඉහලට ඇදහණු ඇටවැසෙනසේ පොරවති භා
ග්‍යවතුන්වහන්සේ එසේනොව ග්‍රීවය පමණක්නුවා කෙළවරින් ම

---

* නාච්ඤස්ස හොතොගොතමස්සකායෙ චීවරං අච්චුක්කඩ්ඪංහො
ති නාචඅචොක්කඩ්ඪං ( බ්‍ර. සූත්‍ර)

† අච්චුක්කඩ්ඪන්ති යොහි යාවගණ්ඨකට්ඨතො උක්ඛිපිත්වා පා
රුපතිනස්ස අච්චුක්කඩ්ඪං නාමහොති යොයාවගොප්ඵකා ඔතාරෙ
ත්වා පාරුපතිස්ස අචොක්කඩ්ඪංහොති යොපි උභතො උක්ඛිපි
ත්වා උදරං විවරිත්වා යාතිතස්සපි අච්චුක්කඩ්ඪංහොති යො එකංසංක
ත්වාථනං විවරිත්වා යාතීතස්සපි අචොක්කඩ්ඪං සඞ්ඝාතං සබ්බංන
කරොති ( ප්‍රපඤ්චසූදනී. බ්‍ර. සූ. අ. ථා. )

නාකොට වසා පොරවන්නේය විහාරයෙහි වසනකල සමහරභික්ෂූහු ඒකාංශව තනකිස එලියේදමා පොරවති භාග්‍යවතුන්වහන්සේ එසේනොව විහාරයෙහි වසනකල මනාකොට තනකිසවසා පොරවති කියාය මෙයින්ම භාග්‍යවතුන්වහන්සේ ඇතුළුගම දෙව්රවසා පෙරවූබවත් විහාරයෙහි එකාංශව පෙරවූබවත් උත්තරමානවකයාගේ වචනයෙන් පැහැදිලිවපෙනේ. මෙකී අච්චුක්කඩිසහ නම්වූ හණුඇටයට හැපෙනසේ හෝ හණුඇටය වැසෙනසේ හෝ පෙරවීම උභයාංශවසා පොරවන සමහරුන්ගේ දූනුදු දක්නාලැබේ ඒ සිව්රු වැටියඋස්කොට හණුඇටය වසන්නව එකාංශ පාරුතයෙන් එකාන්තයෙන් නොහැකිවේ සර්වඥයන්වහන්සේ ඇතුළුගම්වැදීමේදී සහ වීහාරයේ වැඩඉන්නාකලත් පොරවනදෙයාකාර පෙරවීම උත්තරමානවකයාගේ වචනදෙකින් මනාසේ අවබොධකටයුතුයි මෙයින් සැකදුරුනූනානම් තවත් උදාහරණයක් මෙන්නබලනු රඨපාල සූත්‍රයේදි යවකීය කුලගෙට පිඩුපිණිස ආරඨපාල තෙරුන්වහන්සේ ඒගෙයි දාසිය විසින් ඇඳිනාගත් ආකාර දක්විමේදි භික්ෂාව පිළිගන්නාපිණිස පාත්‍රය නැඹුරුකරන්නාවූ ඒ රඨපාල තෙරුන්ගේ මිණිබහන්දෙක පවන් දැනේද යටඅඳනා කෙළවර පටන් දෙපයේද නැගතිය යන වචනයකියන්නාහුගේ ශබ්දයේදනිමිත්තය ගත්තේයි හෙවත් පිටි අළු ආදිය බලන්නාහු රන්වන්ඉබිපිටි වැනිවූ මේ පිටි අළු පිටිපළු සහ ගිරියල් වැටි සමානවටවූ ඇඟිලිද මිහිරිකටහඬද අප රඨපාලපුත්‍රයාගේ ඇතුල්පතුල්ආදියවැනිවෙයි කියා ගිහිකාලයෙහි සලකුණුගත්නාලදවිරු ආකාරයගත්තේය ‡ යන මෙහි ඇතුල්පතුල් පමණක් දකින්නටත් එලියේතිබෙනවායයි රතනපාලලා කියන දකුණුදසරුව කිසිල්ල දකුණුතනකිස දකුණුඅත වම්අතේ වැලම්ටින් පහළ යන මෙකීතැන් නුදුටුවේත් මන්දැයි සිහියෙන් යුක්තව බැලියයුතුයි මෙහි ග්‍රීවයෙන් උඩ හිසගැණ නොකීවේ පිඩු

---

‡ හත්‍ථානන්ති භික්ඛා ගහණත්‍ථං පත්තං උපනාමයතොමණිබන්ධතොපපභුති විනාකම්පි හත්‍ථානං පාදනන්ති නිවාසනන්තතො පඨාය විත්නම්පිපාදනං සරස්සාති සචෙතං භගනිති වාචං නිච්ඡාරයතො සරස්සවනිමිත්තං අග්ගහෙසීති හත්‍ථ පිඨිආදිනි ඔලොකයමානාපුත්තස්ස මෙරඨපාලස්ස විය සුවණ්ණකච්ඡප පිඨිසදිසා ඉමාහත්‍ථපාද පිඨීයොහරිතාල වට්ටියො විය සුවට්ටිතා අඟුලියො මධුරොසරොගිනි කාලෙ සලලක්ඛිත පුබ්බං ආකාරං සල්ලක්ඛෙසි අග්ගහෙසී සංජානි. ( ප්‍රපඤ්චසූදනී, ර. සු. අ. ඨා. )

සිණිස සිටින භික්ෂූන් යම සෙලනලද ඇස් ඇතිව සිටින බැවින් මුහුණු බලන්නට නොහැකි බැවිනි.

රතනපාල මිත්‍රයාගේ පක්‍ෂයෙහි "සබ්බචීවරංමණිබන්ධව අපටිච්ඡාදෙන්තස්ස දුක්කටං" යන දෙශනාපාඨය එකම්ණිබගණක පටන්යයි තෝරණ බවක් ආරම්භ නුමුත් මේ රඬපාල සූත්‍රඅටුවාවේ "මණිබන්ධතොපපභූතිච්ඡින්නම්පිගත්ථානං" යන වචනයෙන් ඒ තේරුම හාත්පසින් තුවජ නිඃසිත ලාමක බොරු තේරුමක් බව පෙණේ. මිත්‍රයාලා එකම්ණිබගණක් පටන්යයි තේරුම්කරණ නුමුත් මිත්‍රයාගේ පක්‍ෂයේ එකාංශපාරුපනය කරන්නන්ගේ වචනේවත් වැලමිටෙන් පහළ වැසීතිබෙන බවක් කවදාවත් නොපෙණේ. පත්පොට හැනුවා වගේ එතනටත් සිවුරු කොපුවක් තනාගන ඊට අත්පොට යයි නමක් තබාගන්ට නරකද? පාරාජිකාඅටුවාවෙ සුදින්නවස්තුවත් මෙසේමැයි. තවද මහාසච්චකසූත්‍රඅටුවාවේ සර්වඥයන්වහන්සේ විහාරයේ වසනකල පිණ්ඩපාත ගමනය දක්වා විහාරයේ වියන ආකාර දක්වීමේදි භාග්‍යවතුන්වහන්සේ මෙබඳු සමයෙහි රත්වූදෙපට අඳනය ඇඳ කාබගණ බැඳ පාංශුකූලචීවරය එකාංශකොට පොරවා ගඳකිළියෙන් නික්ම බික්සඟුන් පිරිවරා ගඳකිළි මිදුලේ වැඩ සිටින්නෝයයි පෙණේ. * නුමුත් ඇතුළුගම් වදනාකල බුදුරජානන්වහන්සේ කෙසේ නික්මෙනවාද යන බව සෙඛසූත්‍රඅටුවාවේ මෙසේ දන්වානිබේ. කපිලවස්තු නගරයෙහි ශාක්‍යයන්ගේ සන්ථාගාරශාලාව පිළිගැණීමට සුදුසු කලැයි දන්වූකල්හි භාග්‍යවතුන්වහන්සේ ලාරසින් විසිතුරුවූ රත්කොබලීල මල්පැහැති රත්වූ දෙපට අඳනය කතුරකින් පියුමක් කපන්නෙකුසේ පිරිමඬුළුකොට හොමඬු ළුවසමින් ගැඳ රන්භවඩියකින් පියුම් මිටියක් වටකරන්නෙකුසේ විදුලියක්සේ සශ්‍රිකවූ කාබගණ බැඳ රත්කම්බිලියකින් ඇත්කුඹක් වසන්නෙකුමෙන්ද සියක් රියන් උසැති රන්ඇගෑයෙක පබළු දැලක් දමන්නෙකු මෙන්ද රන්සෑයෙක රන්කම්බිලි සැට්ටියක් දමන්නෙකු මෙන්ද ගමන්ගත් පුන්සඳක් රත් වලාපටලයකින් වසන්නෙකු මෙන්ද කාශුන්පව් මුදුනක අති රක්ත ලාරස ඉයින්නෙකු මෙන්ද සිත්කුළුපව්මුදුන විදුලියෙන් වටකරන්නෙකු මෙන්ද චක්‍රවාල

* භගවාච එවරූපෙ සමයෙරත්තදුපට්ටං නිවාසෙත්වා, කායබන්ධනං බන්ධිත්වා පංසුකූලචීවරං එකංසං පාරුපිත්වා ගන්ධකුටිතො නික්ඛම්ම භික්ඛු සඞ්ඝපරිවුතො ගන්ධකුටිපමුඛෙඨත්වාසි.

(ප්‍රපඤ්චසූදනී-ම-ස-සු-ඨා)

සිණෙරු යුගන්ධර සහිතවූ මහපොළව සොලවා පිළිගන්නාලද නුග පලවන් උතුම් රක්ත පාංශුකූල චීවරය පොරවා ගඳකිළි දොරින් නික්ම කසුන්ලෙණකින් නික්මුත් සිංහයෙකු මෙන්ද උදගිරිහිසින් නැගි පුන්සඳක් මෙන්ද නැවත භික්ෂූන්ගේ ආගමනය බලා ගඳකිළි මිදුලේ වැට සිටියේය † යන මේ දෙතැන පාරුපනය හා ඒකාංශ පාරුපනයත් යන වචන දෙක වෙනස්කොට තේරුම්ගැනීමට උපදෙශය නම් "ඒකාංශපාරුපන" යන සවිශෙෂ වචනයෙන් විහාරයේ වැඩවසනකල ඒකාඋර වසා පෙරවීමත් ගමට වඩිනාකල එබඳු විශෙෂයක් නොකොට "පාරුපන" යන අවිශෙෂවචනයෙන් කී බැවින් උභයාංශවසා පොරවන බවත් දතයුතුයි. "සතිහිසම්භවෙ ව්‍යභිචාරෙව විසෙසනං සාත්ථකං සියා" යන න්‍යායක්‍රමයේ හැටියට වෙනසක් ඇතිකල්හිම විශෙෂණය සාර්ථකවෙයි. "ඒකාංශපාරුපනය-පාරුපනය" යන දෙපදයන් අතුරෙන් මූලපදයට ව්‍යභිචාරය ඇති බැවින් ඒකාංශශබ්දය විශෙෂණකෙළේයි. පාරුපන යන දෙවෙනි පදය ව්‍යභිචාරයක් හෙවත් වෙනසක් නැතුව දෙඋර වසා පොරවන බැවින් විශෙෂනයක් නොයෙදූයේය. ඒකාංශපාරුපනය පාරුපනය යන ශබ්දදෙකම පෙළඅටුවාදියේ ආබැවින් විශෙෂණය යෙදූවමනාතැන නොයොදා කියත්නම් ඒ යෙදීම අලංකාරශාස්ත්‍රයෙහි ආවාවූ හෙතුදොෂපංචකය අතුරෙන් ව්‍යභිචාරදොෂයට ඇතුළත් වේ. එබඳු දොෂයන්ගෙන් යුක්තකොට පුරාණ පොත්පත් රචනා

---

† එවංචිරකාලෙ ආරොචිතෙ භගවා ලාඛාරසෙනතින්තරත්තකොවිළාරපුප්ඵවණ්ණං රත්තදුපට්ටං කත්තරියා පදුමංකන්තෙන්තො විය සංවිධාය තිමණ්ඩලං පටිච්ඡාදෙන්තො නිවාසෙත්වා සුවණ්ණපාමඞ්ගෙන පදුමකලාපංපරික්ඛිපන්තො වියවිජ්ජුලතා සස්සිරිකං කායබන්ධනං බන්ධිත්වා රත්තකම්බලෙන ගජකුම්භං පරියොනද්ධන්තො විය රතනසතුබ්බෙධෙ සුවණ්ණග්ඝිකෙ පවාළජාලං ඛිපමානො විය සුවණ්ණචෙතියෙ රත්තකම්බලකඤ්චුකං පටිමුඤ්චන්තො විය ගච්ඡන්තං පුණ්ණචන්දං රත්තවලාහකෙන පටිච්ඡාදයමානො විය කඤ්චනපබ්බත මත්ථකෙ සුපක්කලාඛාරසං පරිසිඤ්චන්තො විය චිත්තකූට පබ්බතමත්ථකං විජ්ජුලතාය පරික්ඛිපන්තොවියච චක්කවාළසිනෙරුයුගන්ධරං මහාපඨවිං චාලෙත්වා ගහිතං නිග්‍රොධඵලසමානරත්තවරපංසුකූලං පාරුපිත්වා ගන්ධකුටිද්වාරතො නික්ඛමිත්වාකඤ්චනගුහාතො සීහොවිය උදයපබ්බතකූටතො පුණ්ණචන්දොවියච නික්ඛමිත්වා ගන්ධකුටිපමුඛෙ අට්ඨාසි

(ප්‍රථමසුදනී-සෙ-සු-අ-වා)

කාලේයයි කියනවාද? මෙහි කී ගජකුම්භය වැසීමද රන්ඇඟෑමෙන්
පබළුදැල දැමීමද රන්සෑයෙහි රත්කුඹිලිසැට්ටය දැම්මද යනාදී උපමා
වලින් එකපැත්තක් විවෘතකොට පෙරවීමක් හැඟේද කියා පරීක්‍ෂා
කටයුතුයි. ඉතින් රතනපාල මිත්‍රයාගේ මෝඩයන් රවටීමට තුණු
රුවන් සපථකොට බුදුන් කිසිකලක දෙඋරවසා පෙරවීමක් කළේ
නැත යන කිම කොපමන අපරාධයක්දැයි බැලියයුතුයි.

අප්‍රේල් මස 16 වෙනි දින ලංකොදයෙන් රතනපාල මිත්‍රයා
නැවතත් අපේ ප්‍රශ්න විංශතියෙන් ඉතුරුවූ දෙකකට උත්තරය
කියා වල්පල් ටිකක් ලියා තිබේ. දූත් දූත් රතනපාලට වාදකළා
ඇතිවෙලා වගෙයි. පටන්ගැන්මේදී නිරගණත් පිටුනණත් පිරෙන්
නට පුරාතීත ලි නුමුත් දූත් දූත් ඉඳගිටලා සිහිමුළාවෙන්නන් දෙඩ
වන්නාක්මෙන් කාරණයට නොගැළපෙන විකාර බොකවත් ටිකක්
ලියන්ට පටන්ගත් බැවින් රතනපාලට හොඳටම හනි වැටුනායයි
සිතමි. රතනපාලට මේ අධර්ම අවිනය අශ්‍රමණ ලබ්ධිය ස්ථිරකරන්
ට ඉඩලැබේයයි නොසිතුව මැනවි. රතනපාලගේ ලියුම්වල ඇත්
තාවූ ආගම නිදර්ශන මොනවාදැයි නුවනැත්තෝ මෙනෙහිකරත්
වා මාවිසින් විචාරණලද ප්‍රශ්නය රතනපාලලාගේ පක්‍ෂයෙහි සිවුරු
පරිභොගයනිසා ආචීර්ණකල්පවශයෙන් පැමිණෙන ඇවැත් පස
මහාවිහාර පරම්පරාවේ භික්‍ෂූන්ට තුබුනාද? යනුයි ඊට රතනපාල
දීතිබෙන උත්තර ඒකාරණය මාගේ වාතීපොතකින් බලාගන්නට
කියාය එබඳු වාතීපොතක් මාවිසින් කිසිකලෙකත් නොලියනලදී.
"ගැටවටු සගුණාදිය දූක්වූ කඳුවත්වල තබා නිවාසන පාරුපනාදි
සෙඛියවත්හිද තතු නොදත් අප මිත්‍රයත් මහා ගැඹුරු ප්‍රශ්නමෙන්
ලොවට අඟවා ලියන කියන වාග් විකාරගැණ අපි ඉතා අනුකම්පා
කරමු" යනු රතනපාලගේ වාගාඩම්බරයි ගැටවටු සගුණාදිය කඳුවත්
වල ඇතිබව කිවාට යතුනියි. මේශාසනෝ නැති ගැටවටුවක් කඳු
වත්වල කොහින්ද? රතනපාල කවදත් ඉහල කල්පනාව ඇති
අව්‍යක්තයෙක් බවත් තමන්ගේ වාසිය පිණිස ධර්මය අධර්මයකර ලො
වරවටන්නෙක් බවත් දූත් කාඅතරෙත් ප්‍රකටයි. මහාවිහාරපක්‍ෂ
යේ එක උරවැසිම අපි පවත්වාගන එන්නෙමුයයි නිතර අත්තුක්
කංසන පරවම්භන වචන පළකරණ අප මිත්‍රයාගෙන් විචාලේ සිවුර
පිළිබඳව පැමිණෙන ඇවැත් පසකට සියාම්නිකායේ භික්‍ෂූහු කලක
පටන් පැමිණෙන වාද නැද්ද? යනවගයි ඊට දියයුතු උත්තරය
එක්කෝ මේ මේ හෙතු නිසා ඊට ඇවැත් නැත්තේය. එක්කෝ
ඇවතට පැමිණෙනවාය යන්න පමණයි. ඒ ප්‍රශ්නයට ඉතා එහුඩින්
ඤවංකව උත්තර දියහැකිව තිබියදී මේ දෙඩවාපු වල්පල් හැලි ගෑණ

සිතාබලනකල මේ රතනපාල ආගමධර්මයක නිරණයක් කරවාගතයුතු පඬිතයෙක් හෝ අවංක ශ්‍රද්ධාවන්තයෙක් හෝ නොවන බව ඔප්පුවේ. කතාව ඇද්ලාවෙන් ගමන පසින් කිවාක්මෙන් රතනපාලලා කවදත් කතාවෙන් ජයගන්ට මොකවත් බොරු බේගල් පලවා අපායේ දරපෙනෙළිවිමට ලෑස්තිව සිටින කොටසක් බව ප්‍රත්‍යක්ෂව පෙණේ. මගේ ප්‍රශ්නයට නිසියාකාර උත්තර දුන්නානම් රතනපාලලා සිවුර සම්බන්ධවම ඇවැත් පසකට නිතර පැමිණීම කලකසිට පුරුදුකරගණ ආබව ප්‍රකටවේ එබඳු අය මහාවිහාර පරම්පරාවෙන් නොව එම විහාරේ විසූ විඝාසාදකයන්ගෙන් බෝවුනායයි සිතියහැකිවේ. ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ පවා ප්‍රමාදයෙන් සිදුවූ ඇවතින් සත්ඇවිරිදි සාමණේරයන්ගේ වචන අසා නැගිසිටි බව ආගමෙන් පෙණෙද්දී මේ පුද්ගලයා තමන් විසින් පුරුදුකරගණ ආවෛතුල්‍ය සිරිත් වැරදිබව මෙපමණ පොත්පතින් නිදසුන් පෙන්වාකියාදෙද්දීත් ඒවාට කෛරාටික ප්‍රයොග වචන කියා තමන්ගේ පක්ෂය සනසන්ට කරණ ප්‍රයත්නයකසැටි බැළුවාට මන්ද?

රූපිය පටිගහන ශික්ෂාපදයට හොඳට තටම තටමා සුරගුරු මෙන් අභිඛියවා නැගිටිනකොට ගුරුගෝල දෙන්නාගේම ඔඩොක්කුවලින් තඹ රිදී මුදල් බිමටවැටී ඇහිඳගණිත්නම් වෙන කීම් කොරුම් ගැණ කුමට කියමුද? බුදුන්ට මුවාවී ඉනබඩ වඩන්ට හිතුවාමිස මේ ආගම පිළිපැද පරලොව වැඩසාදගන්ට උත්සාහයක් හිතෙන්වත් නැති බව මේ වාදයෙන් කාදිමට ප්‍රත්‍යක්ෂවිය. බුඩවචනය දූත දූත අනිත් පිට පෙරළන්ට වෑයම්කරන්නේ අමරපුරනිකායෙන් මේ සිරිත බාරගන්නාය යන නින්දාවෙන් මිදෙන්ටත් අපි අසවල් වර්ගයෙයි කියා මේ පෙරවීමෙන් ජාතිය අගවන්ටත් අපේ සතුරාගේ පිටුදකුම්හයි උපදවාගත් බලවත් ක්‍රොධයෙනුත් බව දූන් ලොව ප්‍රකටයි. නුමුත් එක පාපිෂ්ටයෙකුගේ මෙබඳු ලාමක අදහස් නිසා මේ ආගමේ නියම චාරිත්‍රධර්මයක් දූත දූත වරදවා නිස්කාරණයේ අපායගතවිම අන්‍යයන්ට යුතුනොවේ. ඉළුලෝනේ සහ ලංකාවිපයේත් උගත් පක්ෂය එකළුර වසා ගම්වැදීම හාත්පසින් වැරදියයි ප්‍රතික්ෂෙපකෙළේය. කිසි ආගමධර්මයක් නූගත් වනචර විකාදෙනෙක් පමණක් ජාතිය රැකෙන්නේ මේ එකළුරයෙනැයි සිතා වාදකාරයි. මේගැණ රුවටී පරලොව වැඩකැමති සත්පුරුෂයෝ මේ උතුම් බුද්ධොත්පාදය නිෂ්ඵලකර නොගනිතැයි විශ්වාසකරමි. මගේ 12 වෙනි ප්‍රශ්නය බුඩාදී උතුමන් විහාරාරාමාදී සුදුසුතැන් හැර ඇතුඑකම් වැදිමට එකළුර වසා පෙරවූබව ඔප්පුදියහැකිද? යනුයි ඊට උත්තරය බුඩාදී උතුමන් කිසිතැනකට උභයාංශය වසා පොරවා

නොගියේය යනුයි. ඇරත් ඔහුගේ පතුයෙනුත් එබව් ඔප්පුදුන්වග
කුත් කියයි. ඒ ඔප්පුදීම රහසේ කළ වැඩක් වියයුතුයි. කවදවත්
එබඳු කාරණයක් ඔප්පුදුන් වගක් නුදුටුයෙමි. රජගහනුවර සිට නා
ලන්දවට අද්ධානමාර්ගයෙහි වැඩිය බුද්ධානුබුද්ධ ශ්‍රාවකයන්වහන්සේලා
අද්ධානමාර්ගයට සුදුසුපරිද්දෙන් සිවුරු ඒකාංශකොට පොරවා සැර
යටි අතින්ගෙණ ගිය බවක් ආගමෙන් පෙණේ. මේ ගමන ඇතුළු
ගමටත් සමානයයි යම්අඥානයෙක් සිතානම් ඒසමගම සැරයටි රැගෙ
ණයාමක් ඇතුළුගමටකොයින්දැයි කල්පනාකටයුතුයි. සැරයටි ගෙණ
යාමෙන්ම ඒ මාර්ගය අද්ධානමාර්ගයක් බව නොහැඟුනේ අවාසනාව
න්තකමකි. එක්තරා ලංකොදයපත්‍රයක රජගහවත් නාලන්දවත්
කොළඹත් මොරටුවත් දෙකට සමානයයි කියාතුබුනා දුටුයෙමි.. එයින්
හැඟෙන්නේ ඒ කාලයේදී ඒ ගමනට රතනපාලත් ඇතුලත් බවකි.
අද්ධානමාර්ගයට පිළිපන්නාට පසු යම් ගමක් පසුකරයන්නට සිදුවු
නානම් අද්ධානමාර්ග සංඥවෙන් ඒගම ඒකාංශයෙන් පසුකරගියාට ඇ
වැත් නැතිබව රතනපාල විසින් කල්පනාවට ගතයුතුයි. නුමුත්
එසේ යන ගමනකදී අතරමග සම්භාවු ඇතුළුගමට පිඬු පිණිස හෝ
දහම් දෙසන්නට හෝ යාමක් වුනිනම් එහිදී සියලු අන්තරඝරවත්
සම්පූර්ණකොට යායුතුයි. මෙයින් රතනපාල පෙන්නුම්වාය කියන
ඒකාංශ ගමන නිෂ්ඵලවුනා, ඉතින් මත්තෙහි එබඳු තැන් සෙවීමට
උත්සාහකටයුතුයි.

රතනපාලගේ ආයුෂ්කල්පය මුළුල්ලේ දහළුවත් ඔය එකපැත්
තක් එලියේදමා ලජ්ජා මුවානොකොට බුදුන් රහතුන් සිවුරු පොර
වා ඇතුළුගමට ගියාය යන කිම ඔප්පුදෙන්ට නුපුළුවන දෙවදූතයන්
අත තබන්ට භයවන සථානය මෝඩයන් විසින් පාගනු ලැබෙයි.
යන කිම මෙන් රතනපාලවත් ගුරුවරයාවත් මෙහි ආගම නියමය
යන්තම්වත් දනිත්නම් විනය ප්‍රඥප්තියක් වරදවා කිමේ ආදිනව
දනිත්නම් මේ වාදයට ඒකාන්තයෙන් නොබසින්මය, රතනපාල
දූතට ලබ්ධිය වෙනස්කරගත්තාට එයින් අපහාසයක් වේයයි ලජ්ජා
නොවී මරණින්මතු මහාකල්පයක් නිරාදුක් විඳිමට මග සලස්වා
නොගෙණ ඉතින් ඔය අධර්මලබ්ධිය දුරලීමට මෛත්‍රියෙන් ආරාධනා
කරමි. මේවා මදිවෙලා පහන්කත්‍ර සමග අභිධර්මවාදයකුත් කරන්
ට දඟලන බව පෙනේ. පසුගිය කාලවල කළ අභිධර්මවාද මතක
නම් අභිධර්ම වාදයට නොබසී, පහන්කත්‍ර ගැරඬිත්ට ගල්ගසායයි
නොසිතමි. කතෝලිකයන් සමග බුද්ධධර්මය ගැණ වාදකිරිමත් අභි
ධර්මය ගැණ රතනපාලලා සමග වාදකිරිමත් එකසමානයි. විනයා
ධර්මය සම්බන්ධවූ එක වචනමාත්‍රයකුත් නුහත් අබ්බිඹයන් සමග
කුමන ධර්ම වාදද?

තවද මේ මස 28 වෙනි දින දතමින් නිකුත්කළ ලංකොදය
පත්‍රයේ මේ වාදය සම්බන්ධවම නමින් විදර්ශීවූ දූස්සාහෙක් සිඛාජී
ජිත්වතෙකුට උත්තරයයි දිග යාම්හැල්ලක් තිර නවයමාරක් පිරෙන්
ට ලියාතිබේ. මෙසේ දිගට ලියන්නේ ආවේ කොහෙන්ද? ගියේ
කොහෙන්ද? කියා දැනනොගන්නවත් මෝඩයන් මුළාකිරීමටත් පම
ණයි. නුමුත් සිඛාජීලාමෙන් අප රවටන්ට ඉඩලැබේයයි නොසි
තනු. ඒ තිර නවයේ ලියූමෙහි මුල් අදහස විනය අටුවාවේ "උභො
කණ්ණෙසමංකත්වා" යනාදීන් ප්‍රකාශවූ පෙරවුම් වත සම්පූර්ණ
කරණ භික්ෂුහු විසින් ඒකාංශයෙහි කළාවූ චීවරයාගේ පිටිපස බඩබස
එල්වෙන්නාවූ සිව්රැ කොන්දෙක ඇතුපිටඑැ මීණිගෙඩි දෙකක්
මෙන් සමකොට පිරිමඬුළුකොට පෙරවියයුතුයි. මේ පරිමඩල නිවා
ශනයද ඒකාංශවූ පරිමඩල පාරුපනයද යන ඇඳුම් පෙරවුම් ශික්ෂා
පදයෝ දෙදෙන ගම්ටය කියා හෝ වෙහෙරටය කියා හෝ සථාන
යක් නියමනොකොට අවිශෙෂයෙන් හෙවත් සියලු තැනටම සාධා
රණවශයෙන් වදරණලද්දහුයයි කියා ඕනෑහැටියට තෝරා හැමතැ
නටම ඒකාකාරවූ ඇඳුම් පෙරවුම් වත කියාතිබේ. බෞධරජ්ජත්ගේ
රටකදී මෙසේ මේ පාඨය තේරුවානම් විදර්ශිගේ දිව ඇද උල්ග
හන්ට වටී; මේ පාඨයෙහි ඒකාංශව පෙරවන්ටය යන අදහස නෙ
යාජීවිශයෙන්වත් නිතාජීවශ්‍රයෙන්වත් ඇවිත් නැත මෙහි කියන්
නේ කොන් උස් පහත් නොවෙන්ට සමකිරීම පමණයි. මේ පාඨ
යෙන් හැමතැනටම ඒකාංශව පොරවන්ට කළ නියමය පෙන්වා
දුනහොත් මොහුට තව පලාතක නායක පදවියක් දෙන්ට වටී. මෙ
බඳු බොරු පත්‍රවල ලිවීම දවල් හෙවල් බිඳීමක් වැනිවේ. නුමුත්
ඔබඳු හොරු අල්ලාදීමට නිතර මම සූදානම්ව සිටිමි. විහාරයටත්
ඇතුළුගමටත් සාධාරණ පෙරවීම මෙහින් කියා අවසන්කළානම් මේ
ලියූ මේ මුල්භාගයෙහි "ගණ්ඨිකං පටිමුඤ්චිත්වා" යනාදීන් ගැටපාස
ඇවිනිමකුත් එක මැණික්කට්ටුවක් වැසීමකුත් ග්‍රීවය වැසීමකුත්
කියමින් අර සාධාරණයකි පෙරවීමට නැති මරගාත හුගක් ඇතුළු
ගමට කටයුතුය කිවේ පිස්සුවෙන්ද? ඇරත් මොලේ ඇත්නම් එක
මැණික්කට්ටුවක් වසන්ට අනුදැන වදළ හෙතුව යුක්තිය කුමක්දැයි
සලකන්ට වටී. අප මිත්‍රයාලාගේ වම්පැත්තේ මැණික්කට්ටුවෙන්
පුරුෂව්‍යඤ්ජනයක් හේම ලියලා තිබෙනවාද? මේ අඥාන විදර්ශිට
ආගම නොතේරේනම් ලොකයුක්තියවත් නොහැගේද? ඇරත්
ඒකාංශිකයන්ගේ එක මැණික්කටුවක්වත් ග්‍රීවයේ කොයිතැනක්
වත් වැසේදැයි පරීක්ෂාකටයුතුයි. ඒකාංශකළ සිව්රේ කරපිට දමු
පටින් වැලමිටවත් නොවැසී තිබියදී මැණික්කට්ටුව කෙසේවැසේද?

සිවුර කරට දැමීමෙන් මීගිහුබෙරකඳක් වැනි ග්‍රීවාය වැසේද? මොහු විනය අටුවාපාඨයක් ලියාගත ඊට යෙදූ බොරු සත්තාය හාත්පසින් බොරුවූ බව “ගණ්ඨිකං පටිමුඤ්චිත්වා” යනාදින් කිවිස්සරයෙනුත් මේ ඒකාංශ පාරුපනාය හැමතැනටම සාධාරණයයි කී බොරුවෙනුත් තේරුම්ගතයුතුයි. ඇයි ඉලව්වේ හැමතැනටම සාධාරණවූ පෙරවිල්ල කියා ඉවරවී නැවතත් ග්‍රිවය වැසීමක් මැනිණික්කට්ටු වැසීමක් ගැටපාස ඇවිනීමක් කුමට කීයේද? මොහු තේරුම්කළ අටුවාපාඨයෙන් උගන්වන්නේ පෙරවීමේ වැසිය නොවැසිය යුතු අඟ විභාගයක් නොව පිරිමඬුළු කිරීම් මාත්‍රයක් බව අවබොධකටයුතුයි. මොහුගේ තිර හතරගමාරම මෙයින් බිඳවැටුනා.

මීලඟට තිර දෙකෙකින් වදරන්නේ රජගහවත් නාලන්දවත් දෙක අතර අධ්වානමාර්ගය ගම්ගෙවතුවලින් ගැවසීගත් බවත් ඒ ඇතුළුගමක්වූ මාර්ගයෙහි බුදුන් ප්‍රධාන රහතුන්වහන්සේලා ඒකාංශව වැඩිය බැවින් ඇතුළුගමට ඒකාංශපෙරවීම යුතුබවත්ය ශික්ෂාපදටීක තේරුම්ගත් රහ මෙයින් පෙණේ. ශික්ෂාපදය තේරුම් ගන්නානම් මේ ජේත බලන්ට ඕනෑතැන. නුමුත් ඔය දෙනුවර අතර ඇතුළුගමය කී සියලු වචනම විදර්ශිගේ “තාරාගණ පරිවුතො විය ප්‍රණ්ණචන්දො මිගපක්ඛිනම් පිවකඛුනි පිණයති පගෙව දෙවමනුස්සානං” යන පාඨයෙන් බොරුබවට පැමිණියේය. මේ මගදෙපස වාසයකළ මුවන් සහ පක්ෂීනුත් ඇතිකර ඇරපු සතුන්ද වනයෙහි ස්වභාවයෙන් වසන සතුන්ද කියා සොයාගතයුතුයි. අනුරාධපුරනුවර පාරේ මාගම්පුරපාරේ මහ කැලෑවල යනකල මිස කොළඹ පටන් හම්බන්තොටදක්වා යන මාර්ගයෙහිවත් වල්මෘගපක්ෂීහු දකින්ට නොලැබේ. කපිලවස්තු නගරයට ඒකාබද්ධවු මහාවනයක් පිහිටා තබුනේය එමෙන්ම රජගහ නාලන්ද දෙකට අතර මේ සැතැප්ම ස්වල්පය මහ කැලෑවක් බව ඒ මාර්ගයේ සමහවූ මෘගපක්ෂීන් නිසාම දැනගතයුතුයි. ඇරත් සැරයටි ගෙණයාම ඇතුළු ගමට කවදාවත් පවත්වන සිරිත නොවේ. ඉතින් ඒ විදර්ශිගේ තීරනාවයමාරෙත්ම ගතයුතු ප්‍රයොජනය කුමක්ද?

මේ වාදය සඳහාම ඒකාංශපක්ෂය ගම් නියම්ගම්හි සම්මාදන් කොට පත්‍රයක් පටන්ගෙණ සකල ඒකාංශිකයන් විසින් විවාදකරණයෙහි දක්ෂාභිෂෙක ඇති යු. රතනපාල නමැති වාදීවරයෙක් සොයාගණ මේ වාදය පටන්ගත්තේ ඒකාංශිකපක්ෂය විසින්ම බව ලංකාවාසී කවුරුත් දන්නා ඇත්තකි. එබැවින් මොහු නියම වාදිවරයෙකැයි සිතා මාවිසිනුත් ඔහුට සුදුසු පිළිතුරු ලියන්ට පටන්ගන්නා ලදි. නුමුත් රතනපාල අවපක්ෂයෙහි චණ්ඩුශාමෙන් සතියෙන් සතිය

දුර්වලභාවයට පැමිණ දනට ඔහු සම්පූර්ණයෙන් නිරුත්තර භාවයට පැමිණි බව පෙනේ. ඔහු විසින් නිරන්තරයෙන් ගෙනපාන්නේ මේ සස්නේ කවදවත් උභයාංශ පෙරවීමක් නොපැවතුනේය යන වචනය පමණ මුත් ඒ මතය පිහිටුවන්නාවූ කිසිම හේතු උදහරණයක් ආගම ධර්මයෙන් නොපෙන්නුවේය. දනට ඔහුගේ දුර්ලබ්ධිය ඔහුටම හැඟීගොස් ආගම ධර්මයක් නොපිට පෙරළා කීමේ අශුණු දුක ආයති සංවරයෙහි පිහිටන්නට කැමැතිවූවාක්මෙන් හැඟේ. මෙබඳු වැරදීම් රතනපාලට සිදුවීම එතරම් අපූරු කාරණයක් නොවන බව සලකා තුණුරුවන් සමාකරවාගෙණ විලිලජ්ජා නොවී නියම ශාසනචාරිත්‍රය පිළිගන්නාමෙන් අවවාද කරමි. මින්මතු රතනපාලගේ අඩිපාරේ ගිය සියගණන් මහණුන්නාන්සේලාටත් මෙහි ඇත්ත අගවාදී ආයති සංවරයෙහි පිහිටන්නට අවවාද කට යුතුයි. මල්ගස්පේ නායක ස්ථවිරයන් ආදී ධර්මවිනයධරයන් වහන්සේලා විසින් පිඩුපිණිස හැසිරීමේදී භාවිතාකළ උභයාංශ වැසීම කෝට්ටේ විහාරේ සංඝයා හැරදමා පිඩපාත ගමනටත් එකලර වසා පත්පොටින් වසන්ට නියමකරගත් බව ආරංචියි, ඔවුන්ටත් අපාය ගත නොවී ආචාර්යයන්ගේ මුහුනේ දූලි නොගා ආචාර්යයන් විසින් පුරුදුකරණලද පිඩපාත ගමනේ උභයාංශ පෙරවීම සෙසු ගමන්වලටත් දියුණුකරන්ට අවවාද කරන්නම් ඔවුන් මේ ශාසනය මනාසේ රකින්නන්මෙන් ලොකයා විසින් සලකනුලැබේ. සියම්නිකායේ පිඩපාත ගමනට කරණ උභයාංස වැසීම අමරපුරනිකායෙන් ඉගෙණගත්තායයි රුවටී විනාශකරගන්ට ඕනෑනැත සියමෙන් බෝවූ උභයාංශ පෙරවීම මදින්මද අත්හැරිගොස් පිඩපාත ගමනට පමණක් පවත්වාගන ආබව වෘධයෝ කියති. මේ වාදය නිසා ඒ ගමනත් එකලරයෙන් කරන්ටයාමෙන් ශ්‍රමණ ලිඟය හාත්පසින් නැතිවීයෙයි බුඩාගම පිරිහීතියාවූ සමහර රටවල මහණුන්නාන්සේලා පන්සලේදී සිවුරු පෙරවීම හාත්පසින් නොකරණ තුමුත් ගම්බැදීමේදී කරට දමාගන යන්නාහුය. එමෙන්ම සියම්නිකායේ පිරිහීමෙන් පසු පිඩපාතයට පමණක් උභයාංශ පෙරවීම කළබව පැහැදිලිව පෙනේ.

මේ සඳහා යු. රතනපාලගේ සහභාගිකයෙක්වූ විදර්ශී මිත්‍රයා කියාතිබෙන්නේ මෙසේය (1898 මැයි 28 වෙනි දින ලංකොදය බලනු) "වෛතුල්‍යවාද ධර්මරුචිවාද සාගලිකවාදදී මිථ්‍යාලබ්ධිගත් බෞඩ ප්‍රතිරූපින් ඇතිවූයේත් රහත්කාලේම නොවේද? ඒකාලේ ආගමානුකූල නොවන පිළිමරුපත් සමහරවිට එකී නිකායන් විසින් සාදගන්ට නුපුළුවන් නොවේ රහත්කාලේ සිටි හොරගත් මිථ්‍යාවාදිහු දන්කාලේ වසන මිථ්‍යාවාදීන්ට වඩා සුළුපටුවූවෝයයි කල්පනා නොකටයුතුයි. බුඩාගමේ පොත්පත්වලට විරුඬලක්ෂ

තනාතිබෙන ප්‍රතිමාරූප ඇතහොත් ගල්රූපමවුවත් එයින් මේකා
රණයට කිසි පිරිමැස්මක් නොවනබව අප මිත්‍රයන් විසින් දැඩිකොට
සැලකියයුතුයි'' යනු විදර්ශිගේ මතයයි යටකී වෛතුල්‍යවාදීහු යම්
යම් කාරණයක එල්ලී වාදකළාහු නුමුත් මේ විදර්ශි එබඳු කිසිහේතු
යුක්තියක් නොලැබ නිරලම්බ අහසේ එල්ලෙන්ට තැත්කරන්නෙකු
මෙන් බොරුවෙන්ම ජයගන්ට තැත්කරණ පුද්ගලයෙකි පුරාතන
වෛතුල්‍යවාදීන් විසින් විනයාභි ධර්මදෙක ගැණ උපදවනලද වාද
සියල්ලම විභජ්ජවාදය දක්වා නිරාකරණයකොට සඟායනාත්‍රයට
නැගුවාට පසු මේ බුඩාගමට වෛතුල්‍යවාද මිශ්‍රවීමක්වෙන්ට එන්නේ
මේ රතනපාලලාගේ කාලේදීය ධර්මාශෝක රජ්ජු දවස ඇතිවූ වෛතු
ල්‍යවාද මොනවාද කියා නොදන්නේනම් විනය අටුවාවේ ආචාර්ය
පුත්‍රයන් විසින් උපදවන ලද වත්‍ථු සහ කථාවත්‍ථු ප්‍රකරණයෙහි
ආ පරවාද 500 ද බැලියයුතුයි. ආගමේ කිසි පොතක පෙරවීම පිළි
බඳ වෛතුල්‍යවාදයක් උපන්බව නොපෙණේ. එසේ තුබුනානම්
සකවාදය දක්වා ඒ නිරාකරණය කරණසැටි අටුවාටීකාවල ඇවිත්
තිබියයුතුයි. රතනපාලලා ලඳරුවන් රවටන්නාක්මෙන් අප රව
ටන්ට හිතටගත්තොත් ලජ්ජාවෙයි. ඉතා ලුහුඬින් සිවුරුපෙරවීම
සම්බන්ධව වෛතුල්‍යයන් විසින් කිසි වාදයක් නොඉපදවූබව සිතට
ගතයුතුයි. ඇරත් ධර්මාශෝකරජ්ජු විසින් ඒ වෛතුල්‍යයන් දේශ
ත්‍යාගකරවා ඔවුන්ගේ පොත්පත් ආදී සියල්ල විනාශකර දැමූ බැ
වින් ඔවුන් විසින් ආගමවිරොධ ප්‍රතිමාරූප තනාහෙණ තුබුනානම්
ඒවාත් නාස්තිකළබව සැලකියයුතුව තිබේ. මාවිසින් මෙහි පෙන්
වන සිතුයම් ධර්මශොක රජ්ජුදවස හා බුදුන් ජීවමානදවසත් බුදුන්
ගේ සිවුරු පෙරවීම සියැසින්ම දුටු නියමආකාරයට කොටවා තබන
ලද ගල්රූප බව ඉංග්‍රීසි පණ්ඩිතයන් විසින් සහතිකකරතිබේ. අප
මිත්‍රයා කියන සැටියට මේ ගල්රූප සියල්ලම වෛතුල්‍යයන්ගේ වැඩ
නම් ඒ ඒ තැන ධර්මාශොකරජ්ජු ආදී උත්තමයන් නමින් කොටවා
තිබෙන ශිලාලේඛණත් වෛතුල්‍යයන්ගේම වියයුතුයි. එතකොට
විභජ්ජවාදයට ඉතුරුවෙන්නේ විදර්ශිලාගේ පක්ෂයේ ඉන්නා මාපිටි
ගමාදි විකදෙනා පමණකි. ආඩුවෙත් දඬුවම් නැති බලයපිට මෙ
බඳු සාහසික විළිබිය නැති බොරු බේගල් හැමතැනටම භාවිතාකි
රීම විදර්ශිගේ ඔය වේසයට නොගැළපේ හොඳයි දැඹදිව තිබෙන
ගල්රූප සියලලම වෛතුල්‍යයන්ගේ වේවා දඹුළුවිහාරේ ගල්පියස්
සේ සිතුයමේ සිඞාර්ථ කුමාරයා පැවිදිව රජගහවුට පිඬු පිණිස ගිය
ගමණ උභයාංශය වැසීමෙනුත් පාණ්ඩව පව්තපාදයෙහි වැඩසිටීම
එකාංශපෙරවීමෙනුත් තිබේ ඒහැර මුල්ගිරිගලවිහාරේ දෙළරවසන

සිහියමුත් තිස්සමහාරාමය අසල දෙවුර වසන ගල්පිළිම යත් බෙරණ පහාණනාව විහාරේ දෙළර වසන පුරාණ ප්‍රතිමාරූපත් යනමේ ලක්දිව පුරාණ උභයාංගවැලු ප්‍රතිමාසියල්ලම සැදූවේ වෛතුල්‍යයෝද? දඹුළුවිහාරය ලංකාවේ ප්‍රධාන ප්‍රතිමාලයකි වලගම්බාහු කීර්තිශ්‍රී නිස්සඞ්කමල්ල යන මහරජුන් තුන්දෙනකු විසින් දඹුළුවිහාරය කරවූහේය. මුල්කිරිගල විහාරයත් යටාලතිස්ස රජුගේ පුණ්‍යකර්මයකි. මේ විහාර තනනකාලේදී ලංකාවේ පැවැත්තේ මහාවිහාරපරම්පරාවයි. මහරජුන් හා මහතෙරුන්නාන්සේලාත් ඉතා ගෞරවයෙන් කළාවූ මේ විහාරවල දෙළරවසන රූප වෛතුල්‍යයන්ගේයයි විදර්ශීටවත් මාපිටිගමලාටවත් ඔප්පුදියහැකිද? විදුරසුන්අරා වැඩහිඳ මාරපරාජය කළ පරිදි පෙන්වීමට ධර්මාශෝකරජතුමා විසින් කොටවනලද ගල් පෙර්රූවේ බුද්ධරූපය දෙළරවසා පොරවා තිබේ. ජාතකඅටුවාවේදී දකුණු ශ්‍රීහස්තය සිවුරුහැබින් නිකුත්කොට මහපොළව සාක්ෂිකළායයි පෙණෙන බැවින් එකාංශපෙරවීමෙන් කවදාවත් එසේකරන්ට බැරිබව පෙණේ. ඉතින් ජාතකඅටුවාවේ කියවනත් රජතුමාගේ ගල්කර්මාන්තයත් ශිලාලේඛණයත් ශික්ෂාපදයත් එකාකාර හැළපි තිබියදී ඒ සියල්ලම නොසලකා විදර්ශීගේවත් මාපිටිගමලාගේවත් උනන්කම නිසා ඒ ගල්රූපය වෛතුල්‍යයන් විසින් කොටවනලදයි පිළිගණිමුද? සියම්රජතුමා මේ එකාංශකාරයින්ගේ සතුරෙක් නොවේ. සියම්රට පිහිටිතෙක් එකළර වසා ගම්වදින සඟුන් දුටුවේ ඇසුවේ නැත මොවුන් කාබේරි තවුසෝයයි කී වචනය මදිද? සියම් සමාගම සියමේ උපාලිතෙරුන්ගේ පරම්පරාවෙන් පැවත ආ නුමුත් දැන් මොවුන් වෛතුල්‍යවාදය ගත් බැවින් උපාලි පරම්පරාව බාර ගැණිම අශුභයකි. සියම්ආණ්ඩුව හරියේ ඉඳගණ මෙබඳු බොරු කිවොත් බෙනදේ බලාගන්ට පුළුවන්වේ

පාවද මීට අනතුරුව 59 වෙනි පිටේ යොද තිබෙන සිතුයම් දෙක දඹුළුවිහාරේ නායක ස්ථවිරපාදයන් විසින් පුරාණ සිතුයමේ ආකාරයට සමර්ථ ශිල්පීන් ලවා සිතුයම්කරවා අපවෙත එවනලදුව කැටසම්ඛාරවා මෙහි යොදනලදී මෙහි දකුණුපැත්තේ රූපය රජගහනුවර පිඬුසිඟා වැඩිය ආකාර පෙන්වීමටද වම්පැත්තේ රූපය පාඩාපද්වයාවජාතකයේදී බිම්සර රජු සමග කථාකළ පරිදි පෙන්වීමටද සිතුයම්කර තිබේ.





—1—



—2—



—3—



—4—

— 5 —




CEYLON

නො. 1 දරණ සිතුයම සර්. ඇඩ්වින් අර්නෝල්ඩ් නම් ඉංග්‍රීසි කවීන්ද්‍රයාවිසින් රචනාකරණලද ‘‘ලෛලටොප් ආසියා’’ නම් පොතේ 135 වෙනිපිටේ යොදතිබේ. මේ සිතුයම පිළිබිඹුකරගත් ගල්පෝරුව පුරාණවස්තු සොයන ‘‘එසියාටික් සොසෙටි’’ නම් සමාගමවිසින් සොයාගන්නාලදුව දැනට කල්කටා කෞතුකාගාරයෙහි තැන්පත්කරතිබේ මේ ගල්පෝරුව ගන්ධාරදේශයෙහි පොළවයට තිබී සොයාගන්නාලදී පොළව යටවූ ද්‍රව්‍ය පරීක්ෂාකරණ ශාස්ත්‍රක්‍රමයෙන් සොයා බුදුන් ජීවමානකාලයට ආසන්නව කරණලද බව දැනගනතිබේ. මෙයින් අඟවන්නාවූ අදහසනම් එක්දිනක් බුදුන් පිරිස්මැද දෙළරවසා වැඩහිඳ ධර්මදේශනා කරණකල එක්තරා දුප්පත් ස්ත්‍රියක් තමාගේ දරුවා සර්පයෙකු විසින් දෂ්ටකොට මියනලදුව ඒ දරුවාගේ මළකුණ බුදුන්කරා ගෙණගොස් ඒ විෂ සුවකර පණඋපදවා දෙනමැනවැයි යාඥාකළකල්හි බුදුන් විසින් කිසිවෙක් නොමළතැනකින් අබමිටක් ගෙනෙනවයි ඇට වදාළේය. ඇද නොයෙක්තැන ඇවිද නොමළ ගෙයක් නොදැක එපමණකින්ම ඇගේ ශෝකය තුනීවිය මරණය කාටත් සාධාරණ ස්වභාවධර්මයකැයිද වැටහීගියේය යනාදී ඉතා යහපත් අදහසකි. මෙයින් මේ කාලේ දෙළරවසන භික්ෂූන් විසිනුත් උගත මනා යහපත් උපදේශයක් දැනගන්ට යුතුවතිබේ. එනම් ධර්මදේශනාකිරීම් පිරිත්කිම් ආදී ප්‍රස්ථාවල පිරිස්මැද උභයාංශ වැසීම ඕනෑ නැතැයි සමහරු කියති; පිරිස්මැදට එනවිට ඇඟවැසෙන්නාවූ සම්පූර්ණ ඇඳුම් පෙරවුම් කටයුතු බව මෙයින් පැහැදිලිව පෙණේ. එපමණක් නොව දෙළරවසා පොරවා වැඩහුන්කල්හි මිණිබඟණින් වඩා එළියට නොපෙණෙන්නට සුරත නිකුත්කරණ ක්‍රමය හා සංඝාටිපලල්ලත්තිකයෙන් වෙන්ව ගිදිනා ක්‍රමයද මෙයින් ඉගෙනගතයුතුයි. සකලසිවුරයට කොට වැඩහුන්නානම් මේ සුරත ඔසවා කථාකිරීමේදී මෙසේ සිවුරුපට ලිහිල්ව නොතිබේ. මේ වැඩහිඳීමේදී සකල සිවුර කබායක්මෙන් යටනොවෙන්නට වැඩහුන්බව කදිමට පෙණේ බුදුන් දවස පොරවාගණ ආ ක්‍රමය මදින්මද පිරිහීගොස් එකළුර වැසීම තදින් පුරුදුළනාක්මෙන් පෙරවූ සිවුරු ගැබින් සුරත නිකුත් කිරීම හා සංඝාටි පලල්ලත්තිකයද අතුරුදහන්වී ගොස් තිබේ. නුමුත් සියමේ මහානිකාය ධම්මයුත්තික නිකාය යන දෙකේ මේ සිරිත් දෙක මනාසේ පවත්නාබව හා බුරුමේ වෘද්ධමහාසථවිරයන්වහන්සේලා අතර පමණක් පවත්නාබවද පෙණේ. සියම් රජතුමා විසින් මේ දැන් ලඞ්කාවේ පෙරවූ සිවුරුගැබින් අත එළියටගන්නා ක්‍රමය කොපමණ කලකසිට පුරුදුවේගණ ආයේදැයි යම් කිසිවෙකුගෙන් ලඞ්කාවේදී විචාරණලදී. පෙරවූ සිවුරුගැබින් දැනට ලඞ්කාවේ

පුරුද්දේ ක්‍රමයට සුරත බැඟැරකිරීමෙන් සමගරවිට ඒ අතේ වැලමිට දක්වාත් එළියට වැටීමෙන් "සංමිච්ඡකිච්ං මණිබන්ධම අපටිච්ඡාදෙන්තායස්ස දුක්කටං"යි වදාළ ක්‍රමයට ඇවැත් සිද්ධවියහැකිබැවින් පුරාණ ක්‍රමය පුරුදුකර ගැණීමට උත්සාහකටයුතුයි. මේ සිතුයම දුටු කල්හි ශික්ෂාපදයට එකඟව පොරවා තිබෙන රඟ වැටහීමෙන් මහත් ප්‍රීතියක් උපදී. එබැවින් මේ සිතුයම බලා මෙහින් උගතමනා පෙරවීමේ ක්‍රම ඉගෙණගන්නාමෙන් ඉල්ලමු.

නො. 2 දරණ සිතුයම එම "ප්ලෙටොප් ආසියා" නම් පොතේ 204 වෙනිපිටේ යොදතිබේ. මේද යටකී සමානවිසින් ගන්ධාරදෙශයේ පොළවයට තිබී සොයාගන්නාලදුව දනට කල්කුටා කෞතුකාගාරයෙහි තැන්පත් කරතිබේ. මේ ගල්කැටයම කැටිතිබෙන්නේ ඒ ප්‍රවෘත්තිය සිබවූ සැටි සිගැසින් දුටු අය විසින්යයි යුරෝපීය පණ්ඩිතවරු විසින් සහතික කරතිබේ. මෙහින් දක්වන අදහස බුදුන් ප්‍රථමබෝධියේදී වේළුවනාරාමය පිළිගෙණ එහි වැඩවසන කල සුදොදන මහරජ්ජුගෙන් හා යශෝධරා දෙවින්ගෙනුත් කිපවරක් දූතාමාත්‍යයන් පිටත් කළාට පසු පියරජුට අනුග්‍රහ පිණිස කිඹුල්වතට වැඩ පළමුකොට රජවාසලට නොවැඩ පිඬුපිණිස වඩිනබව රජු අසා වෙළෙවිට දිව්ගොස් පුත තොපගේ මහාසම්මතරජපෙළපතේ කිසිවෙක් සිඟුවේ නැත තුඹවහන්සේ අපට නින්ද නොකරවයිකියේය. බුදුන් ඒ බසට මහරජ මේ තොපගේ වංශචාරිත්‍රයක් නොව දීපංකරාදී සියලු බුදුවරයන්ගේම සිරතයයි වදරා නැවත රජවාසලට වැඩියේය. මේ සිතුයමෙන් පෙන්වන්නේ රජගෙ මිදුලේදී සුදොදන රජුහා යශෝධරා දේවිත් රාහුල නන්ද කුමාරයන් දෙදෙනාත් පෙර ගමන්කොට බුදුන් පිළිගත් ආකාරයි මෙහි වම්පැත්තේ සිටින රූපය යශෝධරාදේවියි ඊළඟ දෙළුරවසා වැඩසිටගන සිව්රු ගැබින් අත නිකුත් කොට කථාකරන්නේ සර්වඥයන්වහන්සේයි ඊළඟ බුදුන්ගේඅත ඇබූ පාත්‍රය අතට ගෙනසිටින්නේ සුදොදන මහරජුයි ඊට පිටිපසින් සිටින්නේ රාහුල නන්දකුමාරයන් දෙදෙනායි රජතුමාට අතදිගුකොට වදරන්නේ මහරජ මම ලෝකේ උතුම්වූ ධනය සොයාගතිමි. ඒ තොපට දෙන්නෙමි. එනම් දුඃඛ සමුදය නිරෝධ මාර්ග යන චතුරාර්‍ය්‍ය සත්‍යයයි. මේ හැර තවත් සත්‍යයක් නම් නැත්තේමය සම්මාදිට්ඨි ආදී ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය හැර නිවනට යන්නාවූ වෙන මාර්ගයක් නැත්තේය. රජෙක් වේවා දුප්පතෙක් වේවා ස්ත්‍රියෙක් වේවා පුරුෂයෙක් වේවා ළදරුවෙක් වේවා මහල්ලෙක් වේවා මේ ආර්‍ය්‍ය මාර්ගයෙන් ගොස් සසර කතරගෙවා නිවන්පුරයායුතු වෙයි. මම උත්පත්තිය නැතිකළෙමි. මේ මාගේ අනිත්‍ය ශරීරය

වේ යනාදි චතුරාර්‍ය්‍යසත්‍යය ප්‍රකාශවන්නාවූ ධර්මයකි. මේ දුව
ස්දී රජතුමා හා යශෝධරාදේවීද අධිගමය ලැබූබව කියාතිබේ.
මෙහි බුදුන්ගේ ශ්‍රීරූපයත් දේවියගේ ශ්‍රීරූපයත් එන්ඩැනිම තිබෙන්නේ
බුදුන් හිසකේ කපා කසාවත් ඇඳ එක්වේලේ වළඳනබව ඇසූ
යශෝධරාදේවීද හිසකෙස් කපා රාජාභරණනොපැළඳ කසාවත්
ඇඳ තාපසියක්මෙන් සිටි බැවිනි. මෙහින් සර්වඥයන්වහන්සේ
දෙළරවසා ඇතුළුකම් වැදූ සැටිත් විදර්ශිලාට එළියට ගන්ට ඇ
රැම තිබෙන සුරත මුවමනා ප්‍රසථාවලදී මෑත්කොට ගන්නා පිළිසඳ
සුරත වමතදෙකම එළියේ තිබෙන තැන්ද නොවැසියයුතු දොරා
හ.ය හා වැසියයුතුතැන්ද මනාසේ අවබෝධකළහැකිවේ.

නො. 3 දරණ සිතුයමද එම "ලෙළදොප් ආසියා" නම් පො
තේ තිබෙන සිතුයමකි. එයින් පෙන්වන අදහසනම් සර්වඥයන්ව
හන්සේ ආත්මක්ලමථුයෙහි යෙදෙන්නාවූ උග්‍රනවුයක් කරා එළඹ
ඔහුගේ ආහාමයට හිංසාකිරීමෙන් සසරදුක් නොගෙවියහැකි බවද
සසරදුක් නැසීමට ඇත්තාවූ එකම උපාය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයට
පිළිපැදීමත්බව යනාදිය දෙශනාකොට ඔහුගේ මිථ්‍යාවාදය බිඳහෙ
ළීමවේ.

නො. 4 දරණ සිතුයමද එම පොතේ සඳහන්වූ සිතුයමකි.
එයින් පෙන්වන්නේනම් සර්වඥයන්වහන්සේ ගම්බිම තැනකට
වඩිනා අතර මගදී නොපළඳරුමත් කඩායමක් සමහවී ඔවුන්ට අව
වාද දුන් පරිදියි.

නො. 5 දරණ සිතුයමෙන් පෙන්වන්නේනම් තුනරුකක් මුල
ආත්මක්ලමථුවෙන් තපස්කරන්නාවූ තව්සකුට බණවදරා ඔහු
ත් මිථ්‍යාප්‍රතිපදාවෙන් වැලක්වූබවයි.

පොතපතේ අන්‍යභාෂාවකින් ලියාතිබෙනදේ අන්‍යාකාරවලට
තේරුම්නැතිමෙන් වරදින්නට පුළුවන් නුමුත් මේදිවමින් බුදුන් සිව්
රුපෙරවූ ආකාර සිතැසින් දක්නකොට තිබෙන ගල්රූපවලින් ශික්ෂා
පදය මනාකොටම තේරුම්ගන්නට පුළුවන්වේ. මේ ක්‍රමය බැහැල
කාලක්‍රමික්‍රමයෙන් දසටානුගතියට ගොස් දුන් කාරණ උභයාංශ
පෙරවීමේද මද මද වරද ඇතිබවත් එකාංශ පෙරවීම හාස්
පසින්ම ආගම විරෝධ බවද පෙණේ. ඉන්දියාවේ පුරාතන ගල්
පිළිම දකසත් බැලුවත් වැඩසිටිනා රූපයක් එකාංශව දකින්ට නුපු
ළුවන. ගඳකිළියේ වැඩහුන්නා පිළිම හැර අන්යිසිතැනක එකාංශ
පිළිමයක් නැත්තේමය. මේ කාලයෙහි නියම ශ්‍රමණවේශය අන්
තර්ධාන කරදමන්ට තැත්කරණ ශ්‍රමණ ප්‍රතිරූපකයන්ගේ මිථ්‍යාවාද
බිඳහෙලීමට මේ පුරාතන ගල්පිළිම දියත් ආධාරයක්වීය එබැවින්

පවුණ්ඩ ලක්ෂණයන් විශදම්කොට මේ ප්‍රතිමා සොයාගත් සාධාරණ ඉංග්‍රීසි අණ්ඩුවට හා "එසියාටික් සොසෛටි" නම් සමාගමටද ඒ ජායාරූප "සින්කෝග්‍රැප්" ක්‍රමයෙන් කැටයම් කරදුන් කේම්බෙහුන්ගේ සමාගමටද බෞද්ධයන් විසින් ස්තුතිකටයුතුයි. මේ ශාස්ත්‍රීය ලෙසෑ බදුදුයි කියත්හොත් සර්වඥයන්වහන්සේගේ අධිෂ්ඨානබලයෙන් නිර්මිත බුදුකෙණෙක් අවුත් පොපේ ඔය කිම අසත්‍යයකි. මව සිත් සිවුරුපෙරවීම කාලේ මෙසේයයි කියන්නාක්මෙනි.

පසුගිය මැයි මස 28 දින ලංකොදයේ තීර නාවයමාරස් පිරෙන් නව විදර්ශි නමින් ලියාතුබු ලියවිල්ලත් ඊලඟ ජූනි මස 4 දින පත්‍රයේ රතනපාල නමින් ලියාතිබෙන තීර හතරේ ලියවිල්ලත් යන දෙකම එකම කෙනෙකුගේ ලියවිලිබව ඒ ලියුම් කියුම් කියවූ අයට හැගෙනවා ඇත 28 වෙනිද ලියමනේ සැලකියයුතු කාරණා දෙකට සම්පූර්ණ උත්තරදී ඇති. ජූනි 4 වෙනිද ලියුමේ උත්තර දියයුතු එකම වචනයකුත් නොමැතියි. මේ පත්‍රදෙකේම පළවීතිබෙන මේ ලියුම්දෙක කියවා බලන කාටනුමුත් මේ පුද්ගලයන්ට මෙබඳු ධර්මවාදයක තීරණයක් දෙන්ට ශක්ති නැතිවග සලකාගන්ට පුළුවන මේ ලියුම් දෙකේම ප්‍රකාශවන්නේ ලක්මිණිපහන් කතෘට සහ තවත් බොහෝ දෙනෙකුටත් නින්දිතලෙස කුලමල කියා ගැරහුම්යි. මේ ගැරහුම්වලින් කිසිකලක මෙබඳු වාදයක තීරණයක් දකින්ට නුපුළුවන්බව නොයෙක්වර කීනුමුත් රතනපාලලාගේ ජන්මගතියෙන් පුරුදුවූ නිචාලාපව්‍යවහාරය අත්හැරගන්ට නුපුලුවන්වේ; රතනපාලලා මළමුතුකලාට පසු ඒ මළමුතු දෙස නැවත බැලීමට රතනපාලලාටම පිළිකුල් උපදින්නාක්මෙන් රතනපාලලා මේ ධර්මවාදයට බැස උන්නුන්ට කරපූ අපහාශරාශිය නැවත බැලූකල්හි තමතමන්ටම පිළිකුල් උපදින්ට පුලුවන්වේ; අපට ඇත්තාවූ ප්‍රීතිය නම් අපේ ලියවිලි ධර්මවාදයකට සුදුසු පරිද්දෙන් යහපත් ආර්යභාෂාවෙන් ගැළපිනනයාමයි. ජූනි 4 වෙනිද ලියමන පටන්ගන්නේ "විභක්තියක් නොවරදවා වගවාසගමක්වත් මේ වනතුරුම ගළපාගතනොහෙන ඊනියා පහන්මිත්‍රයා" යනාදීවසයෙනි. විභක්තිවරදනම් පහන්මිත්‍රයා ලියනදේ අදහස් දැනගන්නේ කෙසේද? පහන්මිත්‍රයා ලංකාවේ පුරාතන පටන් ව්‍යවහාරකරගන ආ ලයනුවලට ළයනුත් නයනුවලට ණයනුත් වෙනස්කරන්ට බොරුව්‍යාකරණ ක්‍රම සාද මෝඩයන් මූලාකරවන්නෙකු නොව පුරාතනයන්ට අනුව පොත පතට එකඟව ආගමයුක්තිය පිට ක්‍රියාකරන්නෙක් බව දැනගතයුතුයි රතනපාල පමණක්නොව ගුරුවරාදිහුත් ඉගෙණගත්තේ අනුන්ට ඇදකියා තමන්ගේ කීර්තිය පතුරුවාගැ

කීම පමණකි. තුමුන් සිවිරුවාදයෙන් හාත්පසින්ම මේ ශාසනාන්තර්ධානය දක්වා නොනැසී පවත්නා කැළලක් රතනපාලලාට හට ගත් බව ලඞ්කාවේ කවුරුත් දනිති: මේ ජූනි මස 4 වෙනිද පත්‍රයේ ලියාතිබෙන එකාංශික සඞ්ඝාටි ආදියේ නිශ්චයවලින් කිසිසේත් විළි ලජ්ජා නොවසා ඇතුළුගම් වැදීම කටයුතුය යන අර්ථය නොහැඟේ එබැවින් රතනපාලයේ මෙබඳු ප්‍රලාප අත්හැර හරි අදහස් නොවැටහී බණපද වරදවා කියන හරියට පමණක් උත්තරදෙනබව සැල කියයුතුයි. රජගහයේ සිට නාලන්දාවට බුදුන් ප්‍රමුඛ මහාශ්‍රාවකයන්වහන්සේලා එකාංශව පොරවා වැඩිය ගමන රතනපාලලා කඩචක්කරගෙණ නිතර වර්ණනාකරමින් දායකවරුන්ට උගන්වා දෙන ලොකු බණපදයකි. තුමුන් ඒ ගමන් වර්ණනාවේදී ජේත "තාරාගණ පරිවුතොවිය පූණ්ණචන්දො මිග පක්ඛිනම්පි චක්ඛූනී පීණයන් පගෙව දෙවමනුස්සානං" යන පාඨයෙන්ම සැමදම දෙසාබෑ හරිය අමූලික බොරුවුනා මනුෂ්‍යයන් වාසයකරන්නාවූ ගම් ගෙවතු ඇති ප්‍රදෙශවල මෘගපක්ෂීන් නැතිබව රතනපාලලාට දූන් වැටහිහියේය. මේ මාර්ගයෙහි මනුෂ්‍යයන් වාසයකළානම් කුකුළන් ඌරන්මිස වෙන මෘගපක්ෂීන් වාසය නොකරති එසේ වාසයකළානම් ප්‍රධානවශයෙන් මනුෂ්‍යයන් කියනවාමිස මෘගපක්ෂීන් කුමටකීයේද? මේ මාර්ග ඇතුළුගමක්ව තුබුනානම් "මිගපක්ඛිනම්පි" කීතැන "කුක්කුට සූකරානම්පි" යි කියාවත් යෙදුවානම් යන්තමක් පිරිමසාගන්ට තුබුනි. මේ පාඨයේ අන්තිමටකී "දෙවමනුස්සානං" යන පදය සෑමකල්හිම ස්වභාවවශයෙන් බුද්ධවෙශය දෙව්මිනිසුන්ට ප්‍රියබවදැක්වීමට කීවවනයකි. එබව දෙවමනුෂ්‍ය ශබ්දයන්ගේ සහ චාරිත්‍රයෙන් හැඟේ. මා විසින් පෙන්වනලද නිදර්ශනයන්ටවත් මගේ ප්‍රශ්නයන්ටවත් රතනපාල කෙළින් උත්තරනොදී ස්වපක්ෂය මූලාකරවන්ටත් ලජ්ජාව වසාගන්නටත් අනම්මනම් දෙඩවනබව දූන් මුළුලකම ප්‍රසිද්ධවිය මෙත්න මේ නිදසුනත් රතනපාලයේ සැකහැරගන්නට උපකාර වේ. සමන්තපාසාදිකා විනයඅටුවාවේ "මහණෙනි ආබාධ පසකින් පෙළෙන්නාවූ පුරුෂතෙමේ පැවිදි නොකටයුතුය. යන මෙහි අර්ථ වර්ණනාව පටන්ගෙණ යම් ඒ කුෂ්ඨාදිවූ පඤ්චාබාධයෙකනෙක් උත්සන්නවූවාහුද ඒ පඤ්චාබාධයෙන් ස්පර්ශකරණලද (මැඩ පවත්වන ලද) පුරුෂතෙමේ පැවිදි නොකටයුත්තේය. එහි කුෂ්ඨය වනාහී රක්තකුෂ්ඨය වේවා කාලකුෂ්ඨය වේවා යම් කිසි පණුකැවිලි දදකස් ආදී ප්‍රභේදයක් වේවා සියල්ලම කුෂ්ඨනමැයි කියනලද්දේවෙයි. ඉදින් ඒකුෂ්ඨය නියපිටක් පමණවූද වැඩෙනපක්ෂයෙහි සිටියේනම් ඒ කුෂ්ඨාතුරතෙමේ පැවිදි නොකටයුත්තේය. ඉදින් හඳනා පොරෝනා

සිවුරුවලින් පියෙවින් පිළිසන්වන තැනක නියපිටක් පමණවූද කුෂ්ඨය නොවැඩෙන පක්ෂයේ නම් පැවිදිකරන්ට වටනේය මුඛයෙහි හෝ අත්පා පිටුවල හෝ ඉදින් නියපිටක්ප්‍රමාණ කුඩාතරම්වූද නොවැඩෙනපක්ෂයෙහි සිටි කුෂ්ඨයක් ඇත්තේනම් ඒ පුරුෂතෙමේ පැවිදි නොකටයුත්තේයයි කුරුන්දි අටුවාවේ කියනලද්දේය * යනු කියනලදි මේ අටුවාවේ භාවාර්ථය මෙසේයි, මුහුනේවත් පිටිඅළු පිටිපළුවලවත් ඉතා කුඩාවූ නොවැඩෙන පක්ෂයෙහි සිටි කුෂ්ඨයක් ඇත්තේනම් ඒ පුරුෂතෙමේ පැවිදිනොකටයුතුයයි කිවේ ප්‍රකෘතියෙන් ඒපස්තැන අදනා පොරෝනා සිවුරුවලින් නොවැසෙනනිසා නොවේද යනු මනුෂ්‍යඥනය ඇත්තාවූ රතනපාලට නොහැඟෙන්නේ ඊර්ෂ්‍යා පටලය නිසා නොවේද? ප්‍රකෘතියෙන් දකුණු දසරුව දකුණුඅත ආදී තැන් නොවැසේනම් ඒ සථානත් මේ ශික්ෂාපදයට ඇතුලත් කටයුතු නොවේද? රතනපාලට සුපටිච්ඡන්න ශික්ෂාව නොතේරෙණ නුමුත් මේ ආදි නොයෙක් නිදර්ශණවලින් ශික්ෂාපදය තවවනතුරු නොතේරි අබුතව සිටිනබව දකිමප්‍රදුමයි රතනපාලට ඇතුව තිබෙන්නාවූ නිදසුන රජගහේ පටන් නාලන්දවට එකළුර වසා ගියගමන පමණයි. ඒ නිදසුනෙන් රතනපාලට කිසි වාසියක් නොලැබෙන බව මාවිසින් ඉතා පැහැදිලිව පෙන්නාදී තිබේ මාවිසින් විචාල ප්‍රශ්නයන්ටවත් දක්වනලද නිදර්ශණයන්ටවත් කිසි උත්තරයක් නොදී ඇනුම් බැනුම් කුලමල කිවාට මේ වාදයෙන් ජයගන්ට නොලැබේ.

---

* න භික්ඛවෙ පඤ්චහි ආබාධෙහි ඵුට්ඨො පබ්බාජෙතබ්බොති-යෙත කුට්ඨාදයොපච අබාධා උස්සන්නා හොන්ති ඵුට්ඨො අධිප්පෙතො න පබ්බාජෙතබ්බා තත්ථකුට්ඨන්ති රත්තකුට්ඨංවා හොතු කාලකුට්ඨං වා යං කිඤ්චි කිටිභද්දුකච්ඡුආදිප්පභෙදම්පි සබ්බංකුට්ඨමෙවාති වුත්තං තඤ්චෙනඛ පිට්ඨිප්පමාණම්පි වඩ්ඪනක පක්ඛෙඨිතං හොති න පබ්බාජෙතබ්බො-සචෙ පන නිවාසන පාරුපනෙහි පකති පටිච්ඡන්නට්ඨානෙනඛ පිට්ඨිප්පමාණං අවඩ්ඪනකපක්ඛෙඨිතං හොති වට්ටති මුඛෙ පන හත්ථපාද පිට්ඨිසුවාසචෙපි අවඩ්ඪනකපක්ඛෙඨිතං නඛපිට්ඨිතොච ඛුද්දකතරම්පි නවට්ටතීති කුරුන්දියං වුත්තං. (සමන්තපාසාදිකා)



මේ සිතුවම අප මිත්‍ර ධම්පාල මහත්මයා විසින් ඉන්දියාවෙන් සොයාගන්නා ලද ගල්පිළිම පොටෝග්‍රැප් එකයින් කැටයම් කර ගන්නාලදි. මේ ගල්ප්‍රතිමාවද ධර්මාශෝක රජතුමාගේ නාමාංකිතයක්බව එහි සවිකර තුබූ ශිලාලෙඛනවලින් දැනගනිමි. සම්භාවිත වෛතුල්‍යයන්ගේ ප්‍රතිමාන් තිබෙන්ට බැරිනැතැයි රතනපාල කියන අනුමානයට මේවා ඇඟුලුන් නොවන්නේ ධර්මාශෝක රජතුමා සඞ්ඝබඩ කාමීනානයන් බැම්නි ඇරන්සිවුරු පෙරවීම පිළිබඳ වෛතුල්‍ය වාදනුපත්බව රතනපාලලා විසින් තරන් සිතන බානහුතුයි.

ජූනි 11 වෙනි දින ලංකාදීපයෙන් පෙනී සිටින ශු. රතනපාලව පිළිතුරුයි.

මා විසින් රතනපාලගෙන් විචාළ ප්‍රශ්නයන් අතුරෙන් වාසි ලබාගන්ට පුළුවනැයි කල්පනාවෙන ප්‍රශ්නයන්ට පමණක් ඉතා ප්‍රමාදවී අතරින් පතර උත්තර දිගත එයි ඒ උත්තර දීමට ප්‍රධානකොට සලකා තිබෙන නිදර්ශණ ලක්ෂ්මිණිපහන් කතෘගේ ඇදපලුදුයි ලක්ෂ්මිණිපහන් කතෘගේ කොපමණ ඇද පැද කීවත් මේ වාදයට එයින් කිසි ප්‍රයෝජනයක් නොලැබේ. රතනපාලගේ පක්ෂය සාධනයකරණ එකාංශ කාරණයන්ට මේවා ලොකු උදාහරණ වෙන්ට පුළුවන් නුමුත් පඬිත ජනයාට හැඟෙන්නේ රතනපාලගේ අශික්ෂිත භාවය පමණකි. මගේ ප්‍රශ්නය සුදින්නවස්තු රඨපාලසූත්‍ර අටුවාවල ඥාතිගෘහයන්ට පැවිදිව පිඬු පිණිස ආ සුදින්න රඨපාල ස්ථවිරයන්වහන්සේලාගේ හස්තපාදයන්ගේ හා කටහඬෙත් ලකුණු සලකා දාසින් විසින් ඇඳිනගන්නාලද්දේය යනතන්හි රතනපාලගේ මතය පරිද්දෙන් දකුණු දසරුව ආදී ශරීරාඞ්ගයක් එළියේ තිබෙන්ට ඇර සිවුරු පොරවා ගියාහුනම් හස්තපාදයන්ගේම ලකුණු ගත්තේ මන්ද? යනුයි. ඊට රතනපාලගේ උත්තර මෙසේයි. "සුදින්න ස්ථවිරයන්වහන්සේටහා රඨපාල මහරහතන්වහන්සේටද පිඬුදෙන්ට ආඥ තිදාසීන් දෙදෙනා මහණවූනෙක් නුදුටුවාවූ උන්වහන්සේලා ඇඳිනීමට නිමිති (ලකුණු) සිතට ගත් ආකාරය එම කථාවස්තුදෙකේ සඳහන්කරතිබෙනවා මිස උන්වහන්සේලාගේ ඇඳුම් පෙරවුම් ගැණ හෝ සිවුරෙන් වැසුනු නොවැසුනු අවයව වල ගණනක්ගැණ හෝ ඒ දාසින්ගේ කල්පනාවක් නැත—පෙ—ඉක්බිත්තෙන් සුදින්න ස්ථවිරයන්ගේ ඥාතිකුලයෙහි (මව්පියන්ගේ) ගෙහි වාල් යක්‍ෂියක්නොමෝ ඒ පිළුණු කොමුපිඬු ආයුස්මත් සුදින්න ස්ථවිරයන්ගේ පාත්‍රයෙහි බහලන්නී අත්දෙකේද පතුල් දෙකේද කටහඬෙහිද නිමිත්ත ග්‍රහණය කළාය කෙවත් ආකාර ලකුණු සිතට ගත්තිය යනු මෙහි අදහසයි මේ දෙශනා පාලියෙන් තේරුම්යන්නේ සිවුරෙන් වැසෙන නොවැසෙන අවයවවල ගණනක් නොවේ ඒ දාසිය විසින් තේරුම් ගත් ආකාරය පමණකි. එසේනොවේනම් ඒ ස්ථවිරයන්ගේ නොවැසී තිබුන හිස ගැණවත් මුහුන ගැණවත් ඇස් කන් නාසා නළල දෙකම්මුල් දෙතොල් යනාදී ශරිරාවයව ගැණවත් ලකුණු ගැනීමක් නොකීවේ ඒවාත් වසාගෙණ ඉහින් කණින් පොරවා සිටි නිසාද" යනාදිය රතනපාලගේ උත්තරයි. මෙයින් රතනපාල් අඟවන්නේ යම්කෙනෙක් ඇඳිනගැනීමට නිමිති ලකුණු ගන්නේ අතුල් පතුල් වලින් පමණක් බවයි. මේ ඉතා අලුත් ක්‍රමයකි. සැබවින්ම දකුණු මිණිබඟණට ඉහල අත්දඹු වැලමිටි දසරුවකිසිල්ල ලැපැත්ත ග්‍රීවය යනාදී ශරීරයෙන් අඞ්ගයක් එළියේ තුබුනානම් ඒ කිසි ස්ථානයකින් ඇඳිනගන්නා ලකුණු නොගෙණ මිණිබඟණින් පහල අත්

ඟිලිත් හා පතුල්වලිනුත් පමණක් ලකුණු ගත්තේ පිටි අළුවල සුදින්
න රඨපාල කියා නම් කොට තුබුනු නිසාදැයි නොදනිමි මේ පාලි
පාඨය ලෝකේ ඉන්නා සියළුදෙනාටම තේරුම්යන්නේ මේ අවයව
පමණක් සිවුරෙන් නොවැසී තුබුන බැවින් ඒනැන් පමණක් දූක
ලකුණුගෙණ හැඳිනගත් බවයි. නුමුත් රතනපාලට පමණක් සියල්
ලේ නොපිට තේරෙණ ළමතුගතියක් ජන්මයෙන් ඇවිත් තිබෙන
බැවින් මෙසේ විකාර දෙඩවයි. මේ ළදරුවන්ට පවා හැඟෙන අර්ථ
යක් මුවගකොට විකාර දෙඩවන රතනපාල ආගම ධර්මයක් හිර
ණය කරගන්ට පිළිගැනීම ශාසනය පහුබැසීමට ප්‍රධාන කාරණයක්
වේ. රතනපාල කී තේරුම සපිරකරගන්ට කැමතිනම් යම් යම්
අය ඇඳිනගැණීමට ලකුණු ගන්නේ ඇතුල් පතුල්වලින් පමණක්
බව යාඥාගමනාශයකින් ඔප්පුදියයුතුයි. එසේ ඔප්පුදිගන්ට බැරි
වුනිනම් ඥාතිදසින් විසින් දක්නාලද්දේ සිවුරෙන් නොවැසී තුබු
අතුල් පතුල් පමණක් බව සපිරයි රතනපාලට මෙහි අර්ථය වැරදී
ගියබව හැඟෙන්නේ ඒ ස්ථවිරයන්ගේ නොවැසී තුබු හිස මුහුන ඇස්
කන් නාශා නළල දෙකම්මුල් දෙතොල් ආදී අවයවයන් නොවැසී
තිබියදී ඒවායින් ලකුණුගත් බවක් නොකිව්වේ මන්ද යන ප්‍රශ්න
යෙනි ඇතුල්ගම් වදනා භික්ෂූන් විසින් ''ඔක්ඛිත්තචක්ඛු අන්තරඝ
රෙගමිස්සාමිති'' යනුවෙන් යටහෙලනලද ඇස් ඇතිව හෙවත් විය
දඬු පමණ දුර පෙනෙණන ආකාරයෙන් බිම බලාගෙණ ඇතුල්ගම
යායුතුයයි යන ශික්ෂාපදය රතනපාලට නොතේරෙණ බව කදිමට
හැඟේ නුමුත් ඒ ස්ථවිරයන්වහන්සේලා ශෛඛ්‍යාවත් සම්පූර්ණ
කොට ඒ ඥාතිගෘහයන්ට ගිය බැවින් දසින්ට කෙළින් මුහුණවත්
හිසේ අවයවවත් බලා ඇඳින්නගන්ට නොහැකිවූ බව ඉතා එහුඩින් තේ
රුම්ගතයුතුයි බිමබලා ඉන්නාවූ යමෙකුගේ මුහුනබලා ඇඳිනගන්
නට පුළුවන්ද යනවග කාටත් සලකා බලන්ට පුළුවන්වේ ඇරත්
පෙර කිහිකාලේදී තමන්ගේ දසීහු ස්වාමිදරුවන්ගේ මුහුණු කෙළින්
නොබලනබවත් පිඩුපිණිස එන ශ්‍රමණයන්ගේ මුහුණු ඇසින් ඇස
ගපා බැලීම චාරිත්‍රයක් නොවන බවත් රතනපාලලාමෙන් පිඩුපිණි
ස ගොස් පිඩපාතය දෙන්ට එන ස්ත්‍රීන්ගේ මුහුනු ඇසින් ඇස ගපා
බැලීම පුරාණ රහතුන්ගේ චාරිත්‍රයක් නොවන බවත් සලකාගත්
කළ ඒ දසීන්ට නොවැසීතුබු හිස මුහුණ සම්බන්ධ අවයව බලා ඇඳි
නගන්ට නුපුළුවන්වූ බව හා ප්‍රකෘතියෙන් නොවැසී තුබු අත්පා පම
ණක් දූක ඇඳිනගත් බවත් තේරුම්ගතහැකිවේ. රතනපාලට මේ
කිසි විභාගයක් නොතේරී රතනපාල කීදේ සපිරකරගන්නා අදහ
සින් ආගම ධර්මයට විමුඛව දෙසාබාන අභූතවලින් ඇත්තාවූ විපා
කය ''අභූතවාදී නිරයංඋපෙති'' යන්න පමණකි මාගේ ප්‍රශ්නයට

රතනපාල දුන් උත්තරය හාත්පසින්ම ආගම නොදන දුන් අඥාන උත්තරයක් බව මෙයින් ඔප්පුවිය ඉතින් වෙන උත්තරයක් පිළියෙළ කළ මැනවි.

රතනපාල මිත්‍රයා පමණක් නොව ශාසනාවචර සියළු කුලපුත්‍රයන් කෙරෙහි කරුණා පූර්වඞ්ගම සිතින් මෙහෙන් පටන් පාලි අර්ථකථාටීකානගත හකුළුවාගෙණ ඉතා සැකෙවින් සිව්රු හඳනා පොරෝනා ක්‍රමය අඩහුවු විනිශ්චය අගති විරහිතව ලියන බැවින් අත්වැඩ පරවැඩ කැමති සියලුදෙනා විසින්ම පිළිගතයුතුයි. නූගතුන්ට පාලි පාඨ අතරතුර යොදා ලිවීමෙන් ආකූලවිය හැකිබැවින් ඒ ඒ පාඨයන්ගේ භාවය මේ විනිශ්චයට රැගෙණ ඒ ඒ තැන ලකුණුයොද යටහාගයෙහි පාලිපාඨ යොදනු ලැබේ. සර්වඥයන්වහන්සේ සැවැත්නුවර වැඩවසන සමයෙහි සවග මහණහු ඉදිරියෙනුත් පස්සෙනුත් කොන් එල්ලා අඳනාය ඇඳිහෙයින් ඒ නිදනකොටගෙණ කොන් සමකොට අඳන්ය ඇඳීම පිණිස "පිරිමඬුළුකොට හඳිනෙමියි ශික්ෂාව කටයුත්තිය" යන සෙඛියාවේ පළමුවෙනි ශික්ෂාපදය පණවා වදාළේයි † ඊට මතුභාගයෙහි සර්වඥයන්වහන්සේ සැවැත්නුවර දෙව්රම වැඩවසන් සමයෙහි සවග මහණහු ඉදිරියෙනුත් පස්සෙනුත් කොන් එල්ලා සිව්රු පෙරවූහ ඒ නිදනකොටගෙණ 'හාත්පසින් පිරිමඬුළු කොට පොරවන්නෙමියි ශික්ෂාවකට යුතානිය" යි සෙඛියාවේ දෙවෙනි ශික්ෂාපදය පණවතලදි ‡ මේ ශික්ෂාපදවල පැණවූ නිදනයන් පරීක්ෂාකොට සියලු හැඳුම් පෙරවුම් ගැණ පණවනලද්දක්ද? සවග මහණහු අනේකප්‍රකාර ගිහි ඇඳුම් ගිහි පෙරවුම්වල ආකාරයට ඉදිරියෙන් පස්සෙන් කොන් එල්ලා හැඳපෙරවූ බැවින් ඒ වැළැක්වීමට දෙශනාකරණලද්දක්දැයි විමසියයුතුයි සර්වඥවරයෝ නූපන් වස්තුවෙහි ශික්ෂා නොපණවති. එහෙයින් සවග භික්ෂූන් විසින් ඉදිරියෙන් පස්සෙන් කොන්එල්ලා ඇඳුම් පෙරවුම් කළ බැවින් ඒ කොන් එල්ලීම පමණක් වළක්වන්ට මේ ශික්ෂායුගලය පණවා වදාළබව එහුඩින් තේරුම්ගතයුතුයි. සමහරු මේ පරිමඬුළු කිරීම විහාරයට එවා ඇතුළුනවුට වේවා වෙනසක් නැතැයි අටුවාහි කී බැවින් විහාරයේදී පිරිමඬුළුකරණසැටි දක්විමට නිදශීණවශයෙන් කී එකාංශපෙරවීම ඇතුළුගම් විහාර දෙතැනටම සාධාරණයයි රැවටී කියාගත් මිථ්‍යාග්‍රහණය නිසා බොහෝදෙනෙක් මුළාවී සිටිති. "දෙකොන් සමකොට පාරුපනවත පූරන්නහු විසින් පිරිමඬුළුකොට පෙරවියයුතුය. මේ පරිමඬල නිවාසන පරිමඬල පාරුපන ශික්ෂාදෙක අවිශෙෂයෙන්

† පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛාකරණීයා.

‡ පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛාකරණීයා (සෙඛියං)

පනවා වදාරණලද්දහුය. එහෙයින් විහාරයෙහිත් ඇතුළුගමෙහිත් පිරිමඬුළුකොටම හැඳියයුතුයයි × යන විනය අටුවාවචනයෙන් පෙණෙන්නේ පිරිමඬුළුකොට පෙරවියයුත්තේ තනිපට සිවුර පමණකි. දෙපටසිවුර පිරිමඬුළුකරන්ට නියමකළ ශික්ෂාපදයක් නැතැයි සමහරුන්ට වාදකළැකිවේ ඒ වාද නිරාකරණය පිණිස වජිරබුද්ධි ටීකාවේ "උත්තරාසඞ්ගයකෘත්‍යවශයෙන් හෙවත් පිරිමඬුළු කරණ ක්‍රමය තනිපටසිවුරෙන් දක්වීමට කියනලද්දේය" || යි විස්තරකළේය. එමෙන්ම පිරිමඬුළුකිරීම උගන්වනපිණිස නිදර්ශනවශයෙන් දක්වනලද ඒකාංශය අවිශේෂයෙන් ගතයුතුයයි අභිලැබෙනම් පරිමණ්ඩල නිවාසනයට නොදක්වූ සඟළසිවුරහා සඟළසිවුරෙන් කටයුතු පරිමණ්ඩලකරණයද විනයට නොගැළපේ එබැවින් මේ ශෛඛ්‍යයේ 1—2 වෙනි ශික්ෂාපදවලින් හික්මවන්නාවූ කෘත්‍යය කොත් උස් පහත් නොවනසේ ගිනි ඇඳුම් ගිනිපෙරවුම්වලට අසමානකොට සතුරකින් කැපූ පියුමක්සේ වටකොට ගඳනා පොරෝනා විධිවානුයක්බව සලකාගතයුතුයි. විනය අටුවාවෙහි මේ පරිමණ්ඩල ශික්ෂාපදදෙක අවිශේෂයෙන් වදාරණලද්දහුය එහෙයින් විහාරයෙහිත් ඇතුළු ගෙරෙහිත් පිරිමඬුළුකොටම හැඳියයුතුය පෙරවියයුතුයයි කියනලද්දවරවටි මේ පෙරවීම සියළු තැනටම සාධාරණයයි වැටහීම මේ ශික්ෂාපද මර්දනයට හේතුවිය තුමුත් රතනපාලලා කියන ඒකාංශ පරිමණ්ඩල පාරුපනය විහාර ඇතුළුගම් දෙකට සාධාරණයයි කිසි විනය පොතක නා බැවින් මේ ශික්ෂාපද යුගලය පිරිමඬුළුකිරීම සඳහා වදාළ බව සලකාගතයුතුයි විනය විනිශ්චයෙහි "මේ ශික්ෂාපද දෙක අවිශේෂයෙන් කියනලද්දේය එහෙයින් ගෙරෙහිත් වෙහෙරෙහිත් පිරිමඬුළු කටයුතුයයි ×× කීවාමිස ඒකාංශ උභයාංශ විභාගයක් නොකී බැවින්ම මෙහි මුළානොවිය යුතුය පරිමණ්ඩල ශික්ෂායුගලය සියලුතැනට සාධාරණ බවත් සුපටිච්ඡන්න ශික්ෂායුගලය ඇතුළුගමටපමණක්

---

× උභොකණ්ණෙ සමංකත්වා පාරුපනවත්තං පූරෙන්තෙන පරිමණ්ඩලං පාරුපිතබ්බං ඉමානිපි සික්ඛාපදානි අවිසෙසෙන වුත්තානි තස්මා විහාරෙපි අන්තරඝරෙපි පරිමණ්ඩල මෙව නිවාසෙතබ්බං පාරුපිතබ්බංචාති (ස. පා. විනයට්ඨකථා.)

|| විහාරෙපි බුද්ධුපට්ඨානාදිකාලෙ තස්මා පාරුපිතබ්බන්ති උත්තරාසඞ්ගං කිච්චවසෙන වුත්තං (ව. බු. ටීකා)

×× අවිසෙසෙන වුත්තත්තා ඉදං සික්ඛාපදද්වයං.
තථා ඝරෙ විහාරෙවා කාතබ්බං පරිමණ්ඩලං (විනය වි.)

බවත් තේරුම්ගතහොත් මෙහි මුළානොවේ. පාළිභාෂාව තේරුම්ගන්ට පුළුවන්වූනරමින් ආගමේ නියම අදහස් නොහැඟේ. එහෙයින් විනය පාළිය අටුවාටීකාව සමග අවිච්ඡින්න පරම්පරාවෙන් ඉගෙණගතයුතුයි. එසේ ඉගෙණගන්නවානම් මෙබඳු සැහැල්ලු කාරණයක් ගැණ මෙපමණ දුරට මුළානොවේ. පිරිමඬුළුකිරීම ඇතුලුගම්මට හා විහාරයටත් සාධාරණබව හිස එකාංශය සාධාරණයයි යම් විනය පොතකින් පෙන්වියහැකිනම් රතනපාලපක්ෂය වරදින්මිදේ. විනය විනිශ්චයාදියේ ආක්‍රමය හෙවත් 1-2 වන ශික්ෂාපදදෙක අවිශේෂයෙන් වදළ බැවින් ඇතුලුගම් විහාර දෙකෙහිම පිරිමඬුළුකටයුතුයයි කි විස්තරය තේරුම්ගතහොත් පිරිමඬුළු කිරීමට නිදර්ශණකළ එකාංශ පාරුපනය හැම්තැනටම සාධාරණයයි පිළිනොගනිත්මැයි.

රතනපාල පක්ෂය විසින් මුල ශික්ෂාපදවයෙන් පෙරවීම්වන වදරා කෙළවර කළාය ඇතුළුගමටවේවා විහාරයට වේවා මේ මුල් ශික්ෂාපදවලට කිවාට වඩා වෙනසක් භාත්පසින්ම නැතැයි නිතර කියාගණසිටියි මේ ශික්ෂාපද පණවන්නට යෙදුනේ බුදුවී බොහෝකල් ඉක්මගියාට පසුයි බුඩ්ඩවයට පැමිණ කිඹුල්වතට වැඩිය පළමුගමනේ දීම එකාංශව උත්තරාසඟය පොරවා පැව්දිකරන්ටයයි පබ්බජ්ජක්ඛන්ධකයේදී සැරියුත් තෙරුන්ට ආඥකරතුබු බැවින් මේ ස්ථානේදී සිවුරු එකාංශකොට පෙරවීම නැවකත් අනුදන වදරන්ට වස්තුවක් නූපන්නේය මේ ශික්ෂාපදයෙන් එකාංශව පොරවන්ට අනුදන වදළාය යන කීම භාත්පසින් අසත්‍යයක් බව "පරිමඬලං" යන පදයෙන් වැටහේ "පරමඬලං" යන පදයේ අර්ථය භාත්පස වට්ටකරණවාය යන්න මිස එකාංශ උභයාංශකිරීමක් නොවේමය විනය අටුවාවේ "පරිමඬලු මෙවනිවාසෙ තබ්බං පාරුපිතබ්බංචාති" යන පාඨයෙහි අවධාරණයෙහිවූ එවශබ්දයෙන් මේ ශික්ෂාපදයුගලය පිරිමඬුළුකිරීම් මාත්‍රයක් උදෙසාම වදළබව හැඟේ. "නයිමාසඞ්ඝරෙ විහාරෙවාකාතබ්බං පරිමඬලං" යන විනයවිනිශ්චයාදියෙන්වත් මේ ශික්ෂායුගලය පෙරවීමක් සඳහා වදළබව නොහැඟේ. පබ්බජ්ජක්ඛන්ධකයේදී පණවාවදළ එකාංශපෙරවීම ඉදිරියෙන් පස්සෙන් කොන්එල්ලා ඇඳීම් පෙරවීම්කළ සවග මහණුන් වස්තුකොට පැණවූ බැවින්ම මේ ශික්ෂායුගලය පෙරවීම සම්බන්ධ නොවනබව පැහැදිලිව පෙණේ. "උභොකණ්ණෙ සමංකත්වා" යනාදීන් ඉදිරිපස බඩපසඑලෙන කොන්දෙක සමකිරීමෙන් පහළකොන් සමවනබව දක්වීමට උත්තරාසඟයෙන් පිරිමඬුළු කරණ විධියට නිදර්ශණවසයෙන් දක්වූ එකාංශය සියලු තැනට සාධාරණවසයෙන් ගතහොත් උත්තරාසඟයත් එසේම ගතයුතුවේ. ඇරත් සුප්පටිච්ඡන්න කිරීමේදි පිරිමඬුළුකිරීමත් වැසියයුතු අවයවත් ඒ ඒ ශික්ෂාපදයන්ගෙන් ප්‍රකාශවන බැවින් මේ 1-2 ශික්ෂා

යුගලය වැසිය නොවැසියයුතු අවයවයන් ගැණ නොවිදළබව සිතටගතයුතුයි. විහාරයේදී වේවා ඇතුළුගමදී වේවා සියලු තන්හි පිරිමඬුළුකටයුතුයයි වදාළ වචනය නොතේරීමෙන් හෝ අගතියෙන් හෝ නොපිට පෙරලාගණ පිරිමඬුළු කරණ ක්‍රමය ඉගැන්වීමට දක්වූ ඒකාංශය ගැමතැනවම කැපයයි තෝරානැතීම වජ්ජිපුත්‍රයන්ගේ දසවස්තුව තේරීමට කියියේත් දෙවෙනි නොවේ. ඒකාංශය ප්‍රවුජ්‍යාවේදී වදාළ බැවින් සිව්රු කොන් උස් පහත් නොකොට ඇඳීම් පෙරවීම් මාත්‍රයක් පරිමඬල ශික්‍ෂාපදයුගළයේ භාවය බැවි උභය ලෝකාපීකාමී කුලපුත්‍රයන් විසින් සැලකියයුතුයි. සුප්පටිච්ඡන්න ශික්‍ෂායුගලය පිරිමඬුළුකිරිම සඳහා නොව වැසියයුතු අවයවයන් වසනු පිණිස වදාළ ශික්‍ෂාපදවයයි. පරිමඬල ශික්‍ෂායුගලය ඇතුළුගමටත් විහාරයටත් සාධාරණ බැවින් සුප්පටිච්ඡන්න ශික්‍ෂායුගලයටත් පරිමඬල ශික්‍ෂායුගලය සෙදෙන බව සුප්පටිච්ඡන්න ශික්‍ෂාපදවර්ණනාවේදී මෙහින් පරිමඬල ශික්‍ෂාව සාධාරණ බැවින් දණමඬලින් යට සතරඟුලක් පාතට හෙලා කොන් නොඑල්වා හාත්පසින් කතුරකින් කැපූ පියුමක්සේ වටකොට පෙරවියයුතුය † යන වාක්‍යයෙන් මනාසේ හැඟේ. මෙහි පිරිමඬුළුකිරීම සාධාරණයයි කී පමණින් විහාරේදී පිරිමඬුළුකිරීමට නිදශීණකළ දෙකොන් සමකොට උත්තරාසඟයෙන් කරන්ට නියමවූ පරිමඬලය නොගෙණ දණමඬල පටන් යටභාගයෙහි කරණ පිරිමඬුළු කිරීම පමණක් ගතයුතුයි.

සර්‍වඥයන්වහන්සේ ප්‍රථම බොධිය පටන් බොහෝකාලයක් යනතුරු විහාරාදියට ඒකාංශපෙරවීමත් ඇතුළුගමට උභයාංශ පෙරවීමත් පවත්වාගත එත අනාර තමන්වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයාත් සර්‍වඥයන්වහන්සේට අනුව සිව්රු පෙරවීම පවත්වාගණ ආවෝය මෑතභාගයෙහි නිතර සිදුරු සොයා හිතුවක්කාරකම් කරණ සමග භික්‍ෂූහු සර්‍වඥයන්වහන්සේ ඇතුළුවූ ශ්‍රාවකයෝ ඇතුළුගමට උභයාංශකරතත් එබඳු ශික්‍ෂාපදයක් පණවා නැතැයි සිතා ඔවුන් විහාරයේ උන්සැටීම ඒකාංශපෙරවීමෙන් ග්‍රිවයද මිණිබඟන්ද ජනුවද එළියේද මා ඇතුළුගම් වදනට පටන්ගත්තෝය. එබව භික්‍ෂූන් බුදුන්ට දන්වූකල්හි මේ වස්තුවෙහි සුපිළිසන්ව ඇතුළුගමට යායුතුය. සුපිළිසන්ව ඇතුළුගම හිඳියයුත්තෝය යන ‡ මේ සෙඛියාවේ තුන්වන

---

† එතාපිපරිමඬල සිකඛාපදසස සාධාරණත්තාජාණුමඬලතො හෙට්ඨාචතුරඞ්ගුලමත්තං ඔතාරෙත්වා අකොණලම්බෙත්වා පරිමඬලමෙව පාරුපිතබ්බං. (ස. පා. වි.)

‡ සුප්පටිච්ඡන්නො අන්තරඝරෙගමිස්සාමීති සිකඛාකරණීයා-සුප්පටිච්ඡන්නො අන්තරඝරෙනිසීදිස්සාමීති සිකඛාකරණීයා (සෙඛිය)

සතරවන ශික්ෂාපදයූනලය පණවා වදාළේය. මේ සුපිළියන් පෙරවීම කෙබඳු එකක්දැයි විමතී නොවන පිණිස ධම්මසඞ්ගායනා කාලේදී ආයුෂ්මත් මහාකාශ්‍යපාදී පන්සියයක් ක්ෂීණාශ්‍රව මහරහතුන් විසින් ඒ ශික්ෂාපදයන්ගේ අර්ථවර්ණනාව මෙසේ කරණලද්දේයි. තුන් වන ශික්ෂාපදයෙහි සුපිළියන් කිරීමය යනු මනාකොට ශරීරය වැසීම වන්නේය. ඒ මනාකොට වසන්නේ කෙසේදැයි යතහොත් ගණ්ඨිපාශයෙහි අවුනා නුවාකෙළවරින් ග්‍රීවය වසා දෙකොණ සමකොට තෙමත් එකතුකොට පස්සට හකුළා මිණිබඟණ දක්වා වසා ඇතුළතම යන්නෙහම්හි ශික්ෂාවකාවියුක්තිය එසේ නොපොරවා දෙළර හිස්සහලැපැත්තද නොවසා ඇතුළුගම් වදනාහට ඇවැත්වේ × යනුවෙත් අර්ථ කියානිබේ. රතනපාලපක්ෂය මේ පාඨය අර්ථකියන්නේ මේ වසන්නට කීවේ ඒකාංශ පෙරවීමෙන් වැසියයුතු වම් මැණික් කට්ටුවය ග්‍රීවය වසනවාය කියන්නේ පෙර ගලවලයයි කියනලද උගුරැවලයයි කියාය. නුමුත් දක දක ග්‍රීවය හෝ මිණිබඟණ හෝ නොවසන්නාහට ඇවැතැයි වදළ ශික්ෂාපදයට අර්ථකියන්නාවූ කිසි තැනක වසන්නට කීවේ ග්‍රීවයේ අසවල් ප්‍රදෙශය අසවල් මිණිබඟණයයි අර්ථ නොකී බැවිනුත් එකාංශපෙරවීමෙන් කවරකලකවත් ග්‍රීවයේ යම් පෙදෙසක්වත් මිණිබඟණක්වත් වසන්ට නුපුළුවන් හෙයිනුත් එකාංශපෙරවීමට අසවල් අවයව වසන්නටයයි කිසි පොතක නියමනැති හෙයිනුත් ඔවුන්ගේ ඒ තේරුම හාත්පසින්ම ආගමවිරොධ හිතුවක්කාර මතයක් බව ප්‍රත්‍යක්ෂව වැටහේ. එකාංශ පෙරවීමට හැමකල්හිම එකජතුවක් හෙවත් උරහිසක් නොවැසියයුතුයි. නුමුත් මේ අටුවාව සංග්‍රහකොට ලියනලද විනයවිනිශ්චය ටීකාවේ ජතුවක්කියන්නේ අංශකූට දෙකය හෙවත් උරහිස් දෙකය උරය කියන්නේ හෘදය හෙවත් ලැපැත්තය මේ අංශකූටදෙක හා ලැපැත්තද නොවසා කැමතිපරිද්දෙන් සිව්රැ පොරවායන්නාහට ඇවැතැයිකී + බැවින් උභයාංශ පාරුපනයක් ඇති බවත් ඒ පෙරවීමට උරහිස්දෙක වැසුනු කල එක මිණිබඟණක්වත් එළියේ තබන්නට නුපුළුවන්බවත් මනාසේ පෙනේ.

---

× තනිවෙයුප්පිවප්පනහාති සුඬුප්පිවජ්ජෙහා ගණ්ඨිකංපටිමුඤ්චිත්වා අනුවාතනෙනනගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙ සමංකත්වා පටිසංහරිත්වා යාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙගමිස්සාමීති අපො තථා අකත්වා ජත්තුංවා උරංවා විවරිත්වා ගච්ඡන්තස්සදුක්කටං.

(ස. පා. වි)

+ ජත්තුනිපිති උභො අංසකූටානි උරම්පිචාහිහදයම්පි විවරිත්වාති අපටිච්ඡාදෙත්වා යථාකාමනති ඉච්ඡානුරූපං. (වි. විනිච්ඡය_ටී.)

ඒකාංශ පරිමණ්ඩල පාරුපනයත් උභයාංශ පරිමණ්ඩල පාරුපනයත් යන දෙක භාත්පසින්ම එකිනෙකට අසමානවූ දෙයාකාර දෙකක් බව මේ අටුවාපාඨවලින් මනාසේම හැඟේ. ඒකාංශපරිමණ්ඩල පාරුපනයට "පිට්ඨිපසෙසාව උදරපසෙසාව ඔලම්බමානා උභොකොණෙ" යනුවෙන් පිටිපස බඩපස දෙකේ එල්බවන්නාවූ කොන්දෙක ඇතුළිව එැම්ණි ගෙඩිදෙක එක ප්‍රමාණයට එල්වන්නාක්මෙන් එක ප්‍රමාණකොට පෙරවීමෙන් පිරිමඬුළුවෙයි කියාද උභයාංශ පරිමණ්ඩල පාරුපනයට එම කොන්දෙක එකට අල්වා සමකොට ආපසු අකුළා ඒ සිවුරු මැටිය වම්උරහිස පිටදමා පොරවන්නටයයි කියාද ඉතා පැහැදිලිව අටුවාටීකා ප්‍රකරණවල විස්තරාකාර තිබියදී මේ නියමය වෙනස්කර දමන්නට හිතාගෙණ කොපමණ අශුතාර්ථකිවත් පොතපත තිබියදී ඒ අදහස් පිළිගන්නාවූ අය ඉතා විරලයි.

තවද රතනපාල පණ්ඩිත නිතර ප්‍රකාශකරන්නේ පරිමණ්ඩල පාරුපන ශික්ෂාපදයෙන් විහාරේදී බුද්ධුපස්ථානාදියට නියමකළ පෙරවීම මිස වෙන පෙරවීමක් මේ සාසනයෙහි නැත යනුයි. එම් ශික්ෂාපදයාගේ අර්ථ දක්වන අටුවාචාරීන්වහන්සේ මෙහින් පරිමණ්ඩල ශික්ෂාපදය සාධාරණය කියා ඊට අසාධාරණ ක්‍රමයක්වූ දණමඬලින් පහතට සතරඟුලක් සිවුර හෙළා සුපිළිසන්ව පෙරවියයුතුයයි † කී බැවින් ඇතුළුගමට වදනාකල කටයුතු සුපිළිසන් පෙරවීමට සිවුරේ යට භාගයේ කොන් නොඑල්ලා කරණ පිරිමඬුළු කිරීම් මාත්‍රයක් සාධාරණ බවත් අනිකුත් සියලු විධි අසාධාරණ බවත් ප්‍රත්‍යක්ෂව පෙණේ.

මෙසේ සර්වඥයන්වහන්සේ සුපිළිසන්ව ඇතුළුගම යායුතුයයි ශික්ෂාපද පැණවූ පසු පැවිදුවූ සවග භික්ෂූහු සර්වඥයන්වහන්සේ විනාහි සුපිළිසන්ව ඇතුළුගම් යායුතුයයි ශික්ෂාපද පැණවූ පමණමුත් ඇතුළුගම හිඳීමේදී සුපිළිසන්ව හිඳියයුතුයයි ශික්ෂාපදයක් නොපැණවා වදාළේ නොවේදැයි සිදුරුසොයා ඇතුළුගම යාමේදී දෙඋරවසා සුපිළිසන්ව ගොස් හිඳීමේදී විහාරයෙහි මෙන් ඒකාංශව පොරවා හිඳිනට පටන්ගත්තෝය. ඉක්බිති සර්වඥයන්වහන්සේ එම නිදානකොට ගෙණ සුපිළිසන්ව ඇතුළුගම හිඳිම්යි ශික්ෂාව කටයුත්තිය යන සිව්වෙනි සික්ෂාපදය පැණවාවදාළේයි. ඒ ශික්ෂාපදයේ අර්ථ වර්ණනාකරණ ධර්මසඞ්ගාහක මහාස්ථවිරයන් විසින් එහි අර්ථ ලියනලද්දේ මෙසේයි. ගලවළුව පටන් හිසද මිණිබඳන් (මැණික්කට්ටු) පටන් දෙඅතද පිඩුමස් (බත්කෙණ්ඩා) පටන් දෙපාදද යන පච්ස්ථානය එලි

---

† එත්තාපි පරිමණ්ඩල සික්ඛාපදස්ස සාධාරණත්තා ජාණුමණ්ඩලතො හෙට්ඨා චතුරංගුල මත්තං ඔතාරෙත්වා අනොලම්බෙත්වා පරිමණ්ඩලමෙව පාරුපිතබ්බං—(විමති වි. ටී.)

යේ තබා සෙසු සකලශරීරය වසා පොරවාහුන්නේ සුපිළිසන්ව හුන්නේනම්වෙයි. ‡ යනුවෙන් අර්ථදී තිබේ. මේ අටුවාපාඨය රතනපාලලාට කැමති පරිද්දෙන්ම ටීකානුගතවහා ප්‍රකරණ ප්‍රකරණ ටීකාදියටද පුරාතන නියම සාසනපරම්පරාවල අර්ථබිණුමටද විරුඬව බොරුමිශ්‍රකොට තෝරා මුග්ධයන් මුළාකරවති "පාදෙ" යන කර්මකාරක විභක්‍ත්‍යන්ත බහුවචනයට අර්ථ කියන්නාක්මෙන් "හත්ථෙ" යන කර්මකාරක විභක්‍ත්‍යන්ත බහුවචනයටත් අර්ථ කියාගත් කල එකාන්තයෙන්ම එකඅතක් නොවසා ඇතුළුගම හිඳිනට අවසරනැතිබව මනාලෙස් හැඟේ. අසවල් අවයව පස නොවසා සෙසු සියලු ශරීරය වැසූ කල්හි සුපටිච්ඡන්නවෙයි යන මේ අටුවා පාඨයෙන් මිණිබඟන් දෙකින් පාත දෑතත් ගොප්මසින්පාත දෙපයත් ගලවළුයෙන් උඩ ඉසත් හැර ශරීරයේ අතික්තල ඇටක් පමණකුදු ස්ථානයක් නොවසා ඇතුළුගම හිඳීම නොකටයුතුබව නොහැඟෙන මොළයක් ඇත්නම් ඒ මිනිස්මොළයක් නොවේයයි කල්පනාකටයුතුයි. රතනපාලපක්ෂය "හත්ථෙ" කී තැන එකඅතකැයි තෝරණ නුමුත් ඒ න්‍යායෙන් "පාදෙ" කීනැනත් තේරුම්කළහොත් එයින් ලැබෙන අපාර්ථය කිසික්‍රමයකින් පිරිමසාලිය නොහැකි දෝෂයක්වෙයි. මේ පාඨය තේරුම්ගැනීමට තර්කන්‍යාය මීමංශාදී නොයෙක් ශාස්ත්‍ර වුවමනානොවේ. එසේම මෙහි විභක්තිවිපරිණාමාදී ගම්භීරාර්ථයකුත් නැත්තේය. පාලිව්‍යාකරණ මඳක්දුර උගතෙකුට මෙහි මුළාවියයුතු කිසි වචනයකුත් නොමැත්තේය. මේ පාඨය මෙසේ අර්ථකියයුතුයි. "චතුත්ථෙ, සතරවන සික්ඛාපදයෙහි; ගලවාටකතොපට්ඨාය, ගලවළපටන්, (හෙවත් උගුරේ නික්මතිබෙන ගළසර ඇටවටයට භාග්‍යයෙහි පිහිටි වළහා පිටිපස උකුණුවළත් පටන්) සීසං, හිසද; මණිබන්ධතොපට්ඨාය, මිණිබඟන් පටන්; හත්ථෙ, දෙඅතද; පිණ්ඩිකමංසතොපට්ඨාය, පිඩුමස පටන්: පාදෙ, දෙපයද; විවරිත්වා, විවෘතකොට; සෙසං, ඉතුරුසකල ශරීරය: ඡාදෙත්වා, වසා; නිසින්නො, හුන්නේ; සුපටිච්ඡන්නොනාම හොති, සුපිලිසන්ව පෙරවූයේනම්වෙයි" යන මේ අර්ථයට වෙනස්වූ කිසි අර්ථයක් සාරාර්ථදීපනී, වජිරබුද්ධි, විමතිවිනොදනී, ටීකාතුලයේවත් විනිශ්චය, විනයාර්ථ මංජුසාදියකවත් ගැටපදසන්නාදියක

---

‡ චතුත්ථෙගලවාටකතො පට්ඨාය සීසං මණිබන්ධතො පට්ඨාය හත්ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙවිවරිත්වා සෙසං ඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡන්නො නාමහොති—(විනයට්ඨකථා)

විත් ගෘහස්ථයින්ම නොආයේය. මෙහි කියයුතු විශේෂාර්ථ සියල්ලම් සටිකි පොත්වල බාලජනසංමෝහය නොවන පිණිස ඉතා විස්තරව ලියාතිබේ. මේ අටුවාපාඨයෙහි අර්ථ වෙන අනකට අවබෝධ කර ගත්තනම් පොතපතේ නා හිතුවක්කාර අන්‍යනෝමත ක්‍රියාකිරීමෙන් මිස වෙන කිසි ආකාරයකින් නොපිළිවන්වේ බුදුන් රහතුන් ඇතුළුවූ සියළුම ලජ්ජිප්‍රියශීලී භික්ෂූන්වහන්සේලා ඇතුළුගම ගියේ වැඩහුන්නේ කෙසේද කියා මේ ශික්ෂාපදයුගලයෙන්ම අවබෝධ කරණු මිස බුදුන් අසවල්තැන ඒකාංශකරගණ වැඩියාය අසවල් තෙරුන්වහන්සේ අසවල්තැන ඒකාංශව වැඩසිටියාය මහණකරන්ට අනුදුන වදාලේ ඒකාංශයෙන්ය විහාරතුළ තනාතිබෙන පිළිම ඒකාංශයෙන් තිබෙනවාය යනාදි සියලු ප්‍රලාපම නිෂ්ඵලවෙයි. බුදුන්ගේ ශික්ෂාපදයක් තේරුම්ගැණීමට ඒ ශික්ෂාපදයේ පෙළ අටුවා ටීකාදියම එකිනෙකට සමකර බලනවා මිස යම් යම් අයගේ චරිත සෙවීම සාසනකාමී කුලපුත්‍රයන්ගේ චාරිත්‍රයක් නොවේ. මේ තුන්වන සතරවන ශික්ෂාපද යුගලයෙහි සුපිළිසත් කිරීම ඒකාකාරයි. මේ කාලයෙහි ඇතුළුගම් වදනා භික්ෂූන්වහන්සේලා ඇතුළුගම හිඳිනා කල් හිඳ පෙරවීම වෙනස්නොකොට යම්සේ හිඳිද එමෙන්ම මෙම ශික්ෂාපදයුගලයෙහි සුපිළිසත් කිරීම එකක් බව පෙණේ. එසේදවුවත් ඇතුළුගම බණ පිරිත් කිමාදී ශ්‍රමණයන්ට අයිති කටයුත්තක් පිණිස එක්රැයක් හෝ එක් දවලක් හෝ දවස්කීපයක් හෝ හිඳිනට වීනම් එසේ හිඳිනා භික්ෂුව විසින් කයවිවෘතනොකොට විහාරයෙහි හිඳිනාකල් මෙන් විසියයුතුයි. එසේ වසන්නාහට ඇවැත් නැත්තේයි. එත කුදුවුවත් වාසයකරන්නාවූ අදහසක් නැතුව හුදෙක් බණ පිරිත් කිමාදියක් පිණිස ඇතුළුගම බොහෝවේලාවක් සිටියත් සියළු ඇතුළුගම්වත් පුරාහිඳියයුතුයි. *

---

* එත්ථපනවාසූපගතස්ස අනාපත්ති (විනයට්ඨකථා)

වාසූපගතස්සාති වාසත්ථාය උපගතස්ස රත්තිභාගෙවා දිවසභාගෙවා කායංවිවරිත්වා නිසීදතො අනාපත්ති (විනයටීකා)

දෙසෙසාවාසූපගස්සාති එත්ථකායං විවරිත්වානිසීදතොපි සෙසො වාසූපගො නාමරත්තිවාසත්ථාය උපගතො එතෙනවාසත්ථාය අන්තරඝරං උපගතෙනාපි සුප්පටිච්ඡන්නෙනෙව උපගන්තබ්බන්ති දීපිතං හොති (විනයත්ථමඤ්ජූසා)

වාසත්ථාය උපගතස්සාතිහි වුත්තත්තාවාසාධිප්පායං විනා ධම්ම දෙසන පරිත්තභණනාදි අත්ථායඝරංසුචිරම්පි නිසීදන්තෙන සබ්බං අන්තරඝරවත්තං පූරෙන්තෙනෙව නිසීදිතබ්බං (විනයටීකා)

රත්තපාල පක්ෂය බුදුන් රජතුන් කිසිකලෙක කිසිතැනකට දෙළුරවසා උභයාංශකොට වැඩිසේ නැත කියා අඥතයන් මුලාකර වනත් මේ පරිමඩල සුපටිච්ඡන්න ශික්ෂාපද සතරපෙල අටුවාටිකාවල ආයථා භූතාත්ථය පිඩුකොට අතින් මිටින් බොරු නොදමා තේරුම් ගන්කල දෙළුරවසාමුත් එකළුරයක් වසා ඒ උත්තමයන්වහන්සේලා කිසිකලෙක ඇතුළුගම් නොගියබව ලදරුවන්ට පවා මනාසේ හැඟේ මැදුම්සඟියේ බ්‍රහ්මායුසූත්‍ර අටුවාවේදී යමෙක් සිවුර එකාංශකොට තනය විවෘතකොට යේද ඔහුගේ ඒ පෙරවීම ඉතා යටබඟා පෙරවීම නම්වේයි ශාස්තෘවූ බුදුරජතෙමේ ඒ විකාර පෙරවුම් නොකරණසේ කැඟී දුක්වූහ † තවද තමාගේ ගෘහය. භික්ෂූන්ට පවරාදුන්පසු ඒ ගෘහයට පැමිණි භික්ෂූන් විසින් සැපසේ හින්දයුතුය හොවියයුතුයයි කිබැවින් ගැටවටුවනො මුද සැපසේ හිඳීනට හෝ හෝනට නොහැකිබැවින් ගැටවටුව මිදීමෙහි දොස් නැතැයි සමහරු කියති. තවද වාසූපගතයාට ඇවැත් නැතැයි වදාළ බැවින් දන්වැළඳීමාදී කටයුතු පැමිණි කල්හි ගැටවටුව මිදීමෙහි වරද නැතැයි සමහරු කියති එසේ වේනම් සුපටිච්ඡන්න ශික්ෂාපදය නිෂ්ප්‍රයොජනවන්නේය. එහෙයින් අඤ්ඤාතක විඤ්ඤත්ති සුපටිච්ඡන්න ශික්ෂාපදවායට අවිරුද්ධවන නියායෙන් මෙහි විභාග දතයුතුයයි කිසේය ‡ මේ පාඨයෙහි සුපිළියන්වූ ගැටවටුව කරගණ සැපසේ හිඳිනටවත් හෝනටවත් නොහැකිබවද දන්වැළඳීම ආදී කටයුතු සැපසේ නොකළහැකි බවද පෙණේ. හැමතැනබව එකාංශයනම් ඇතුළුගම්හි කරණ එකාංශයේ ඇති අවහිරකම් මොනවාද? විහාරයට කරණ එකාංශයේ ඇති පහසුකම් මොනවාද? එකාංශපෙරවීමට ගැටපාස ඇවිනීමක් පොතපතේ

---

† යො එකංසංකත්වා එනං විවරිත්වා යාතිතස්ස පි අවෙඩාක්කඩ්ඪං සන්ථතං සබ්බං න කරොති (ප්‍රපචසූදනි)

‡ තෙපි අඤ්ඤාතක විඤ්ඤත්ති සික්ඛාපදෙ අනාපත්ති–පෙ–ඉමස්මිං පාඨෙයථා සුඛං නිසීදිතබ්බං නිපජ්ජිතබ්බන්ති වුත්තත්තාගණ්ඨිකං අපටි මුච්ත්වා යථා සුඛං නිසීදනං නිපජ්ජනං වා නත්ථි–පෙ–පවාරිත ගෙහෙ යථා සුඛං නිසීදිතබ්බං නිපජ්ජිතබ්බන්ති වුත්තවචන සාමඤ්ඤත ගණ්ඨිකං මොචෙ තබ්බොති ගණ්ඨන්තස්ස—පෙ—වාසූපගතස්ස අනාපත්තිතිවුත්තත්තා භත්තකිච්චගිලාන පච්චය සමාපන්නො වා සූපගතො හිවදන්ති තථා භවෙය්‍ය සුපටිච්ඡන්න සික්ඛාපදං නිප්පයොජනං භවෙය්‍යාති ඉදම්පින යුජ්ජති තස්මා අඤ්ඤාතක විඤ්ඤත්ති සුපටිච්ඡන්න සික්ඛාපදානං අවිරුජ්ඣනනියාමෙන විනිච්ඡයොමෙ දිතබ්බො (විනයටීකා)

තිබේද? පන්සලේදී දත්මලදන්නේ ඒකාංශනොකොට ඇඳගනද? යනාදීය කල්පනාකටයුතු නොවේද? ඇරත් දෙඋර වසා පොරවා ගැටපාස අවුනා සැතපීම් දත්මැලදීම් ආදි කටයුතු කරන්ට දුෂ්කර වා මිස ඒකාංශ පෙරවීමෙන් නිතර හිඳීමට නියම බැවින් ඒ පෙරවීමෙන් සයනයට හෝ දත්වැලදීමට හෝ යමී අමාරුවක් අසීරුවක් තිබේදැයි කල්පනාකටයුතුයි. තවද විනය පාලියෙහි කාය විවෘත කොට ඇතුල්ගම නොහිඳියයුතුය යන දෙසනා පදයට අටුවා ලියා තිබෙන්නේ කාය විවෘතකිරීමයයි කියන්නේ ජතුව (උරහිස) ත් ලැපැත්තත් විවෘතකොට ඇතුළුගම නොහිඳියයුතු බව සඳහාය කියාය * එම අටුවාව තෝරණ ටීකාචාර්යයන්වහන්සේ ඒ වාක්‍යයේ අර්ථ කියාතිබෙන්නේ කාය විවෘතකොට හිඳිනා බවය කියන්නේ විහාරයෙහි මෙන් ඒකාංසපෙරවීමෙන් ගිහිගෙයි හිඳිනා භික්ෂුව සඳ හායයි කීයාය † කාය විවෘතකොට ඇතුළුගම හිඳීමයයි කියන්නේ විහාරයේදී කරණ ඒකාංසපෙරවීමය ඒ පෙරවීමෙන් ඇතුළුගම නො යායුතුය නොහිඳියයුතුය යන අර්ථය දහවල් සූර්යයාමෙන් මෙපමණ පැහැදිලිව තිබියදී ඒ වසන්නට කීවේ ඒකාංශයෙන් වැසියයුතුවම් උරහිසය යනාදී නොගැලපෙන හිස් ප්‍රලාප දෙඩවීමෙන් කොපමණ දෙනෙක් මුළාවට නොපැමිණෙද්ද? ජතුවය ලැපැත්තය යන සාමාන්‍ය වචනයෙන් හා ටීකාකාරමතයෙනුත් විහාරේදී ඒකාංශ පාරුපනයෙන් නොවැසෙන දකුණු දසරුව හා ලැපැත්තේ දකුණුභාගයත් වසන්ට අනුදැන වදාළබව තීයුණු නුවණ නැත්තන්ට පවා මනාසේ නොවැටහේද? වැඩිදුර කරුණු පරීක්ෂානොකොට මේ අටුවාචාරීන්ගේ වචනයේ තේරුම විහාරේදී කරණ ඒකාංසපෙරවීමෙන් නොවැසෙන දසරුව හා ලැපැත්තේ ප්‍රදේශයත් බව සලකාගත්කල උභයාංශ පාරුපනයෙන් මිස අනිත් ක්‍රමයකින් ඒ ස්ථාන වසන්ට නොහැකිබව නොහැගේද? උභයාංශ යන වචනයවත් පොතපතේ නාබැවින් එබඳු පෙරවීමක් අංගමේ නැතැයි කියත්නම් ඒ අප්‍රිය වචනය අපි අහක්කරගන්නෙමු තුන්වන සිව්වන ශික්ෂාපදවලයෙන් වදාළ පරිච්ඡෙද ප්‍රධාන අර්ථය විවෘතකොට මුළු ශරීරය වසා පොරවා යාම හිඳීම සුපිළියන් පෙරවීමයයි මෙතැන්පටන් ව්‍යවහාරයට ගනිමු.

රතනපාල පක්ෂය නිරන්තරයෙන්ම උභයාංශය වසා පෙරවීමක් තබා ඒ වචනයවත් විනයපොතක නැත්තේයයි ගර්ජනාකරයි. නුමුත් "න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛාකරණීයා"

---

* කායංවිවරිත්වාති ජත්තුම්පි උරම්පි විවරිත්වා (වි. අඨකථා)

† කායංවිවරිත්වා නිසීදතොති විහාරෙවිය එකංස පාරුපනං සකා ශවුතනං (වින.ටීකා)

යනාදී ශික්ෂාපදයුගලයේ අර්ථ දක්වන අටුවාචාරීන්වහන්සේ විසින්
උඩට නගනලද සිවුරෙන් යුක්තව ඇතුළුගම නොයායුතුය නොහි
ඳියයුතුය ඒ උඩට නැගීම එක්පැත්තකින් හෝ දෙපැත්තෙන්ම හෝ
උඩට නැගීමයයි අටුවාවේ තෝරාතිබේ. එබඳු පෙරවීමෙන් ඇතුල්
ඉන්ද්‍රඛීලයේ පටන් නොයායුතු බව සඳහන්කර තිබේ. ‡ මේ අටුවා
වේ "එකතො වා උභතො වා" යන පදයට අර්ථකියන ටීකාචාර්‍ය්‍ය
වරයෝ එක්පාර්ශ්වයකිනැයි කිවේ එක් උරහිසකින් උඩට සිවුර නැගී
මය දෙපාර්ශ්වයෙනැයි කිවේ උරහිස් දෙකින්ම උඩට සිවුර නැගීමය
ඉන්ද්‍රඛීලයෙන් ඇතුලතයයි කිවේ ගම්දොර ඉන්ද්‍රඛීලයේ පටන්යයි
තෝරා තිබේ ඒ ඇතුල්ගෙරෙහි එක්අංශයකින් හෝ දෙඅංශයෙන්
ම හෝ සිවුර උඩට නගාගෙණ යන්ටවත් හිඳිනටවත් නොවටනේයයි
වැඩිදුරටත් තේරුම්කරතිබේ. × මේ තහනම්කළාවූ සිවුර උඩට
නැගීම මේකාලයෙහි දෙවුර වසන සමහර භික්ෂූන්ගේ දක්නාලැබේ.
පුරාතන මහා ස්ථවිරයන්වහන්සේලා අතර ඇතම්විට වැඩිපුර ගම්
ගෙවතු නැති මාර්ගාදියෙහි යනකල දෙඋරවසා පෙරවූ සිවුරේ එක්
අංශයක් උඩට නගා කරඋඩ දමාගෙණ සුලං වදින පිණිස ගමන්කර
ණ සිරිතක් තුබුනේය. සමහරු දෙපැත්තෙන්ම එසේ කරගෙණ
යෙති-මෙසේ කිරීමෙන් අඳනය සහ පටියද ශරීරයද පෙනේ-එබැ
වින් ඇතුල්ගම ඉන්ද්‍රඛීලයේ පටන් දෙඅංශයෙන්ම හෝ එක් අංශය
කින් හෝ එසේ සිවුර උඩටනගාගෙන නොයායුතුබව මේ ශික්ෂාපද
යේ අර්ථයි. හිඳීමත් එසේමයි-ඇතුළුගම් යාමේදී සහ හිඳීමේදීත්
එකඅංශයක් වසාම පොරවත් නම් එකඅංශයකින් සිවුර උඩටනැගී
මමුත් දෙඅංශයෙන් නැගීම කරන්නේ කෙසේද? දෙයංශය යන වච
නයකුත් ආගමේ නැතැයි බොරු දෙඩන රතනපාල මින්මතු මෙහි
දක්වන පාඨවලින් දෙයංශය ප්‍රකාශවන වචනත් දෙයංශය වැසීමක්
ඇතිබවත් හෙම්හිට පාඩම්කරගතයුතුයි.

---

‡ නවමෙ උක්ඛිත්තකායානි උක්ඛෙපෙන ඉත්ථම්භූතලක්ඛණෙ කර
ණවචනං එකතො වා උභතො වා උක්ඛිත්තචීවරො හුත්වාති අන්තො
අන්තො ඉන්ද්‍රඛීලතොපට්ඨාය එවං න ගන්තබ්බං. (වි. අට්ඨකථා)

× අන්තරඝරෙ එකංසතො වා උභයංසතො වා චීවරං උක්ඛිපිත්වා
ගන්තුං නිසීදතුම්ව න වට්ටති.

එකතොපිති එකඅංසකූටතො වා ඉන්ද්‍රඛීලතො අන්තොති ගා
මවාරෙ ඉන්ද්‍රඛීලතොපට්ඨාය (වි. ටී.)

තවද සියම්සමාගමේ ගල්ගිරියාවේ නායකස්ථවිරයන්ගේ කාලේ පටන්ම පිඩපාතයට පමණක් දෙළරමැසිමත් සෙසුප්‍රසථාවල ඇතුළු ගමට එකාරමැසීවත් පුරුදුකරන්ට පටන්ගත් බැවින් උන්වහන් සේගේ ඉතා මනොහර ආගමානුකූල කනිකාවතේ ඇතුළුගමට වි කාලේදීත් දෙවුරවසන්ට නියමකරගිබෙනබව මනාසේහැගේ. එබැවින් සියම්නිකායේ ප්‍රගිපත්ති පිරිහෙන්නට පටන්ගත්තේ මිට අවුරුදු 100 ක පමණ කාලේපටන් බව හැගේ. අඹියක් පිරිහිතුවූ ශ්‍රමණවේශය රතනපාලගේ උගත්කමේ ප්‍රතිඵලයක්මෙන් හාත්පසින්ම නැනිකර පිඩපාත ගමනත් පැන්නක් හෙළුවෙන් කරවන්ට තැත්කළ නුමුන් අපේ අවවාදඅසන්නෝ ඒ මිථ්‍යාමතය පිළිනොගනිති. යම් භික්ෂුවක්හුගේ ශිලය නිර්මලනම් ඔහුගේ ප්‍රව්‍රජ්‍යාවත් සඵලවෙයි. ඔහු ඇඳිනගැනීමට ඇගි බාහිරනිමිත්තයනම් ඒ භික්ෂූනුගේ පාසිවුරුදුරීම දුටුවන්ට ප්‍රසාදඵලවන්නාවූ යහපත්ලීලාවක් උසුලනබවයි. * යමෙකුගේ සිවුරුපෙරවීමපවා දුටුවන්නොපහදවනාකාරයෙන් සමහර අඟප්‍රත්‍යඟ එලියේදමා ශිෂ්ටාචාර මනුෂ්‍යයන් තරමටවත් නොසකස්නම් එපමණින්ම ඔහු දුස්සීලයෙක්බවත් ඔහුගේ පැවිද්ද නිෂ්ප්‍රයෝජනබවත් මනාසේහැගේ.

පසුනිය තවමාසයකපටන් වාදකල රතනපාල අනවමදර්ශී විදර්ශී දිඝීදර්ශී යනාදි වාදභටයෝ සම්බන්ධවූ බැවින් මේවර "සුදර්ශී" නම් වාදභටයා ඉදිරියටඇවින් පෙණිසිටියි යටකී මිත්‍රයන්ට වචන මාත්‍රයකිනුත් ජයක්නොලැබ සම්බන්ධවූ බැවින් මේ තැනැත්තා ඉන්ව ඩිජයක්ලබායයි නොසිතුවමැනවි සුදර්ශී ලියන්ටපටන්ගෙනගිබෙන්නේත් රතනපාලාදීන් විසින් ලියනලද ඒවාම අගමුල මාරුකිරීමෙනි. ඉසනුබුනුතැනට පයත් පයතුබුනුතැනට ඉසත්දමදමා නොපමණදුගළුවත් ඒ දගලනනරමට යුෂ්මතුන්ලාගේ අමය කතායාම රටමුළුල්ලේ ප්‍රකටවන පමණමුත් නොසහක්වත් වාසියක් වේයයි නොසිතුවමැනවි. රුහැණින්බැඳි ගොපොක් ඒ රුහැණ ඇදිනඇදිනසේ ගැටනදවි අමාරුවටපැමිණෙන්නාක්මෙන් මේවාදය ඔප්පුකරන්ටගිනාගන දිඝීයදිගට ලියුනරමට එකාංශපාරුපනයකුත් ඇතුළුගමට ඇද්දෙනෝයි සැකගිතන අයට එබදුලේස මාත්‍ර

* නස්ස පාසාදිකංහොති
පත්තචීවර ධාරණං
පබ්බජ්ජාසඵලාතස්ස
යස්සසීලං සුනිම්මලං--(වි.ම)

යයුත් නැතිබව සම්රචිශයෙන් ඔප්පුවන පමණමුත් අන්කිසිප්‍රයො ජනයක් නොමැතිසි. එබදු සැක ඇතිඅය දහස්ගණනක් නිසැකය. වපත්දුබව මෙම්පත්‍රයෙන් පලවුනුබවවනකසි. දුන්සුදර්ශිගේලිපුම් වල ඇත්තාවූ කෛරාටික චෝදිඅදහස් සියල්ලම හස්තාමලකයක් මෙන් පෙන්වාදෙනුලැබේ මොහුගේකියමන මෙසේයි. "සුපටිච්ඡන්නාශික්ෂාවෙහි අනාපත්තිවාරයෙහි "අඩානමග්ග පටිපන්නස්ස අනාපත්ති' යන්නක් නැතිබැවින් මේ නියමය කොතනගිබේදැයි" යනාදීන් අඩානමාගීයෙහි දෙළරවන් එකළරවන් වැසීවට අවැන් නැතැයි යන මගේ උත්තරයට දෙස්නාගාතිබේ. මෙයින් මේ පුද්ගලයාගේ ආගමද්‍රෝනිවේ රහ ඉතා කොපින්පෙන්වාදෙමු. සියළු ශික්ෂාපදයන්ගේ අනාපත්තිවාරයන් දක්වන්නේ ව්‍යතික්‍රමනය නොකටයුතුදේ සඳහාය මේ ශික්ෂාපදයෙහි අනාපත්තිවාරය දක්වන්නේත් දෙළරවැසියයුතුතන්හිම නොවැසීම සඳහාසි. අඩානමාගීය ඇතුළුගම්වනට ඇතුලත්නොවන බැවින් අඩානමාගීය උධරණයනොකාළේයි. කොටින්ම සුපටිච්ඡන්න ශික්ෂාපදයෙන් සුපිළිසන්කටයුතුතන්හි ගිලනුන්ආදීන්ට සුපිළිසන්නොකළාට ඇවැත්නැත්බව දැනගතයුතුසි. අනාපත්තිවාරයෙහි ආරණ්‍යය විහාරය විහාරූපචාරය වැසිකිළිය යනාදිතැන් උධරණයකළාතම් අඩානමාගීයත් උධරණයකටයුතුවේ. මෙවමණ ලක්ෂණාරණයක් නොපෙණන අප මිත්‍රයා සුදර්ශි යන නම පටබැඳගැනිම අගහරුගේ "මහං"නාමනාසවානසි දෙවනුව අවුල්විගිබෙනවායකියන්නේ "මහාකාශ්‍යපාදි රහතන්වහන්සේලා කුසිනාරානුවරට ඇතුල්වෙනවා සමග දෙළරවසා ගැටවවුගන්වා ඇතුළුගම්වනපුරආවුත් නුවරමැදසන්ථාගාරය ප්‍රවේශගත චිනකයලගදී ඒකාංශසර ණප්‍රාහා සමග ඒදුඩම ගමක්හෝ වනාගඬනායක්හෝ නොවනහෙයින් දෙයංශයවැසීම ඇතුළුගමට තහනම් නම් නුවරමැද්දී එක ශකලම්ට ඒ වනබිදීයයුතුය. එය නොබිඳෙනවානම් දෙඅංශයවැසීම ඇතුළුගම්වනක් නොවීයයුතුය" යනාදිවශයෙනි මේවා කිසිඅවිලක් නොවනපරිද්දෙන් අටුවාටීකාචායභීවරයන් විසින් විස්තරකරඇතත් සුදර්ශිලාගේ හිත්වල ඇතිඅවුල් නිසා තිරවුල් ආරගත්ව දුස්කරවනිබේ සන්ථාගාරසාලාවේ සම්යුශරීරය තැන්පත්කරතුබූ විතානය සම්ඳුයන්වහන්සේට අන්තිමපූජව යරණපිණ්ඩ පිළිපාළකළාවූ මහාචෛත්‍යස්ථානයයි. ඒචෛත්‍යස්ථානයෙහි බුද්ධුපස්ථානකරණ ශ්‍රාවකයන්ට එකාංශපෙරවීම කටයුතුබවින් එහි රාජ රාජාමාත්‍යාදි මහපිරිස් රැස්වසිටියත් භික්ෂා ගවෂණාමි දෙගනාදි කාලයක් නොවන බැවින් එහි ඇවැත්නැතැයි.

යනාදී කාරණයන් දසපිරිමරක් පමණ ලියා ඇති. ඒ පසුගියවර්වාට
උත්තර නොදී තමපක්ෂය රකිනා පිණිස හැටන හැටනත් ලියුම්දීම
ලියමින් කාලය ගතකරන්නේ මන්ද? මේ සන්ථාගාරය එදවසේදී
චෛත්‍යයක් නොවේනම් දැළියනොඩගමේ පිරිවෙ විද්‍යාලංකාරපිරි
වෙණත් ගාමසංඛ්‍යාවට යන්නාමිස විහාරසංඛ්‍යාවට නොයේ. මිල
ගට "බුදුන්ලඟදී ඇතුළුගම්වන නිඃක්ෂපකටයුතුය කියනවානම්
එහිදී මේ පෙරවුම්වන හා සමග වෙ සියල්ලම නිඃක්ෂපකටයුතුයි එ
තකොට සුප්‍රතිච්ඡන්නායද ඉන්ද්‍රියසංවරය ?කිහ ර උඩබල, සිවුරත්
ඔසවාගන මනන්සිනාඇනිව උස්වූ හඬඇතිව කැවිනවනා අතවන
වනා හිස වනවනා උකුළෙලයි අහගසාගන ගමන නිසිදනාකරණ
දදුම විහණකම්ක්නිබන්නා" යනාදීන් කියාතිබෙනහරියෙන් පුද්
ගලයාගේ අමණ පමණ හොඳින්මතෝරුම්ගියා ඉන්ද්‍රියසංවරය පටන්
කියනලද සෙඛියා ශික්ෂාපද විහාරයේදී කඩකොට සිටිම නිරාපත්ති
කයයිකියාපුතැනක් යුෂ්මතුන්ට මේආගමෙන්පෙන්වියහැකිද? ඉන්ද්‍රි
යසංවරයහා කායවාක් සංයම දෙකන් මෙමිශාසනයෙනි සැදූහැයෙන්
පැවිදිවූ සියළුදෙනාම සඞ්ඛන්පිකටෂයෙන් රක්නාගුඃවති. මිනිසුන්
රටවා ඉනබඩවැඩිමට පැවිද්වූ සමහරු මිනිසුන් ඇතිතැන්වලදී පම
ණක් හොර උගුඩුවන්නෙන් බොරුවට නැති ගුණඅහවති එබැ
වින් සුදර්ශිලාවියන් මින්මතු සුප්‍රතිච්ඡන්න ශික්ෂාව සප්‍රදෙශ ශික්ෂා
වක් බඃත් ඉන්ද්‍රියසසංවරද අනියුත් ශික්ෂාවෝ නිෂ්ප්‍රදෙශ ශික්ෂාබ
වත් දූන ආගම ලොවවලට ගන්වාදියයුතුයි. මිලඟට "බුඩගෞරවය
පිණිස තුයි ගෞරුනුවරවැදදී එකාංශකලාහුය යනාන සැබැවක්නම්
එඃගසින් අගරු සම්මිනවූ බුදුන්ඉදිරියේ නොකටයුතු උභයාංශසව
සාගන ජීවමාන බුදුන් සමග ඇතුළුගමිහි ගමනාගමනය කළාහුය.
යන්න බොරුවක්වේ" යනුමෙන් කදිම තර්කයක් පෙන්වාතිඃබ.
ඉන්දියාවේ පුරාතන සහ දූපාටන් රජේක්ද්‍රවූකල ඇත්අස් රථවාහ
නවල යනඅය බිමවබස රජදන්නාගෙනත් දණින්ගිද ගෞරවකරති
නුමුත් ඔවුන්ම ගම්පිටික රජුනා සමග යන්ට ගමනක්වූනිනම් ඔවු
නුත් රජුගෙන්ම වාහනවලින් රජුපස්සෙස්යෙනි. එමෙන්ම රහතුන්
වහන්සේලා බුදුන්දක ප්‍රනස්සෙනතැනිව ගෞරවකරනත් විශාලා
මහනුවර කූටාගාරසාලාව අනේපිඩු මහසිටු වාසල ආදි තැන්වල බු
දුන්හා සමග උසසුන්පලවැඩිහිඳ දන්පිළිගත්බැව් ආදිය සියගණන්
තැන්වලින් පෙණෙන්නාක්මෙන්ම බුද්ධුපස්ථානය සඳහා එනතැ
නැත්නා දෙඅංශය පොරවා ඒනම් බුඩඅගෞරවයවන නුමුත් බුදුන්
හා සමග පිඩුපිණිස ඇතුළුගම්වදනා භික්ෂූන්ගේ දෙඅංශයවැසීම බුඩ
වචනය කඩනොකරණ බැවින් බුඩගෞරවයමුත් අගෞරවයක් නො
වේ. ඉනපා සොහොමවෙතත් දූන් දූන් අපමිත්‍රයාලාත් බුඩවචනය
දූන දූන කඩකරණබැවින් අපමිත්‍රයාලා බුඩගෞරවය කඩකරත්
නොවෙති. ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයන්ට ශික්ෂාපදය තේරුම්ගැනීමට
මෙපණක් සෑහේයයි හැඟෙන බැවින් මෙයින් වාදය සමාප්තකරමි.

ශුභමස්තු

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු